# වාර්ෂික වාර්තාව

## 2012

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

ප්‍රධාන කාර්යාලය

අංක 165, කින්සි පාර, කොළඹ 8.

**(94) 011 2694925, 2685980, 2685981, 2685339**

විද්‍යුත් තැපෑල : sechrc@sltnet.lk

වෙබ් අඩවිය : www.hrcsl.lk

**පටුන**
**සභාපතිතුමාගේ පණිවුඩය**
**කොමිෂන් සභාවේ සංයුතිය**

**පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම**

**දෙවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අංශ**


2.1 පරීක්ෂණ හා විමර්ශන අංශය 7
2.1.1 පුද්ගලික පැමිණිලි 7
2.1.2 පිරික්සුම් සඳහා යාමේ යාන්ත්‍රණය 9
2.1.2.1 මහර බන්ධනාගාරය වෙත සිදු කරන ලද විශේෂ සංචාරය 10
2.1.2.2 වැලිකඩ බන්ධනාගාරය වෙත සිදු කරන ලද විශේෂ සංචාරය 11
2.1.2.3. දිවිතුරාවත්ත අක්කර 20, පොල්ගේන වෙත සිදු කරන ලද විශේෂ සංචාරය 11
2.1.2.4. කාත්තාන්කුඩි වෙත සිදු කරන ලද විශේෂ සංචාරය 11
2.1.3 රැඳවුම් නියෝග ලියාපදිංචි කිරීම 11
2.1.4 වැදගත් සිද්ධි කිහිපයක් 11
2.1.5 අවසන් නිගමනය 13

2.2 අධීක්ෂණ හා සමාලෝචන අංශය 13
2.2.1. වරප්‍රසාද නොලත් අනාථ නිවාසගත ළමුන් වෙනුවෙන් පාසල් ප්‍රවේශයන් සඳහා සම අවස්ථා ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා 13
2.2.2. භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම 13
2.2.3. 2008 වසරේදී නිකුත් කරන ලද UPR නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම 14
2.2.4. බන්ධනාගාර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සමග වූ විශේෂ උපදෙස් සාකච්ඡාව 14
2.2.5. සංක්‍රමණික ගැටළු පිළිබඳව නව කේන්ද්‍රස්ථානයක් පිහිටුවයි 15
2.2.6. ජෝර්දාන රාජ්‍යයේ අමාන් නගරයේ පිහිටි ලංකා තානාපති කාර්යාලයේ යළි පැමිණීමට පිළිසරණක් නොමැතිව රැඳී සිටින ගෘහ සේවකයින්ට සැලකීම පිළිබඳව සැලකිලිමත් වීම 16
2.2.7. විදේශ ජාතිකයනගේ රැඳවුම් මධ්‍යස්ථානය, මිරිහාන යන නාමය යටතේ මිරිහාන විදේශික රැඳවුම් නිවාසය යළි විවෘත කිරීම 16
2.2.8 අවසන් නිගමනය 16

2.3 අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය 17
2.3.1 පොලිස් නිලධාරීන් සඳහා වන පුහුණුකරුවන් පුහුණු කරවීමේ (TOT) වැඩසටහන 17
2.3.2 ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම 17
2.3.3 වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික උපදෙස් සාකච්ඡාව 17
2.3.4 ආගම හා මානව හිමිකම් 18
2.3.5 විවිධ නොහැකියාවන් සහිත පුද්ගලයන් සඳහා අයිතිවාසිකම් ලබා ගැනීම පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව 19
2.3.6 විමර්ශනය පිළිබඳ APF පුහුණු අත්පොත 19
2.3.7 අවසන් නිගමනය 20

2.4 පරිපාලන හා මුල්‍ය අංශය 20
2.4.1 පරිපාලන අංශය 20
2.4.2 මුල්‍ය අංශය 21

**තුන්වැනි පරිච්ඡේදය : ප්‍රාදේශීය කාර්යාල**


| | | |
|---|---|---|
| 3.1 | අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | 22 |
| 3.2 | අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | 23 |
| 3.3 | බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය | 24 |
| 3.4 | මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | 25 |
| 3.5 | යාපනය ප්‍රාදේශීය කාර්යාලය | 26 |
| 3.6 | කල්මුනෙයි ප්‍රාදේශීය කාර්යාලය | 27 |
| 3.7 | මහනුවර ප්‍රාදේශීය කාර්යාලය | 28 |
| 3.8 | මාතර ප්‍රාදේශීය කාර්යාලයග | 29 |
| 3.9 | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය | 30 |
| 3.10 | වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය | 30 |
| 3.11 | සංචාරක / උප කාර්යාල | 31 |
| 3.11.1 | සංචාරක කාර්යාලය - කිලිනොච්චිය | 32 |
| 3.11.2 | සංචාරක කාර්යාලය - පුත්තලම | 32 |
| 3.11.3 | උප කාර්යාලය - නුවරඑළිය | 32 |


**හතරවැනි පරිච්ඡේදය - විශේෂ වාර්තා**


| | | |
|---|---|---|
| 4.1 | පරීක්ෂණ හා විමර්ශන අංශය | 34 |
| 4.1.1 | පරිසර සිද්ධි වාර්තාව | 34 |
| 4.1.2. | කාත්තන්කුඩි සිද්ධිය පිළිබඳ විශේෂ මැදිහත්වීම් | 36 |
| 4.2 | අධීක්ෂණ හා සමාලෝචන අංශය | |
| | බන්ධනාගාර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සමග පවත්වන ලද විශේෂ උපදෙස් සාකච්ඡාව පිළිබඳ වාර්තාව | 38 |


**පස්වැනි පරිච්ඡේදය : වෙනත් ජයග්‍රහණයන් කිහිපයක්**


| | | |
|---|---|---|
| 5.1 | ක්‍රියාකාරකම් කිහිපයක් කෙටියෙන් | |
| 5.1.1 | දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේදී මානව හිමිකම් පිළිබඳ දැනුවත් භාවය අවදි කිරීම | 41 |
| 5.1.2 | මානව හිමිකම් පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමේ උළෙල | 41 |
| 5.1.3 | වධහිංසාවන්ට ලක්වූවන්ට සහය පළකිරීමේ ජාත්‍යන්තර දිනය- 2012 | 41 |
| 5.1.4. | මානසික ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා HRCSL මැදිහත්වීම | 41 |
| 5.1.5 | සිවිල් සමාජ හමුවීම් | 42 |
| 5.1.6 | මාධ්‍යවේදීන් සඳහා වන මානව හිමිකම් පිළිබඳ පුහුණු වැඩසටහන | 42 |
| 5.1.7 | ඔබගේ අයිතීන් කියාපෑමට ඇති අයිතිය පිළිබඳ පෝස්ටරයක් | 42 |
| 5.1.8 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මානව හිමිකම් පිළිබඳ අධ්‍යයන සමුළුව | 42 |
| 5.1.9 | ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ දිනය සැමරීම | 42 |
| 5.2 | රැස්වීම් / උපදෙස් සාකච්ඡා / මාධ්‍ය සාකච්ඡා / මාධ්‍ය නිවේදන - 2012 | 43 |


**හයවැනි පරිච්ඡේදය : විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති**


| | | |
|---|---|---|
| 6.1. | ජාතික මානව හිමිකම් පිළිබඳ ආයතන සඳහා වන එක්සත් ජාතීන්ගේ ආධාරය - මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන, ශ්‍රී ලංකාව, 2012 | 45 |
| 6.2. | යුනිසෙෆ් මගින් අරමුදල් සැපයෙන ව්‍යාපෘතිය | 47 |


**හත්වැනි පරිච්ඡේදය : 2012 වසරේ මානව හිමිකම් පිළිබඳ තත්ත්වය**


| | | |
|---|---|---|
| ඇමුණුම I: | විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාව [UPR] 2 වන වටය, 14 වන සැසිය, 2012 වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව [HRCSL] ඉදිරිපත් කළ ලිඛිත දේශනය | 54-59 |
| ඇමුණුම II: | ශ්‍රී ලංකාවේ වියපත් පුද්ගලයින්ගේ මානව හිමිකම් ශක්තිමත් කිරීම පිළිබඳ වාර්තාව | 60-62 |
| ඇමුණුම III: | නිල විදේශ සංචාර - සමුළු / රැස්වීම් / වැඩමුළු - 2012 වර්ෂය | 63 |
| ඇමුණුම IV: | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා වන හැකියා වර්ධන වැඩසටහන් - 2012 වර්ෂය | 64 |
| ඇමුණුම V: | වසරේ වැඩසටහන් කිහිපයක් | |

# කොමිෂන් සභාවේ සංයුතිය

**සභාපති**

විනිසුරු : ප්‍රියන්ත ආර්. පී. පෙරේරා

**කොමසාරිස්වරුන්**

ජෙසීමා ඉස්මයිල් මිය

ටී. ඊ. ආනන්දරාජා මහතා

ආචාර්ය බර්නාඩ් ද සොයිසා මහතා

ආචාර්ය එස්. ඩබ්ලිව්. ප්‍රතිභා මහානාමහේවා මහතා

## සභාපතිතුමාගේ පණිවුඩය



1993 වසරේ මානව හිමිකම් පිළිබඳ ලෝක සමුළුව පැරිස් මූලධර්මයන්හි තාර්කික පදනම හා අවශ්‍යතාවයන් හඳුනාගනිමින් ජාතික මානව හිමිකම් පිළිබඳ ආයතනයන් පිහිටුවීම හා ඒවා ශක්තිමත් කිරීම දිරිමත් කළේය. එසේම තම විශේෂිත අවශ්‍යතාවන් සඳහා වඩාත්ම ගැලපෙන්නා වූ රාමුව තෝරා ගැනීම පිණිස ද එක් එක් රාජ්‍යයන්ට අවසර ලබාදුන්නේය.

එසේම, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම වෙනුවෙන් ජාතික මානව හිමිකම් පිළිබඳ ආයතන විසින් විශේෂයෙන්  නිසි බලධාරීන් වෙත උපදෙස්  ලබා දෙමින්ද, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සඳහා ප්‍රතිකර්ම යොදමින්ද, මානව හිමිකම් සම්බන්ධ සුරක්ෂිතතාවය ව්‍යාප්ත කරමින්ද, සහ මානව හිමිකම් පිළිබඳව මහජනතාව, රාජ්‍ය නිලධාරීන්, පොලිසිය හා සන්නද්ධ හමුදාවන් දැනුවත් කරමින්ද ඉටු කරනු ලබන කාර්යභාරයෙහි වැදගත්කම ඉහත සමුළුව යළි තහවුරු කළේය.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන සංශෝධනයට අනුකූලව 1996 අංක 21 දරන පනතේ විධිවිධානයන් යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) පිහිටුවන ලදී. ශ්‍රී ලාංකික ජනතාවගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ හා සුරක්ෂිත කිරීමේ පෘථුල කාර්යය කොමිෂන් සභාව වෙත පවරා තිබේ. එසේම මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහාත් ඒවා විමර්ශනය කිරීම සඳහාත් කොමිෂන් සභාව වෙත බලය පවරා ඇති අතර මූලික අයිතිවාසිකම් පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්නට ඇති විධිවිධානයන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහාත් ගරුත්වය ප්‍රවර්ධනය කිරීම සඳහාත් මානව හිමිකම් හා සම්බන්ධ මූලධර්මයන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහාත් කොමිෂන් සභාවට බලය පවරා තිබේ.

බහුත්වවාදී සහ වගකිවයුතු පාර්ලිමේන්තුවත්,  ඡන්දයෙන් තෝරා පත් කරගන්නා නියෝජිතයන්ගේ බලාධිකාරයට අවසාන වශයෙන් යටත්වන්නාවූ විධායකයත්,  ස්වාධීන අධිකරණයත් ඇතුළත් වන්නා වූ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ආයතනයන්ට අනවශේෂයෙන් සහාය වීම මගින් මෙම ක්‍රියාකාරී ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකා මානව  හිමිකම් කොමිෂන් සභාව පසුගිය වසරේ අගනා දායකත්වයක් සිදු කර ඇති බව මාගේ හැඟීමයි.

මේ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වඩාත්ම වැදගත් දායකත්වයන් එහි බලය පහත කාර්යයන් සඳහා ක්‍රියාවේ යෙදවීම තුළින් මතු වේ.

- චෝදනා ලද මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ විමර්ශන කටයුතු භාර ගැනීම සඳහා
- මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථාකරණය සහ ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළිබඳ උපදෙස් සැපයීම සඳහා
- අයිතීන් ප්‍රවර්ධනය කිරීම හා මහජනයා දැනුවත් කිරීම සඳහා
- රජය හා සිවිල් සමාජ සංවිධාන අතරේ සම්බන්ධතා ගොඩනැගීම සඳහා
- මහජන විමසීම් සංකල්පය වෙනුවෙන් මුලපිරීම පිණිස වැයම් කිරීම සඳහා

පහත  විදහා දක්වා ඇති වැදගත් අරමුණු අවබෝධ කරගැනීම සඳහා පසුගිය වසරේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හරවත් දායකත්වයක් සපයා ඇති ක්ෂේත්‍ර විශේෂණය කිරීම මෙම අවස්ථාවේදී උචිත වනු ඇත.

- වයස්ගතවීම පිළිබඳ විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායම වෙත නිර්මාණාත්මක යෝජනා සැපයීමේ අදහස ඇතිව ශ්‍රී ලංකාවේ වියපත් භාවයට පත් වෙමින් සිටින ජනතාව විසින් මුහුණ දෙනු ලබන ප්‍රශ්න සලකා බැලීම සඳහා 2012 ජූනි මසදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික උපදෙස් සාකච්ඡාවක් සංවිධානය කළේය.

- සමාලෝචන කාලසීමාව තුළ බරපතල හැරවුමක් ගන්නා බවට පෙනීගිය ආගමික නොසන්සුන්තාවය පිළිබඳව තැකීමක් ඇතිව ආගමික නායකයන් සඳහා මානව හිමිකම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කළේය.

- ආබාධිතතාවයන්ගෙන් පෙළෙන පුද්ගලයින් සඳහා ඇති ප්‍රවේශයන් සම්බන්ධයෙන් වාර්තා වන්නා වූ වර්ධනය

වෙමින් පවතින සිද්ධීන් පිළිබඳවද මානව හිමිකම් කොමිෂන් සභාව බලවත් සැලකිල්ලක් දැක්වූයේය. විවිධාකාර ආබාධිතතාවයන් සහිත ජනතාවට ප්‍රජාව තුළ නිදහසේ හැසිරීම සඳහා ඇති අයිතීන් පිළිබඳව පොදුවේ සමාජය හා ආබාධිත තාවයන්ගෙන් යුත් පුද්ගලයන් දැනුවත් කිරීමේ අරමුණින් යුතුව **ප්‍රවේශය සඳහා වූ අයිතිය** යන තේමාව යටතේ කොමිෂන් සභාව මාධ්‍ය හමුවක් සංවිධානය කළේය.

- දෙමාපිය රැකවරණය හා ආරක්ෂාව අහිමිවූ අනාථ නිවාසගත දරුවන් පාසල්වලට ඇතුලත් කිරීමේ ගැටලුව සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විශේෂ උපදෙස් සාකච්ඡාවක්ද පැවැත්වූයේය. තම දෙමාපියන්ට අදාල මුල් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වූ දරුවන් පාසල් වලට ඇතුළත් කිරීම පිළිබඳව පවත්වන ලද විභාගයකදී මෙම ගැටළුව ඉස්මතු කොට දක්වන ලදී. එම අවස්ථාවේදී කොමිෂන් සභාව පොදු මාර්ගෝපදේශයන් නිකුත් කිරීමටත් පාසල් වලට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් අනාථ නිවාසයන්හි හෝ අනෙකුත් ආයතනයන්ට සීමා වී සිටින සියළු දරුවන් හට සම අවස්ථාවන් ලබා දීමට අවසර දෙමින් මෙකී ගැටළුවට අදාළ ප්‍රතිපත්තියෙහි වෙනසක් ඇති කිරීමටත් තීරණය කළේය.

- සමහර ජන කොටස් සඳහා සිදුවන වෙනස්කොට සැලකීම් හා පීඩාවන් වැළැක්වීමේ අදහස ඇතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන් ප්‍රකාරව ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට වර්තමාන වසරේදී කොමිෂන් සභාව උත්සාහ දැරීය.

- ශ්‍රී ලංකා සංදර්භය තුළ සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ගැටලු සංශෝධනය කිරීම සඳහා ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අවස්ථාව ලැබුණි. විවිධ රටවල සේවය කරන ශ්‍රී ලාංකීය සංක්‍රමණික සේවකයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා විදේශයන්හි පිහිටුවා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල හා කොන්සල් කාර්යාල ප්‍රමාණවත් පියවර ගෙන නැත යන්න කොමිෂන් සභාවේ දැඩි මතය වේ. මෙකී සන්දර්භය තුළ කොමිෂන් සභාව මෙම කාරණාව සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත විශේෂ මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙකී ක්‍රියාකාරකමට අදාළ විෂයයේදී සැලකිය යුතු දියුණුවක් ඇති වී තිබෙන බවට වාර්තා වේ.

- වධහිංසා වලට ලක් වූ වින්දිතයන්ට සහයෝගය පිණිස වූ ජාත්‍යන්තර දිනය සනිටුහන් කිරීම සඳහා කොමිෂන් සභාව මෙම වසර තුළදී වැඩසටහනක් සංවිධානය කළ අතර එයට පොලිස් නිලධාරීන්, බන්ධනාගාර පුනරුත්ථාපන නිලධාරීන් සහ සිවිල් සමාජ සංවිධානයන්හි සාමාජිකයෝ සහභාගි වූහ.

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදාල වසර තුළ එහි මෙහෙයුම් කටයුතු විස්තීරණය කළ තවත් ක්ෂේත්‍රයක් වූයේ 2012 ඔක්තෝබර් මස ශ්‍රී ලංකා පදනම් ආයතනයෙහි (SLFI) පැවැත්විමට සංවිධානය කළ වැඩමුළුවට සහභාගි වන ලෙසට සිවිල් අයිතිවාසිකම් පිළිබඳ සංවිධානවලට කළ ආරාධනාවයි. සියලුම සමාජ සංවිධාන වෙත ආරාධනාවක් පළ කරමින් මානව හිමිකම් පිළිබඳ විෂය හා සම්බන්ධ සියලුම කාරණා පිළිබඳව වැඩමුළුවට සහභාගි වී සිය අදහස් ඉදිරිපත් කරන ලෙසට එමගින් ඉල්ලා තිබුණි.

- 2012 දෙසැම්බර් මසදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රථම වතාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මානව හිමිකම් පිළිබඳ අධ්‍යයන සමුළුවක් පැවැත්වූයේය. මානව හිමිකම් මෙවලම් පිළිබඳ මූලික දැනුම ව්‍යාප්ත කිරීමත්, ඒවාට ගරු කිරීම සඳහා රාජ්‍යයට ඇති බැඳීම් අවධාරණය කිරීමත් මෙකී සමුළුවේ අරමුණ විය.

- පාසල් විෂය මාලාව තුළට මානව හිමිකම් අන්තර්ගත කිරීම. 2012 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව UNDP හි මූල්‍යාධාර ඇතිව පාසල් විෂය මාලාව තුළට මානව හිමිකම් අන්තර්ගත කිරීමේ දීර්ඝ කාලයක් පමා වී තිබූ ක්‍රියාදාමය ආරම්භ කළේය. මේ පිළිබඳ මූලික සාකච්ඡා ජාතික අධ්‍යාපන ආයතනය (NIE) සමග 2007 වසරේදී පවත්වා ඇති නමුත් අරමුදල් හිඟතාවය හේතුවෙන් මෙම කාර්යය දීර්ඝ කාලයක් ප්‍රමාද වී තිබේ. අනාගත පරම්පරාවේ උන්නතිය උදෙසා අපගේ අධ්‍යාපන ක්‍රමය ශක්තිමත් කිරීමේ වැදගත්කම හඳුනාගැනීම වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනයට මානව හිමිකම් කොමිෂන් සභාව කෘතඥතාවය පළකරයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ශ්‍රී ලංකා අධ්‍යාපන අභිවෘද්ධි සංගමය (SLAAED) සමග එක්ව අධ්‍යාපනය හා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන දෙකක් වූ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික

අධ්‍යාපන ආයතනය යනාදිය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට දැනට හැකිවී තිබීම ඉහත අභ්‍යාසයේ සුවිශේෂීතාවය වේ.


- 2007 වසරෙන් පසු මෙකී ක්‍රියාකාරී ක්ෂේත්‍රය තුළ දැනමත් ළඟා කරගෙන ඇති ජයග්‍රහණ පිළිබඳව තක්සේරු කිරීමේදී ප්‍රතිසන්ධාන හා ඒකාබද්ධතා ක්‍රියාදාමය සම්බන්ධයෙන් නව අංගයන් හඳුන්වාදී තිබෙන LLRC වාර්තාව හා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම වැනි අදාළ බොහෝ කරුණු සැලකිල්ලට ගත යුතුව තිබිණි.

- වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාතික සමුළුව
මෙකී කාර්ය ක්ෂේත්‍රය තුළ කටයුතු කරන්නා වූ සියලුම නියෝජිතායතන හා සංවිධානයන්ගේ යෙදවුම් සඳහා සමුළුව පහසුකම් සැලසීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙකී සමුළුව වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයට ධනාත්මක දායකත්වයක් ලබා දුන් අතර එකී වැදගත් සාධකය ශ්‍රී ලංකා ජනවිකාස සිතියමෙහි ඉස්මතු කොට දැක්වීය.

- මානව හිමිකම් කොමිෂන් සභා පනත සඳහා වන සංශෝධන
කොමිෂන් සභාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතට සිදු කළ යුතු සමහර සංශෝධන සම්බන්ධයෙන් ද සලකා බලා තිබේ. කොමිෂන් සභා සාමාජිකයෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව මෙම කාරණාව සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා තිබේ. මානව හිමිකම් කොමිෂන් සභා පනතට සිදු කළ යුතු අදාළ සංශෝධන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අයත් ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන්ගේ අදහස් ද මෙහිදී සැලකිල්ලට ගනු ලැබිණ.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් භාරගෙන ඇති කාර්යභාරයෙහි අභිවෘද්ධිය වෙනුවෙන් සිය අගනා සහයෝගය සහ ඵලදායී අදහස් ලබා දුන් එක්සත් ජාතින්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සමාජ කණ්ඩායම් යනාදි. සියල්ලන් වෙත මාගේ කෘතඥතා පූර්වක ස්තූතිය පිළිගැන්වීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන්, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යභාරයන් ඉටු කිරීම සඳහා තම පූර්ණ සහයෝගය සෑම විටම මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දුන් මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් හා කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් මාගේ කෘතඥතා පූර්වක ඇගයීම සනිටුහන් නොකළහොත් එය මාගේ වගකීම පැහැර හැරීමක් වනු ඇත. වර්තමාන කොමිෂන් සභාවේ අභිලාෂයන් වන සෑම දෙනාගේම මානව හිමිකම් සහතික කිරීම සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සාක්ෂාත් කර ගැනීමට එය දරන ප්‍රයත්නයේදී ඉහත සඳහන් සියළු පාර්ශ්වයන් තවදුරටත් ඔවුන්ගේ පූර්ණ සහයෝගය කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරමි.



**විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා**
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# හැඳින්වීම

ශ්‍රී ලාංකික ජනතාවගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වන ස්වාධීන හා මූලප්‍රමය වශයෙන් සක්‍රිය ආයතනයක් ලෙස 1996 අංක 21 දරන පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවන ලදී. ජාතික මානව හිමිකම් ආයතනවල තත්ත්වය හා සම්බන්ධ පැරිස් මූලධර්ම කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද පනතෙහි අඩංගු වේ. මීට පෙරාතුව ආයතන දෙකක් විසින් එනම් වෙනස් කොට සැලකීම තුරන් කිරීම සහ මානව හිමිකම් අධීක්ෂණය සඳහා වන කොමිෂන් සභාව සහ මානව හිමිකම් කාර්ය සාධන බලකාය යන ආයතන විසින් ඉටුකරන ලද කාර්යයන් කොමිෂන් සභාව භාරගත්තේය. කොමිෂන් සභාවේ කර්තව්‍යයන් අතරට 10 වන වගන්තියේ දක්වා ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයෙහි අන්තර්ගත මූලික අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි විභාග කිරීම යන්න ඇතුළත් වේ. එසේම එහි මානව හිමිකම් වැඩි දියුණු කිරීමේ ප්‍රවර්ධනය  කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය හා පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම සහ මානව හිමිකම් ක්ෂේත්‍රයේදී ගිවිසුම්වලට හා වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍රවලට දායකවීමේ හා එකඟවීමේ අවශ්‍යතාව පිළිබඳව ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි කර්තව්‍යයන්ද ඇතුළත් වේ.

ස්වකීය කාර්යයන් ඉටු කිරීම පිණිස කොමිෂන් සභාව වෙත පුළුල් පරාසයක බලතල පැවරී ඇති අතර පනතෙහි 11 වන වගන්තිය මගින් එම බලතල නියම කර ඇත. මූලික අයිතිවාසිකම් කඩවීමක් හෝ කඩවීමට ඉඩ තිබීමක් හා සම්බන්ධව යම් අධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පවතින නඩුවක කටයුතු වලට එකී අධිකරණයෙහි අවසරය ඇතිව මැදිහත්වීමේ බලය, රැඳවුම් ස්ථාන අඛණ්ඩව පරීක්ෂා කිරීම මගින් අධිකරණ නියෝගයක් මත හෝ වෙනත් යම් ආකාරයකින් රඳවා ගනු ලැබූ තැනැත්තන්ගේ සුබසාධනය අධීක්ෂණය කිරීම හා අවශ්‍ය නම් ඔවුන් රඳවා ගන්නා තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිළිබඳව නිර්දේශයන් ලබාදීම සඳහා වන බලයද ඊට ඇතුළත් වේ. මානව හිමිකම්වලට අදාළ දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම හා අධ්‍යාපනය ලබාදීම කොමිෂන් සභාවේ කාර්යයන් අතරින් එකක් වන බැවින්, පර්යේෂණ සිදුකිරීමට හා වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමට බලය එය සතුව ඇත. තවද, කොමිෂන් සභාවට එහි කාර්යන් ඉටු කිරීම පිණිස පුළුල් බලතල ලබාදෙමින් 11(ඌ) වගන්තිය **කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියළු දේ කිරීම**  යනුවෙන් සඳහන් කරයි.

කොමිෂන් සභාව සභාපතිවරයෙකුගෙන්ද  කොමසාරිස්වරුන් හතර දෙනෙකුගෙන්ද සමන්විත වන අතර කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද පනතේ දක්වා ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වන බලය ඔවුන් වෙත පැවරී ඇත.

තම කර්තව්‍යයන් වඩාත් ඵලදායි අන්දමින් ඉටු කිරීම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි කොමිෂන් සභාව සතුව ප්‍රාදේශීය කාර්යාල 10 ක් පවතී.  එබඳු ප්‍රාදේශීය කාර්යාල අතුරින් පහක් 2009 වසරට පෙර අභ්‍යන්තර  ගැළු හේතුවෙන් මානව හිමිකම් උල්ලංඝනය වූ බවට විශාල පැමිණිලි  සංඛ්‍යාවක් ලැබුණු උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වේ. රටේ අනෙකුත් විවිධ ප්‍රදේශවල ද තවත් ප්‍රාදේශීය කාර්යාල විවෘත කිරීමේ අවශ්‍යතාවය සහ පුද්ගලයින්ට තම දුක්ගැනවිලි විසඳාගැනීම සඳහා අධික දුරක් ගමන් කිරීමට සිදුවන බව දිගු කලක් තිස්සේ කොමිෂන් සභාවට දැනුනද කොමිෂන් සභාව එසේ කිරීම මූල්‍ය අර්බුදයන් හේතුවෙන් පසුගිය වසර කිහිපය පුරා වැළකී තිබුණි. උප කාර්යාලයක් නුවරඑළියෙහි ක්‍රියාත්මක වෙමින් තිබුණු අතර මහනුවර ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධිත නිලධාරීන් සෑම බදාදා දිනකම පැමිණිලි ලබාගැනීම සඳහා පැමිණියහ.  කෙසේ නමුත් ඉන් අනතුරුව පැමිණිලි පිළිබඳ විභාග මහනුවර කාර්යාලයේදී පවත්වනු ලැබේ. කෙසේ වුවද 2012 වසරේදී ජංගම කාර්යාල දෙකක් කිලිනොච්චියෙහි හා පුත්තලමෙහි විවෘත කිරීමට කොමිෂන් සභාවට හැකි විය. එකී කාර්යාල නිත්‍ය කාර්යාල බවට ඉතා ඉක්මනින් පරිවර්තනය කිරීමට අපේක්ෂා කෙරේ.

කොමිෂන් සභාව සතුව 2500කටත් අධික ග්‍රන්ථයන්ගෙන් සමන්විත පුස්තකාලයක් පවතී. පුස්තකාලයෙහි කොමිෂන් සභාව විසින් සිදුකරන ලද විශේෂ මැදිහත්වීම් හා පරීක්ෂණ පිළිබඳ වාර්තාද අන්තර්ගත වේ. අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා පුස්තකාලය භාවිතා කිරීමට ඕනෑම පුද්ගලයෙකුට අවසර ලබාගත හැකිය.

කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ බලාත්මක කිරීමේ නොහැකියාව වසර ගණනාවක් තිස්සේ සැලකිල්ලට භාජනය වී ඇති කාරණාවකි. සමාලෝචනයට යටත් වසරේදී සභාපතිතුමා සහ නීති ලේකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකරන ලද රාජ්‍ය පාර්ශ්වයේ සිද්ධි 90 ක් කැඳවා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් මුහුණපාන ගැටලු සම්බන්ධයෙන් විමසන ලදී. මෙම ක්‍රියාමාර්ගය සිද්ධි 48 ක් සම්බන්ධයෙන් සාර්ථක වූ අතර ඒවාට අදාළ පාර්ශ්වයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එකඟ විය.

2012 වසරේදී කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද ක්‍රියාකාරකම් එය මුහුණ දුන් අභියෝග හා අත් කරගත් ජයග්‍රහණ පිළිබඳ කෙටි සාරාංශයක් මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

දෙවැනි පරිච්ඡේදය

# මානව හිමිකම් කොමිෂන් සභාවෙහි අංශ

එක් එක් අංශ ප්‍රධානී වශයෙන් අධ්‍යක්ෂවරයෙකු සහිතව ක්‍රියාත්මක වන්නා වූ අංශ හතරකින් කොමිෂන් සභාව සමන්විත වේ. සමාලෝචන වර්ෂය තුළ එක් එක් අංශය විසින් ඉටු කරන ලද වැදගත් ක්‍රියාකාරකම් කිහිපයක සාරාංශයන් පහත විස්තර කර තිබේ

## 2.1 පරීක්ෂණ හා විමර්ශන අංශය

### 2.1.1 පුද්ගල පැමිණිලි

කොමිෂන් සභාවේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී මෙම අංශය විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කෙරේ. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් හෝ උල්ලංඝනය වීමට ආසන්න පැමිණිලි පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම එම අංශය විසින් සිදු කෙරේ. 2012 වසරේදී කොළඹ ප්‍රධාන කාර්යාලයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 4726 ක් වූ අතර ප්‍රාදේශීය කාර්යාල වලට ලැබුණු සමස්ත පැමිණිලි සංඛ්‍යාව 3765 කි.

| වසර | | වධහිංසා | අතුරුදන්වීම් හා ආගිය අතක් නොමැති වීම | නීතිවිරෝධී ඝාතන | අත් අඩංගුවේදී මියයාම් | අත් අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම |
|---|---|---|---|---|---|---|
| 2008 | ප්‍රධාන කාර්යාලය | 439 | 147 | 06 | 04 | 550 |
| | ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 337 | 883 | 15 | 08 | 767 |
| 2009 | ප්‍රධාන කාර්යාලය | 374 | 136 | 03 | 16 | 441 |
| | ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 212 | 1972 (පුද්ගලයන් සිටින ස්ථාන පිළිබඳ තොරතුරු සෙවීම) | 04 | 01 | 1417 |
| 2010 | ප්‍රධාන කාර්යාලය | 361 | 67 | 03 | 08 | 308 |
| | ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 170 | 1987 (පුද්ගලයන් සිටින ස්ථාන පිළිබඳ තොරතුරු සෙවීම) | 05 | 04 | 865 |
| 2011 | ප්‍රධාන කාර්යාලය | 348 | 48 | 04 | 10 | 307 |
| | ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 221 | 182 | 02 | --- | 274 |
| 2012 | ප්‍රධාන කාර්යාලය | 381 | 40 | 02 | 08 | 296 |
| | ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 154 | 86 | Nil | 01 | 379 |

සමාලෝචනයට පාත්‍ර වර්ෂය තුළ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව වූ 4726 න් පැමිණිලි 927 ක් කොමිෂන් සභාවේ බලතල සීමාව තුළට ඇතුළත් වූ ඒවා නොවීය. මෙලෙස කොමිෂන් සභාවේ බලසීමාවට අදාළ වූ පැමිණිලි සංඛ්‍යාව වූයේ 3799 ක් පමණි. වර්ෂය තුළ බැහැර කරන ලද පැමිණිලි සංඛ්‍යාව 3372 ක් වූ අතර පෙර වර්ෂයන්ට අදාල වූ පැමිණිලි 1439 ක් ඊට ඇතුළත් ය.

**2012 - ලැබුණු පැමිණිලි**

| අංකය | පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පුද්ගල නිදහස | 1650 |
| 2 | රැකියා | 1052 |
| 3 | සංක්‍රමික සේවක අයිතිවාසිකම් | 36 |
| 4 | අධ්‍යාපනය | 619 |
| 5 | දේපල හා උපයෝගිතාව | 328 |
| 6 | රාජ්‍ය සුභසාධනය | 25 |
| 7 | වෙනත් | 89 |
| | එකතුව | **3799** |

**2012 - විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලින් පසු අවසන් කරන ලද පැමිණිලි**

| අවසන් කරන ලද නඩු වල ස්වභාවය | 2012 අවසන් කරන ලද | වෙනත් වර්ෂවල අවසන් කරන ලද | එකතුව |
|---|---|---|---|
| මූ.අ. උල්ලංඝනය කිරීම් සිදු නොවූ | 610 | 515 | 1125 |
| උනන්දුවක් නොදැක්වූ | 197 | 269 | 466 |
| නිර්දේශය | 29 | 112 | 141 |
| සමථයට පත් කිරීම | 78 | 90 | 168 |
| සහන ප්‍රදානය කරන ලද | 134 | 147 | 281 |
| ඉල්ලා අස් කර ගන්නා ලද | 99 | 68 | 167 |
| වෙනත් බලධාරීන් වෙත යොමුකරන ලද | 240 | 11 | 251 |
| නියෝග දෙන ලද | 31 | 63 | 94 |
| අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු | 109 | 62 | 171 |
| බලතල සීමාව තුළට අයත් නොවන | 368 | 99 | 467 |
| කාලාවරෝධීවීම් | 38 | 03 | 41 |
| එකතුව | **1933** | **1439** | **3372** |

මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරනු ලබන පැමිණිල්ලක් සියලු විස්තර ඇතුලත් කොට ලියන ලද සරල ලිපියක් මගින් සිදු කළ හැකි අතර එය කොමිෂන් සභා කාර්යාලය වෙත හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක් වෙත තැපැල් මගින් යැවිය හැක. නැතහොත් ෆැක්ස්[1] මගින් ද යැවිය හැක. එසේම පුද්ගලයෙකුට කොමිෂන් සභාව වෙත පැමිණද පැමිණිලි කළ හැකිය. එවන් පුද්ගලයෙකුගේ දුක් ගැනවිල්ලට සවන් දීමෙන් අනතුරුව ඔහුට පැමිණිලි කිරීම සඳහා සහාය වීම පිණිස කාර්යාල වේලාව තුළදී රාජකාරි භාර නිළධාරියෙකු සිටින්නේය. රාජකාරි භාර නිළධාරියෙකු දිනකට පැමිණිලි 30 - 40 ක ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කරයි.

[1] O112694924

කොමිෂන් සභාවේ වෙබ්[2] අඩවිය මගින් අගතියට පත් තැනැත්තෙකුට නිශ්චිත පැමිණිලි ආකෘති පත්‍රයක් බාගත කර ගනිමින් එය සම්පූර්ණ කොට ඉන් අනතුරුව උචිත කාර්යාලයක් වෙත එය ගොනු කිරීමට ද හැකියාව ඇත.

පැමිණිල්ලක දෙවන අදියරය වනුයේ එය ඉදිරියට ගෙන යා හැකිද යන්න තීරණය කිරීමයි. පැමිණිල්ල ඉදිරියට ගෙන යා හැකි නම් වග උත්තරකරුවන්ගෙන් වාර්තා / නිරීක්ෂණ කැඳවීම වැනි මූලික පරීක්ෂණයක් සිදු කරනු ලැබේ. ඉන් අනතුරුව එවන් ලේඛන සියුම් ලෙස පරීක්ෂා කොට සිතාසි යවමින් පරීක්ෂණය මූලිකව ආරම්භ කරනු ලැබේ.

පැමිණිලි පිරිසැකසුම් කිරීමේදී කොමිෂන් සභාවට පහත කාර්යයන් සඳහා බලතල තිබේ.

i) සමථකරණය හා බේරුම්කරණය සඳහා පාර්ශ්වයන්ට පහසුකම් සැලසීම හෝ
ii) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් පරීක්ෂණ හා විමර්ශන සිදු කර නිර්දේශ ලබාදීම හෝ
iii) අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට හේතු වූ තත්ත්වය නිවැරදි කරන ලෙස අදාළ බලධාරීන්ට නියෝග කිරීම

එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් තමන් ලබා දී ඇති නිර්දේශ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පසුවිපරම් සිදු කරයි. කොමිෂන් සභාව විසින් ලබා දුන් නිර්දේශ යළි සලකා බැලීම සඳහා වන ඉල්ලීම් අභියාචනා ලෙස භාරගනු ලැබේ. එවිට කොමිෂන් සභාවට වැඩිදුර පරීක්ෂණයක් පවත්වා නිර්දේශය පිළිගන්නේද නැතහොත් එය ඉල්ලා අස් කර ගන්නේද යන්න තීරණය කළ හැකිය. වර්ෂය තුළදී ප්‍රාදේශීය කාර්යාල පරීක්ෂණ හා විමර්ශන සිදු කිරීම සඳහා සිද්ධි 219 ක් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළේය. ප්‍රාදේශීය කාර්යාල වලදී පරීක්ෂණ හා විමර්ශන අවසන් කරන ලද සිද්ධි සම්බන්ධ වාර්තා, ප්‍රධාන කාර්යාලය විසින් නිර්දේශ හෝ නියෝග නිකුත් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරනු ලැබේ. ප්‍රාදේශීය කාර්යාල සඳහා බලය ඇත්තේ සමථකරණය හා බේරුම්කරණය සඳහා පාර්ශ්වකරුවන්ට පහසුකම් සැලසීමට පමණි.

2012 වර්ෂය තුළදී පරීක්ෂණ පවත්වා වාර්තා කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නඩු කිසිවක් යොමු කරනු නොලැබිණි. යම් විෂය කරුණක් සම්බන්ධයෙන් අධිකරණයක් ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී නම් එබඳු කිසිදු කරුණක් වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මැදිහත් නොවේ.

ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, භාෂා කොමිෂන් සභාව වැනි වෙනත් ආයතනයන්හි විෂය සීමාව තුළට එන සිද්ධි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එකී ආයතන වෙතට යොමු කරයි.

වසර ගණනාවක් තිස්සේ අවසන් නොකරන ලද සිද්ධි විභාග කොට අවසන් කිරීම සඳහා පරීක්ෂණ නිලධාරීන් වශයෙන් විනිසුරුවරුන් හතර දෙනෙකු 2011 වසරේදී පත් කරන ලද අතර වසර අවසානයේදී එවන් සිද්ධි 206 ක් විභාග නොවී ඉතිරිව පැවතිණි. සමාලෝචන වසර තුළදී විනිශ්චයකරුවන් විසින් විභාග කරවීම පිණිස සිද්ධි 463 යවන ලදී. වසර අවසානයේදී සිද්ධි 385 ක් ඉතිරි කරමින් 2012 වසරේදී විනිසුරුවරු සිද්ධි 284 ක් අවසන් කර තිබේ.

අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ උල්ලංඝනය වීමට ඉඩ තිබෙන තත්ත්වයක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කිරීමට මහජනතාව වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ පැය 24 පුරා ක්‍රියාත්මක ක්ෂණික ඇමතුම් සේවාවක් ඇත. දැනුම්දීම මත, අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් ක්ෂණික පියවර ගැනීමට මෙම පහසුකම උපකාරී වේ.

කොමිෂන් සභාවේ හා එහි ක්‍රියාකාරකම් සම්බන්ධ අදාළ තොරතුරු කොමිෂන් සභාවේ වෙබ් අඩවිය[2] මගින් සපයයි. එබැවින් වෙබ් අඩවියට පිවිසී කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැනුවත්වීමට හැකියාව පවතී.

පැමිණිල්ලේ ස්වභාවය, පෙත්සම්කරුවන්ගේ හා වග උත්තරකරුවන්ගේ විස්තර යනාදිය හඳුනාගැනීමටත්, ලිපිගොනුවක් සොයාගැනීමටත් පරීක්ෂණ නිලධාරී තැනගේ නම හා නඩුවේ අදියරය දැනගැනීමටත් මෙකී අංශය විසින් පවත්වාගෙන යනු ලබන දත්ත සමුදාය උපකාරී වේ. ප්‍රාදේශීය කාර්යාලයක් වෙත කරන ලද පැමිණිල්ලක් සම්බන්ධයෙන් පවා කිසියම් තැනැත්තෙකුට සිය පැමිණිල්ල විභාගය සඳහා හා සමථකරණය සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර තිබේ නම් එම තැනැත්තාට මෙම පහසුකම ලබා ගත හැකිය.

### 2.1.2 පිරික්සුම් සඳහා යාමේ යාන්ත්‍රණය

පුද්ගලයන් රඳවා තබාගැනීම සඳහා රජය නියමකර ඇති පොලිස් ස්ථාන, බන්ධනාගාර, රැඳවුම් මධ්‍යස්ථාන හා වෙනත් කවර හෝ ස්ථානයන් වෙත පිරික්සුම සඳහා යාම කොමිෂන් සභාව සිදු කරයි. ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල මගින් කලින් නියම කර ගන්නා ලද හෝ අහඹු මාර්ග මගින් යාම තුළින් දිවයිනේ සියලු පොලිස් ස්ථාන ආවරණය කරනු ලැබේ. කොමිෂන් සභාව රාත්‍රී

[2] www.hrcsl.lk

කාලයේදී පොලිස් ස්ථාන වෙත සංචාරය කරනු ලබන්නේ එමගින් දිවා කාලයට වඩා නීති විරෝධී රඳවාගැනීම් හා වධහිංසා පැමිණවීම් අධීක්ෂණය කිරීම සඳහා එකී සංචාර උපකාරී වන බැවිනි. නියම කරගත් සංචාරයන්හි පහසුව සඳහා කොමිෂන් සභාව ගමන් මග අනුව වූ ලැයිස්තුවක් පිළියෙල කර ඇති අතර එකී ලැයිස්තුව ප්‍රකාරව කොමිෂන් සභාවේ පරීක්ෂණ නිලධාරීන් විසින් සංචාරය කළ යුතු පොලිස් ස්ථාන 400 කට ආසන්න ප්‍රමාණයක් රටෙහි පවතී. ප්‍රධාන කාර්යාලයට අයත් නිලධාරීන් පොලිස් ස්ථාන 159 ක සංචාරයකරන අතර අනෙකුත් පොලිස් ස්ථාන ප්‍රාදේශීය කාර්යාල 10 ට අයත් නිලධාරීන් විසින් ආවරණය කෙරේ.

පොලිස් ස්ථාන කරා යාමේ අරමුණු වන්නේ කාර්යක්ෂම ලෙස කල්වේලා ඇතිව හා ප්‍රතික්‍රියාවකට බලපාන ලෙස ගනු ලබන ක්‍රියාමාර්ග මගින් ශ්‍රී ලංකාවේ වධහිංසා හා නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීමේ සිද්ධි තුරන් කර දැමීම හෝ අවම කිරීම, මෙම උල්ලංඝනය කිරීම සිදු කරන, ඒවාට වගකිව යුතු නිලධාරීන් අදාළ ව්‍යවස්ථාපිත ආයතන ඉදිරියට ගෙන ඒමේ ක්‍රියාමාර්ග වලට මුලපිරීම හා වධහිංසා කිරීමේ සිද්ධි වලට එරෙහිව සටන් කිරීම පිණිස අනෙකුත් අදාළ රජයේ හා රජයේ නොවන ආයතන සමග සම්බන්ධීකරණය කිරීම වේ. ක්ෂණික ඇමතුම් පහසුකම් සහිත පැය 24 පුරා ක්‍රියාත්මක පැමිණිලි භාර ගැනීමේ නිලධාරී වෙත වධහිංසා, නීතිවිරෝධී අත් අඩංගුවට ගැනීම් හා රඳවාගැනීම් ආදිය පිළිබඳ පැමිණිලි රාශියක් ලැබේ. කොමිෂන් සභාව හදිසි පිරික්සුම් හා විමර්ශන සඳහා යාමද සිදු කරයි. මෙවැනි අවස්ථාවලදී එබඳු සිද්ධි වලට අදාළව කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් පසුවිපරම් කිරීම සිදු කෙරේ.

පොලිස් දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින ත්‍රස්ත විමර්ශන අංශය (TID) හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) වෙත විශේෂ පිරික්සුම් සඳහා යාමද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදු කරයි.

පොලිසි වෙත පිරික්සුම් සඳහා යාම තුළින් හඳුනා ගන්නා ලද පොදු ගැටළු පහත සඳහන් පරිදිවේ.

- අධිකරණයට ඉදිරිපත් කිරීමේදී ප්‍රමාදය
- සිරමැදිරි වල තදබදය
- ඇතැම් පොලිස් ස්ථානවල සිරමැදිරි තුළ නිසි සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම
- අත් අඩංගුවේදී පහර දීම
- පූර්ව විමර්ශන වලින් තොරව අත් අඩංගුවට ගැනීම
- සැකය මත අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් ගණනාවක් සම්බන්ධයෙන් එකී පුද්ගලයන් විසින් සිදු කරන ලදැයි චෝදනා කෙරෙන වැරදි / අපරාධ මොනවාදැයි පැහැදිලි කිරීමට පොලිස් නිලධාරීන් අසමත් වීම

පිරික්සුම් සඳහා බන්ධනාගාර වෙත යාම මසකට වරක් සිදු කෙරෙන අතර ඉල්ලීම මත එයට වැඩි වාර ගණනක් යාම සිදු කෙරේ. මෙසේ බන්ධනාගාර වෙත යාමේ අරමුණු වන්නේ සෞඛ්‍ය පහසුකම්, ඥාතීන් හමුවීමේ පහසුකම් හා අභ්‍යන්තර ආරක්ෂාව වැනි කරුණු අධීක්ෂණය කිරීම වේ. බලධාරීන් සමග සාකච්ඡා කර පවතින තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා වෙනස්කම් සිදු කිරීම මගින් ඇතැම් ගැටලුවලට වහාම විසඳුම් ලබා දීමට කොමිෂන් සභාවට හැකි වී තිබේ.

### 2.1.2.1 මහර බන්ධනාගාරය වෙත සිදු කරන ලද විශේෂ සංචාරය

වව්නියා බන්ධානාගාරයේ සිරකරුවන් කිහිප දෙනෙකු පහර දීමට ලක් වීම පිළිබඳ චෝදනාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමසාරිස් ටී.ඊ. ආනන්දරාජා මහතාගේ උපදෙස් මත මහර බන්ධනාගාරය වෙත සංචාරයක් සිදු කරන ලදී. ඉහත සිරකරුවන් ප්‍රථමයෙන් වව්නියාවේ සිට අනුරාධපුර බන්ධනාගාරයටත් එතැන් සිට මහර බන්ධනාගාරය වෙතත් මාරු කර එවා තිබිණ. එල් ටී ටී ඊ සංවිධානයට අයත් හට පිරිස් වීම හේතුවෙන් සිරගත වී සිටි මෙකී සිරකරුවන් 10 දෙනාට පහර දීමක් සිදුවී ඇති බව අදාළ කණ්ඩායම් තහවුරු කළේය. අනුරාධපුර බන්ධනාගාරයේ සිට වවුනියා බන්ධනාගාරය වෙත මාරු කර යවන ලද තවත් සිරකරුවෙකුගෙන් ඔවුන් ලද තොරතුරු අනුව අනුරාධපුර බන්ධනාගාරයේ සිටි තම සහෝදර සිරකරුවෙකු පහරදීමට ලක් වීම හේතුවෙන් එකී සිරකරුව යළිත් වවුනියාව බන්ධනාගාරයට රැගෙන එන ලෙස මෙකී සිරකරුවන් දැඩි ලෙස ඉල්ලා තිබුණි. එකී ඉල්ලීම පිළි නොගැනීම හේතුවෙන් සිරකරුවන් විසින් ජේලර්වරුන් තම හිර අඩස්සියට ගෙන තිබුණි. ඉන් ඉක්බිතිව විශේෂ කාර්ය බලකාය බන්ධනාගාරයට ඇතුළු වී සිරකරුවන්ට පහර දී ජේලර්වරුන් මුදවාගෙන ඇති අතර සිරකරුවන් 10 දෙනා අනුරාධපුරයට මාරු කර ඇත. අවසානයේදී මෙකී සිරකරුවන් 10 දෙනා ඔවුන්ට වෛද්‍ය පහසුකම් ලබා ගත හැකිව පවතින මහර බන්ධනාගාරය වෙත මාරු කර තිබේ.

කොමිෂන් සභාව උක්ත පහර දීම සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානය, බන්ධනාගාර මූලස්ථානය යනාදී ස්ථාන වලින් වාර්තා කැඳවා තිබූ අතර අධිකරණ වෛද්‍ය වාර්තාවක්ද කැඳවා තිබුණි.

සැකකරුවන් විසින් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත හා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත කරන ලද ප්‍රකාශයන්හි පහර දෙන ලද ස්ථානය සම්බන්ධයෙන් පරස්පර විරෝධීතාවයන් දක්නට ලැබුණි. සිදුකරන ලද විමර්ශන සහ සැකකරුවන් විසින් දෙන ලද ප්‍රකාශන මත පදනම්ව සැලසුම් සහගත හෝ චේතනාන්විත පීඩා කිරීමක් බන්ධනාගාර නිලධාරීන් විසින් හෝ විශේෂ

කාර්ය බලකාය විසින් සිදු කර නොමැති අතර ඔවුන් සිදු කර ඇත්තේ බන්ධනාගාරයේ උද්ගත වූ නොසන්සුන්තාවය පාලනය කිරීම සඳහා අවශ්‍ය වූ සුළු පහර දීමක් යන්න කොමිෂන් සභාවෙහි අදහසයි.

2012 සැප්තැම්බර් 10 වන දින සිද්ධියට අදාළ පොලිස් මූලස්ථානයේ වාර්තාව කොමිෂන් සභාව වෙත ලැබුණු අතර සිරකරුවන් නීති විරෝධී ආකාරයෙන් බන්ධනාගාර ජේලර්වරුන් සිර අඩස්සියට ගෙන ඇති බවත්, එහෙයින් ඇතිව තිබූ තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට යළි පත් කිරීම සඳහා බලධාරීන්ට පියවර ගැනීමට සිදු වූ බවත්, අවශ්‍ය වූ ඉතා අවම බලයක් එකී අරමුණු සඳහා භාවිතා කළ බවත් වාර්තා සඳහන් කළේය.

### 2.1.2.2 වැලිකඩ බන්ධනාගාරය වෙත සිදු කරන ලද විශේෂ සංචාරය

2012 සැප්තැම්බර් මස මානව හිමිකම් ආරක්ෂකයින්ගේ සංවිධානයෙන් ලැබුණු තොරතුරක් මත කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ යම් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදු වෙමින් පවතින බවට වූ තොරතුර සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීම සඳහා විමර්ශන නිලධාරීන් දෙදෙනෙකු යවන ලදී. එකී නිලධාරීහු බන්ධනාගාර නිලධාරීන් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන් හමු වූ අතර අවසානයේ මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදු නොවී ඇති බවට තීරණය කළහ.

### 2.1.2.3 දිවිතුරාවත්ත, අක්කර 20, පොල්හේන වෙත සිදු කරන ලද විශේෂ සංචාරය

සිංහල හා දෙමළ සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පිහිටුවා තිබූ ගම්මානයක් වූ දිවිතුරාවත්ත, අක්කර 20, පොල්හේනෙහි ජීවත් වූ සිංහල හා දෙමළ වැසියන් අතරේ ඇති වූ ආරාවුලකදී පොලිසිය සිය රාජකාරි කටයුතු සාධාරණ ලෙස ඉටු නොකළ බවට වූ පැමිණිල්ලක් සිවිල් අයිතිවාසිකම් පිළිබඳ නීතිඥවරයෙකුගෙන් හා පැපරල් සංවිධානයෙන් ලැබී තිබුණි. විමර්ශන කණ්ඩායමක් අදාල ස්ථානයට ගොස් පරීක්ෂණයක් පවත්වන ලදී. විපතට පත් වූ අයගෙන් හා අදාල අනෙකුත් පාර්ශවයන්ගෙන් පරීක්ෂණයේදී ප්‍රකාශ සටහන් කරගන්නා ලදී. පරීක්ෂණය අවසානයේදී රාජ්‍ය බලධාරීන් නීතිය හා සාමය අනුව සාධාරණ හා යුක්තිසහගත ආකාරයෙන් තම රාජකාරී කටයුතු සිදු කර ඇති බවට අනාවරණය විය.

### 2.1.2.4 කාත්තන්කුඩි වෙත සිදු කරන ලද විශේෂ සංචාරය

සම්පූර්ණ වාර්තාව හතරවන පරිච්ඡේදයෙහි දැක්වේ.

### 2.1.3 රැඳවුම් නියෝග ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය යටතේ 1977 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හෝ මහජන ආරක්ෂක ආඥාපනත (10 වෙනි අධිකාරිය) යටතේ සාදන ලද රෙගුලාසියක් යටතේ යම් තැනැත්තෙකු අත් අඩංගුවට ගන්නා විට හෝ රඳවා තබා ගන්නා විට එබඳු අත් අඩංගුවට ගැනීමෙක් හෝ රඳවා තබා ගැනීමක් පිළිබඳව හා එම තැනැත්තා රඳවා තබා ගන්නා ස්ථානය පිළිබඳව කොමිෂන් සභාවට දැනුම්දීමද එසේ අත් අඩංගුවේ තබාගත් හෝ රඳවා තබාගත් තැනැත්තා නිදහස් කළ විට හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කළ විට ඒ අනුව කොමිෂන් සභාවට දැනුම්දීමද එබඳු අත් අඩංගුවට ගැනීමක් සිදු කරන හෝ රැඳවුම් නියෝගයක් ලබා දෙන තැනැත්තාගේ වගකීම වේ.

කොමිෂන් සභාව රැඳවුම් නියෝග ලේඛනයක් පවත්වාගෙන යන අතර 2012 වසර වෙනුවෙන් රැඳවුම් නියෝග 1053 ක් ලියාපදිංචි කරනු ලැබ ඇත.

### 2.1.4 වැදගත් සිද්ධි කිහිපයක්

#### 2.1.4.1 පරිසරය හා සම්බන්ධ - HRC/6441/07

**පූජ්‍ය කොළොන්නේ සිරිශාන්ත හිමි සහ තවත් අය**

**එරෙහිව**

**ලේකම්, බෞද්ධ හා ආගමික කටයුතු අමාත්‍යාංශය හා තවත් රාජ්‍ය ආයතන නවයක ප්‍රධානීන්**

මහජනතාවගේ සංස්කෘතික හා ආගමික අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නා වූ ආකාරයෙන් ශ්‍රී පාදය මුදුනේ වීදුරු වලින් ආවරණය කෙරෙන ගොඩනැගිල්ලක් ඉදි කිරීම නවතාලන ලෙසට ඉල්ලමින් පෙත්සම්කරුවන් විසින් පැමිණිල්ලක් කර තිබුණි. කොමිෂන් සභාව විසින් මේ පිළිබඳව පවත්වන විභාගයේදී අනාවරණය වූයේ සත්පියුම් පාරමිතා සංවිධානය යනුවෙන් හැඳින්වෙන ලාබ නොලබන ආයතනයක් විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට භාරගෙන ඇති බවත් විහාරාධිපති වහන්සේගේ කැමැත්ත ඇතිව මහජනතාවගෙන් ආධාර එකතු කොට වීදුරු ආවරණද, විවිධ මාධ්‍යයන් හරහා මෙකී අරමුණු වෙනුවෙන් අරමුදල් එකතු කිරීම සඳහා වැඩසටහන්

ප්‍රචාරය කරමින් සිටින බවත් අනාවරණය විය. එසේම, අදාළ වැඩකටයුතු විහාරාධිපතිගේ සුපරීක්ෂණය යටතේ සිදුවෙමින් පැවති බවත් සංචාරකයින් සඳහා කේබල් කාර් රථ සේවාවක් සඳහා වන ව්‍යාපෘතියක්ද පැවති බවත් වැඩි දුරටත් අනාවරණය විය.

කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විභාගයේදී ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට පෙරාතුව නියමිත ක්‍රියා පිළිවෙත් අනුගමනය කර නොමැති බව අනාවරණය වූ අතර ඉදිකිරීම් කටයුතු වහාම නවතාලන ලෙසට කොමිෂන් සභාව වග උත්තරකරුවන්ට නියෝග කරමින් එහි නිර්දේශයන් ඉදිරිපත් කළේය. එසේම, ගමන් මාර්ගය ඇතුළු සමස්ත ශ්‍රී පාද ප්‍රදේශයම ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලෙසටත්, කිසියම් ඉදිකිරීම් කටයුත්තක් සිදු කරනු ලබන්නේ නම් එය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළත් අදාළ සියලුම පාර්ශ්වයන් වෙත දැනුම් දීමෙන් අනතුරුව පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ යටතේ සිදු කරන ලෙසටත් වග උත්තරකරුවන්ට නියෝග කරමින් කොමිෂන් සභාව එහි නිර්දේශ ඉදිරිපත් කළේය. එසේම, ඉදිකිරීම් කටයුතු නවතාලීමට අදාල වග උත්තරකරුවන්ගේ අක්‍රියතාවය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වූ ආගමික හා සංස්කෘතික අයිතීන්ද, (1948) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා 1931 අංක 31 දරන විහාර ආඥාපනත යනාදිය උල්ලංඝනය වී ඇති බවට කොමිෂන් සභාව වැඩිදුරටත් ප්‍රකාශයට පත් කළේය.

### 2.1.4.2 බන්ධනාගාර පරිපාලනය - HRC/3712/10, HRC/2891/10, HRC/2414/10, HRC/2306/10, HRC/4158/10, HRC/4293/10

**වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන්, වැලිකඩ බන්ධානගාර රෝහලේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්**

**එරෙහිව**

**වැලිකඩ බන්ධනාගාර රෝහලේ ස්ථාන භාර නිලධාරී, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**

එක් පැමිණිලිකාරියක් සඳහන් කරනු ලැබුයේ ඇයගේ ස්වාමිපුරුෂයා අධික රුධිර පීඩනයෙන් පෙළෙමින් සිටින දියවැඩියා රෝගියෙකු බවත්, කෙසේ වුවද බන්ධනාගාර රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී තැන නිසි ප්‍රතිකාර අඛණ්ඩව ඔහුට දී නොතිබුණ බවත් ඔහුට ලබා දෙන බෙහෙත් නිතර නිතර වෙනස් කර තිබුණු බවත්ය. ඉන් අනතුරුව ඇය ඇගේ ස්වාමිපුරුෂයා බැලීමට යාම සීමා කිරීමට ලක් කර ඇති බවත් වැඩි දුරටත් සඳහන් කළාය.

මේ පිළිබඳව කරන ලද විමර්ශනයෙන් හා පරීක්ෂණයෙන් පසු කොමිෂන් සභාව පහත සඳහන් නිර්දේශ සිදු කළේය.

1) රැඳවියන් ප්‍රතිකාර සඳහා ජාතික රෝහලට යවන ලෙසට අධිකරණ නියෝග තිබියදීත් ඔවුන් එහි යවා නොමැත. එබැවින් බන්ධනාගාර බලධාරීන් මෙවන් සිදුවීම් අනාගතයේදී සිදු නොවීම පිණිස පියවර ගත යුතුය.

2) රෝහල් කාර්ය මණ්ඩලය හා වග උත්තරකරුවන් අතර පවතින පරිපාලනමය විෂමතා හේතුවෙන් ප්‍රතිකාර ලබාගැනීම පිණිස රැඳවියන්ට ඇති අයිතිය අහිමි නොකළ යුතුය.

3) රැඳවියන් රෝහල්ගත කිරීමේදී ඒ සඳහා වන ක්‍රියා පිළිවෙත සාධාරණ, යුක්ති සහගත හා ස්වාධීන විය යුතුය.

### 2.1.4.3 අධ්‍යාපනය සම්බන්ධ - HRC/4643/09 කේ. ජයසිංහ මිය

**එරෙහිව**

**13 වසර භාර ගුරුභවතා (කලා), ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය, ඇල්පිටිය**

පැමිණිලිකාර මව සඳහන් කළේ ඇල්පිටිය ආනන්ද විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටි ඇයගේ පුතා දෙසට වගඋත්තරකරු විසින් චේතනාන්විතව ඝන බෝලයක් විසි කිරීම හේතුවෙන් ඇයගේ පුතාගේ තොල් තුවාල වූ බවයි. ඇල්පිටිය පොලිස් ස්ථානාධිපතිවරයා මේ සම්බන්ධයෙන් ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. කොමිෂන් සභාව මෙම සිද්ධිය පරීක්ෂා කළ අධිකරණ වෛද්‍ය නිලධාරීවරයාගෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවද, මෙකී සිද්ධිය ඇසින් දුටු ශිෂ්‍යයන්ගෙන් දිවුරුම් ප්‍රකාශද ලබා ගත් අතර පරීක්ෂණ පවත්වා පහත නිර්දේශයද ඉදිරිපත් කළේය.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශිෂ්‍යයාගේ අයිතීන් උල්ලංඝනය වී ඇති බැවින් පැමිණිලිකරුට වන්දි වශයෙන් රු. 10,000/- මුදලක් ගෙවන ලෙසට වග උත්තරකරුට නිර්දේශ කෙරිණ. කොමිෂන් සභාව, වග උත්තරකරුට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටියේය.

**2.1.4.4 පරිසරය සම්බන්ධව** - HRC/2073/09, HRC/1166/09,HRC/4945/09,HRC/5405/09

**චන්ද්‍රා අමරසිංහ මිය**

**එරෙහිව**

**ලේකම්, ජාඇල ප්‍රාදේශීය සභාව / සභාපති** BOI/ **සභාපති** CEA / **සභාපති ශ්‍රී ලංකා** L R&D **සංස්ථාව සභාපති** UDA

**සවිස්තර වාර්තාව හතරවැනි පරිච්ඡේදයෙහි දැක්වේ.**

### 2.1.5 අවසන් නිගමනය

මෙම අංශය වර්ෂය තුළදී සිද්ධි 3372 ක් සම්බන්ධ කටයුතු අවසන් කළ නමුත් එයින් 2012 වසරේදී ලැබුණු සිද්ධි වලට සම්බන්ධ වුයේ සිද්ධි 1933 ක් පමණි. වසර තුළ ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 3799 කි. එබැවින් 2012 වසරේ ලැබුණු පැමිණිලි 1439 ක් 2013 වසරට ගෙන ගොස් තිබේ. සෑම වසරකදීම පැමිණිලිවලින් අවම වශයෙන් 75% පමණ අවසන් කිරීම කෙරෙහි බාධා ඇති කරන හේතු දැඩි ලෙස සොයා බැලිය යුතුව ඇති අතර කොමිෂන් සභාවේ වාර්තාවල පසුගිය වර්ෂයන්ට අදාළ සිද්ධි ගොඩගැසීම වැළැක්වීම සඳහා ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයග

## 2.2 අධීක්ෂණ හා සමාලෝචන අංශය

රටේ මානව හිමිකම් පිළිබඳ තත්ත්වය අධීක්ෂණය කිරීමේ කාර්ය අධීක්ෂණ හා සමාලෝචන අංශයට පැවරී ඇත. රාජ්‍ය ආයතන මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීමට මග පාදන ලෙස පද්ධති තුළ පවතින යම් වැරදි හඳුනාගෙන එබඳු උල්ලංඝනය කිරීම්වලට හේතුවන පරිපාලනමය හා විධායක ක්‍රියාමාර්ග වලින් වැලකීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග අදාළ බලධාරීන් හට නිර්දේශ කිරීම මෙම අංශය මගින් ඉටු කිරීම අවශ්‍ය කෙරේ. තොරතුරු සෙවීමේ මෙහෙයුම් / අධ්‍යයන / පර්යේෂණ ද මෙම අංශය විසින් සිදු කෙරෙන අතර එබඳු ව්‍යාපෘති සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රජයට නිර්දේශ ඉදිරිපත් කෙරේ. මහජනතාව වෙනුවෙන් කටයුතු කිරීමේදී මානව හිමිකම් උල්ලංඝනය වීම වැළැක්වීම  පිණිස රාජ්‍ය බලධාරීන් වෙත මෙම අංශය පොදු මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරන අතර සම්මත පිළිවෙත්ද නිකුත් කරයි. අවශ්‍ය යැයි හැඟී යන විට එබඳු මාර්ගෝපදේශ / සම්මත පිළිවෙත්වල ප්‍රගතිය සමාලෝචනය කිරීමටද මෙම අංශය පියවර ගනී.

මෙම අංශය විසින් ඉටු කරන ලද වැදගත් කාර්යයන් කිහිපයක් :

### 2.2.1. වරප්‍රසාද නොලත් අනාථ නිවාසගත ළමුන් වෙනුවෙන් පාසල් ප්‍රවේශයන් සඳහා සම අවස්ථා ලබාගැනීම පිළිබඳ සාකච්ඡා

දෙමාපිය රැකවරණය හා ආරක්ෂාව අහිමි අනාථ නිවාසගත දරුවන්ට පාසල් ප්‍රවේශයන් අහිමිවීමේ ගැටලුව සාකච්ඡා කිරීම සඳහා විශේෂ උපදෙස් සාකච්ඡාවක් පවත්වන ලදී. දරුවෙකු තම දෙමාපියන් පිළිබඳ සත්‍ය ලේඛන පෙන්වා සිටීමට අපොහොසත් වන විටක පාසලට ඇතුලත් වීමට ළමයාට ඉඩ ලබා නොදීම පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් පවත්වන ලද විභාගයකින් පසුව මෙම ගැටලුව හඳුනාගන්නා ලදී. උපදෙස් සාකච්ඡාවෙන් පසු කොමිෂන් සභාව අනාථ නිවාස වල ළමුන්ට හෝ ආයතන වලට සීමා කෙරී ඇති ළමුන්ට පාසල් ප්‍රවේශයන් සඳහා සම අවස්ථා ලබා දීමට අවසර දෙමින් මෙම ගැටලුව පිළිබඳ පොදු මාර්ගෝපදේශ නිකුත් කිරීමට හෝ ප්‍රතිපත්තිමය වෙනසක් සිදු කිරීමට තීරණය කළේය.

### 2.2.2 භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

මේ වසරේදී මහජනතාවගේ යම් යම් කොටස් සඳහා සිදුවන වෙනස්කොට සැලකීම් හා පීඩාවන් වැළැක්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට මෙම අංශය පටන් ගත්තේය. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව ලෙසට විධිවිධාන සලසා ඇති අතර 13  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් දෙමළ භාෂාවද ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාවක් බවට පත් කොට තිබේ. එසේම සිංහල හා දෙමළ භාෂා ශ්‍රී ලංකාවේ ජාතික භාෂා විය යුතු බවටද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැඩිදුරටත් සඳහන් කරයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මගින් මාර්ග පුවරු, රජයේ ප්‍රවාහන රථ, රජයේ ප්‍රවාහන සේවාව භාවිතා කරමින් උතුරු නැගෙනහිර පළාත් තුළ හා කොළඹ ජනතාවට සිදුකරන දැන්වීම් වලට අදාල තොරතුරු සම්බන්ධයෙන් භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කෙරී ඇති අවස්ථා 80කට ආසන්න ප්‍රමාණයක් සම්බන්ධයෙන් පැමිණිලි කර තිබේ.

I. මෙම අංශය මෙම කාරණාව පිළිබඳව විභාග කළේය. ඉන් අනතුරුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (SLTB) තම පළාත් කළමනාකරුවන්, ඩිපෝ අධිකාරීවරුන් හා අදාළ අනෙකුත් නිලධාරීන් වෙත රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලෙසට නිර්දේශ කළේය. එසේම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ චක්‍රලේඛනයකට අනුව කාලයෙන් කාලයට එකී ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කරන ලෙසටද ඉල්ලා තිබේ. කොමිෂන් සභාවටද උක්ත චක්‍රලේඛනයෙහි පිටපතක් ලැබී ඇත.

II. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේදී රජයේ ත්‍රිභාෂා ප්‍රතිපත්තිය අනුගමනය නොකෙරෙන බවට පැමිණිල්ලක් සිදු කෙරිණි. මෙම කාරණාව විභාග කිරීමේදී පැමිණිල්ලේ සඳහන් වූ වග උත්තරකරු මහ බැංකුවේ අධිපතිවරයා නියෝජනය කරමින් එවන් උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවට පිළිගත් අතර අනාගතයේදී මුද්‍රණය කෙරෙන මුදල් නෝට්ටු සම්බන්ධයෙන් ත්‍රී භාෂා ප්‍රතිපත්තිය අනුගමනය කරන බවට සහතිකයක් ලබා දුන්නේය.

## 2.2.3. 2008 වසරේදී නිකුත් කරන ලද (UPR) නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම

සමාලෝචන වසර තුළදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට (HRC) අයත් විශ්ව වාරානුකූල සමාලෝචනය (UPR) මගින් 2008 වසරේදී ශ්‍රී ලංකාව පිළිබඳව කරන ලද නිරීක්ෂණ සම්බන්ධයෙන් කොමිෂන් සභාව රාජ්‍ය බලධාරීන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් සමග අන්තර් සබඳතාවයක් පැවැත්වූයේය. UPR යනු මානව හිමිකම් පිළිබඳ නව යාන්ත්‍රණයක් වන අතර මානව හිමිකම් කවුන්සිලය ඒ හරහා වාරාණුකූලව සාමාජික රටවල් 192 හි මානව හිමිකම් පිළිබඳ බැඳීම් හා කැපවීම් සමාලෝචනය කරයි. 2008 වසරේදී ක්‍රියාකාරී කණ්ඩායම විසින් ලබා දෙන ලද UPR නිර්දේශ 52ක් ශ්‍රී ලංකා රජය පිළිගත් අතර නිර්දේශ 8 කට පොදු ප්‍රතිචාරයක් දක්වා නිර්දේශ 25 ක් ප්‍රතික්ෂේප කළේය. ශ්‍රී ලංකාව පිළිගත් නිර්දේශ අතර මානව හිමිකම් සම්බන්ධයෙන් ක්‍රියා කරන HRCSL වැනි ආයතනයන්හි ස්වාධීනත්වය ශක්තිමත් කිරීම සහ තහවුරු කිරීම, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීමට පියවර ගැනීම, ගැලපෙන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව අභ්‍යන්තරික වශයෙන් අවතැන්වූවන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වන පියවරයන් යොදා ගැනීම ඇතුළත් වේ.

රජය විසින් ප්‍රතික්ෂේප කර ඇති විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාවේ නිර්දේශ අතර තහවුරු කරගත යුතු වැදගත් කාරණා පවත්නා නිසා එම අයිතින් තහවුරු කිරීමට රජය පෙළඹවීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුව පවතී. මේ සඳහා රාජ්‍ය නොවන සංවිධාන විසින්ද වගකීමකින් යුතුව අදාල පෙළඹවීම් සඳහා ක්‍රියා කල යුතුව පවතින බවද සඳහන් කළ යුතුය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2012 අප්‍රේල් මස දී 2008 UPR නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රාජ්‍ය පාර්ශ්වයේ නියෝජිතයන් හා සිවිල් සමාජ නියෝජිතයන් සමග වෙන වෙනම සාර්ථක සාකච්ඡා දෙකක් පවත්වන ලද අතර එකී සාකච්ඡාවන්හිදී සහභාගි වූවන් විසින් ප්‍රකාශ කරන ලද අදහස් තක්සේරු කරන ලදී. අවසානයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලිඛිත දේශන 2012 අප්‍රේල් මස UPR 2 වන වටයේ 14 වන සැසියට ඉදිරිපත් කරන ලදී.

UPR වෙත ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලිඛිත දේශන ඇමුණුම් 1 හි ඇත.

## 2.2.4. බන්ධනාගාර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සමග වූ විශේෂ උපදෙස් සාකච්ඡාව

බන්ධනාගාරයන්හි පවතින තදබදය සහ දඩුවම් නියම වූ සිරකරුවන් හා දීර්ඝ කාලයක් රිමාන්ඩ් භාරයේ ඇති සිරකරුවන් හා සම්බන්ධ ප්‍රශ්න වැනි ගැටලු සාකච්ඡා කිරීම සඳහා පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තු නිළධාරීන්, සමාජ සේවා අමාත්‍යාංශ නිලධාරීන් හා අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලයේ නිලධාරීන් ඇතුලුව රාජ්‍ය නිලධාරීන් 40 දෙනෙකු සමග උපදෙස් සාකච්ඡාවක් පවත්වන ලදී. වැලිකඩ බන්ධනාගාරයේ කෝලාහලය ඇති වීමට මාස දෙකකට පෙරාතුව එනම් 2012 සැප්තැම්බර් මස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙකී සාකච්ඡාව සංවිධානය කර තිබීම අවධානයට ගත යුතු වැදගත් කරුණකි. 2011 දී සභාපතිතුමාත්, කොමසාරිස්වරයෙකුත් අධීක්ෂණ අංශයේ නිලධාරීන් කිහිප දෙනෙකුත් වැලිකඩ බන්ධනාගාරය වෙත සංචාරය කළ අතර ක්ෂණික විසඳුම් අවශ්‍ය වන්නා වූ සිරකරුවන්ගේ මානව හිමිකම් පිළිබඳ ගැටළු රාශියක් පැවති බවට දැනගත්හ. බන්ධනාගාරයන්හි පවතින හදිසි ගැටලු සම්බන්ධයෙන් රජය වෙත නිශ්චිත නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවට හැකි වනුවස් බන්ධනාගාර සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමේ අරමුණින් යුතුව උපදෙස් සාකච්ඡාව කොමිෂන් සභාව විසින් සංවිධානය කළේය.

උපදෙස් සාකච්ඡාවේදී ලබාගන්නා ලද අදහස් හි සාරාංශය 4 වන පරිච්ඡේදයෙහි දක්වා ඇත.

### 2.2.5. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සංක්‍රමණික සේවක ගැටලු පිළිබඳව නව කේන්ද්‍රස්ථානයක් පිහිටුවයි

කොමිෂන් සභාව වසර ගණනාවක් පුරා සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී තිබෙන අතර විදේශීය රැකියාවන් පිළිබඳ මූලික නියාමන ආයතනයක් වූ විදේශීය රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය විසින් සපයනු ලබන ශ්‍රම සංක්‍රමණය සඳහා වන ආයතනික රාමුවක වැදගත්කම හඳුනාගනී. විදේශගත සියලුම ශ්‍රී ලාංකික සේවකයින් සඳහා ආරක්ෂාව හා සුභසාධනය සැපයීම වෙනුවෙන් බලය හා පහසුකම් සහිතව ශ්‍රමය ලබාගන්නා රටවල්හි පවතින ශ්‍රී ලංකා තානාපති සේවාවන් සූදානම් කොට තිබේ. ශ්‍රී ලංකා සංදර්භය තුළ සංක්‍රමණික සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන රාජ්‍ය ආයතන හා නියෝජිතායතන බොහොමයක් විසින් ඉටුකරනු ලබන ප්‍රධාන භූමිකාවන් අගය කරන අතරේ එක් එක් රටවල්හි සේවය කරන අපගේ සංක්‍රමණික සේවකයින්ගේ යහපත රැකබලා ගැනීමේදී ශ්‍රී ලංකා තානාපති කාර්යාල හා කොන්සල් කාර්යාල විසින් ඉටු කරනු ලබන කාර්යභාරය සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ප්‍රධාන සැලකිල්ලක් තිබේ. සත්කාරක රටවල්හි සිටින සංක්‍රමණික සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තම රාජකාරීන් ඉටු කරන විට, තම රටවල්හි පුරවැසියන් සම්බන්ධයෙන් තානාපති සේවාවන්, තානාපති කාර්යාල , කොන්සල් කාර්යාල හා කම්කරු සුබසාධන නිලධාරීන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඉහත තත්ත්වය මත මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ගරු විදේශ සේවා කටයුතු, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යවරුන්ගේ සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති යන අයගේ අවධානය පිණිස පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කර තිබේ.

- රැඳවුම් භාරයේ සිටින සංක්‍රමණිකයන් පිළිබඳ ජාලගත පද්ධති ගොඩනැගීම හා ඔවුන්ගේ සිද්ධි පිළිබඳ තත්ත්වය හා කොන්සල් හෝ තානාපති නියෝජිතයෙකු හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සම්බන්ධ කර ගැනීමට ඇති ඔවුන්ගේ අයිතිය හා පසුවිපරම් පිළිවෙතක් පවත්වා ගැනීමට ඇති අයිතිය පිළිබඳව නිවැරදිව දැනුම්දීම

- නීතිවිරෝධී සංක්‍රමණිකයන් තබා ඇති ආරක්ෂක නිවාස හෝ මධ්‍යස්ථාන වෙත යාම සඳහාත් , නීති ආධාර, සන්නිවේදන හිඩැස් පිරවීම සඳහා වන භාෂා පරිවර්තන සේවා, සමාජීය හා මනෝමය උපකාර ඇතුළු සිය නිදහස අහිමි වී ඇති සංක්‍රමණිකයන් සඳහා වන ආධාර වැඩසටහන් ඇති කොට ඉදිරියට ගෙන යාම සඳහාත් ක්‍රමවත් යාන්ත්‍රණයක් ගොඩ නැගීම.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විශේෂයෙන් ගල්ෆ් කලාප රාජ්‍යයන්ට නුපුහුණු සංක්‍රමණික සේවකයන් වශයෙන් යන්නා වූ ගෘහ සේවිකාවන්ගේ යහපත කලින් කල පරීක්ෂා කිරීම සඳහා කොන්සියුලර් / සුභසාධන නිලධාරීන්ට හැකියාව ඇති කරන ක්‍රමයක් සැලසුම් කළ යුතුය.

- ශ්‍රී ලංකාව සමග සිය සංස්කෘතික සම්බන්ධතා පවත්වාගෙන යාම පිණිස සංක්‍රමණික සේවකයන්ට ඇති අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය කෙරෙන සියළු ක්‍රියාකාරකම් වලට අදාළ කාර්යසාධනය සඳහා ප්‍රමාණවත් සම්පත් කොන්සියුලර් හා කම්කරු සුභසාධන නිලධාරීන් වෙත ලබා දිය යුතුය.

- සංක්‍රමණික කාන්තා සේවිකාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටලු නිරාකරණය සඳහා සාමාන්‍යයෙන් ඔවුන්ට කාන්තා නිලධාරිනියන් සමග සන්නිවේදනය කිරීම පහසු බැවින්, සෑම දූත මෙහෙයුමකදීම සේවය කිරීම සඳහා කාන්තා කම්කරු නිලධාරිනියන් පත් කළ යුතුය.

- අදාළ කොන්සියුලර්/සුභසාධන නිලධාරීන් විදේශ රටවලට පත් කර යැවීමට පෙරාතුව ඔවුන්ට ලබා දෙන පුහුණුවෙහි ප්‍රමාණවත් භාවය තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් වත්මන් පුහුණු වැඩසටහන ඇගයීමට ලක්කළ යුතුය.

- පවතින පුහුණු විෂය මාලාව විශ්ලේෂණය කිරීම සඳහාත් ශ්‍රී ලංකා දූත මෙහෙයුමට සම්බන්ධ කාර්යාංශ නියෝජිතයන් සඳහා විස්තරාත්මක නව පුහුණු අත් පොතක් කෙටුම්පත් කිරීම සඳහාත් ප්‍රවීණ උපදේශක වරයෙකුගේ සේවාව ලබා ගැනීම

ශ්‍රමය ලබා ගන්නා වූ රටවල් වලට අයත් සියලුම රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙයුම් වලදී ක්‍රියාකාරී යාන්ත්‍රණය ලෙස ඉහත මිණුම් දඬු යොදා ගත යුතු බවට කොමිෂන් සභාව දැඩිව සිටී.

මෙම අංශයේ සංක්‍රමණික ගැටළු පිළිබඳව අලුතින් පිහිටුවන ලද කේන්ද්‍රස්ථානය හරහා මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කෙරේ.

### 2.2.6. ජෝර්දාන රාජ්‍යයේ අමාන් නගරයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ යළි පැමිණීමට පිළිසරණක් නොමැතිව රැඳී සිටින ගෘහස්ථ සේවකයින්ට සැලකීම පිළිබඳව සැලකිලිමත් වීම

ජෝර්දානයේ අමාන් නගරයේ සිට මෑතකදී පැමිණි සංක්‍රමණික සේවකයෙකු පැවසුයේ 200කට අධික ගෘහස්ථ සේවක පිරිසක් යළි පැමිණීමට පිළිසරණක් නොමැතිව ජෝර්දානයේ තානාපති කාර්යාලයට අයත් ආරක්ෂක නිවසේ ජීවත් වෙමින් සිටින බවයි. එසේම ඔවුන්ගෙන් බහුතරයක් සිය පූර්ව සේවායෝජකයන් විසින් අපයෝජනයට ලක් වී තිබෙන අතර ඉතාමත් අපහසුවෙන් දඩ මුදල් ගෙවා ඇති බවත් යළි මව්බිමට පැමිණීමට කැමැත්තෙන් සිටින බවත් පැවසීය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා මේ පිළිබඳ වාර්තාවක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයාගෙන් ඉල්ලා තිබේ. කොමිෂන් සභාව මෙම තොරතුරෙහි සත්‍යතාවය ජෝර්දාන මානව හිමිකම් කොමිෂන් සභාවෙන් තහවුරු කරගැනීම සඳහා පියවර ගෙන ඇති අතර මෙකී කාරණාව පිළිබඳව ඔවුන්ගේ මැදිහත්වීම ලබාගැනීමට උත්සාහ දරා ඇත. ගෘහස්ථ සේවකයින්ට සිදුවී ඇති පීඩාකාරී ක්‍රියාවන් ගණනාවක් වාර්තා වී ඇති බැවින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ගෘහස්ථ සේවකයින්ට අයත් අනාගත සේවායෝජකයින් කෙරෙහි නිශ්චිත කොන්දේසි එනම්, එක් එක් සේවකයා වෙනුවෙන් විදේශ සේවායෝජකයා විසින් ඇමෙරිකානු ඩොලර් 1000 ක තැන්පතුවක් සිදු කළ යුතුවීම හා ජෝර්දානය, සවුදි අරාබිය වැනි ගල්ෆ් රටවල් කිහිපයකට අදාළ විදේශ රැකියා සඳහා වන අවම වයස් සීමාව අවුරුදු 25 දක්වා වැඩි කර තිබීම යනාදිය පනවා තිබේ.

### 2.2.7. විදේශ ජාතිකයන්ගේ රැඳවුම් මධ්‍යස්ථානය, මිරිහාන යන නාමය යටතේ මිරිහාන විදේශික රැඳවුම් නිවාසය යළි විවෘත කිරීම

ඉහත රැඳවුම් මධ්‍යස්ථානය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

i) එහි පවත්නා තත්ත්වය සැලකිල්ලට ගනිමින් මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට රැගෙන යාම, එසේ කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීතාවයට ගරුකිරීම එසේම, ආබාධිත තාවයන් සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම කළයුතුය.

ii) ආගමන විගමන පාලක විසින් මධ්‍යස්ථානය එලදායී අයුරින් හැසිරවීම පිණිස අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කිරීම.

iii) අදාළ රටවල්හි තානාපති කාර්යාල / මහ කොමසාරිස් කාර්යාල / කොන්සියුලර් කාර්යාල සමග සම්බන්ධිකරණය කර රැඳවියන් ආපසු හරවා එවීමේ ක්‍රියාදාමයට පහසුකම් සැපයීම.

iv) එවන් රැඳවියන් පිළිබඳ දත්ත සමුදායක් එකතු කොට පවත්වාගෙන යාම.

v) ආයතනික අනන්‍යතාවය යළි නම් කිරීම.

vi) පවතින ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම. එසේම, රැඳවියන් තාවකාලික ස්ථානයකට හෝ මිනුවන්ගොඩ යෝජිත ස්ථිර ගොඩනැගිල්ල වෙත රැගෙන යන තුරු මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානයේ රැඳවුම් තත්ත්වය ඉහළ දැමීම. එවන් ප්‍රතිසංස්කරණයක් සඳහා අවශ්‍ය මූල්‍යාධාර සැපයීමට ජාත්‍යන්තර සංක්‍රමණික ආයතනය (IOM) සිය කැමැත්ත ප්‍රකාශ කර තිබේ.

කොමිෂන් සභාව විසින් කරන ලද මුල පිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, අදාළ නිවාසය අලුත්වැඩියා කර ඇති අතර එහි නාමය විදේශීය ජාතිකයන්ගේ රැඳවුම් මධ්‍යස්ථානය ලෙස යළි නම් කොට තිබේ. මධ්‍යස්ථානයේ සිටින පුද්ගලයින්ගේ රැඳවුම් තත්ත්වයන්ද සැලකිය යුතු මට්ටමකින් දියුණු කර තිබේ.

### 2.2.8 අවසාන නිගමනය

කොමිෂන් සභාව UPR වෙත වාර්තාවක් ඉදිරිපත් කළ ප්‍රථම අවස්ථාව මෙය වන බැවින් මෙම අංශයට අයත් වැඩ කටයුතු වල මං සලකුණු සහිත ජයග්‍රහණයක් ලෙස 2012 අප්‍රේල් මස UPR වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් යවන ලද ලිඛිත දේශනය දැකිය හැකිය. මීළඟ වසර තුළදී සංක්‍රමණික සේවකයින්ගේ ආරක්ෂාව සඳහා ශ්‍රම සංක්‍රමණය පිළිබඳව අදාළ අමාත්‍යාංශ වෙත මාර්ගෝපදේශ ඉදිරිපත් කරමින් සිදුකරන ලද කාර්ය භාරය නිතර අපගේ මාධ්‍යයන්හි පෙන්නුම් කරන අපගේ සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන පීඩාකාරී තත්ත්වයන්ට අදාළ අධීක්ෂණ අංශයේ පරීක්ෂාකාරී බව පෙන්නුම් කරයි. මේවා සහ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු හා බන්ධනාගාර ගැටලු පිළිබඳ උපදෙස් සාකච්ඡා යනාදී සියල්ල 2012 වසරේදී මෙම අංශය ලද ජයග්‍රහණ වේ.

## 2.3 අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය

ළමා අයිතිවාසිකම්, සංක්‍රමණික සේවක අයිතිවාසිකම්, මිනිස් ජාවාරම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හා වැඩිහිටි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වැනි මානව හිමිකම් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරමින් පසුගිය වසර වල මෙන් මෙම අංශය විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. අංශයට අදාළ වාර්තාවෙහි අවසානයේ කොමිෂන් සභාවට පවරා ඇති බලය ක්‍රියාත්මක කිරීමේදී ක්‍රමික පදනමක් මත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල කෙටි විස්තරයක් සාරාංශගත ආකාරයෙන් දී ඇති අතර වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැදගත් වැඩසටහන් කිහිපයක් පහත කෙටියෙන් විස්තර කර තිබේ.

### 2.3.1 පොලිස් නිලධාරීන් සඳහා වන පුහුණුකරුවන් පුහුණු කරවීමේ (TOT) වැඩසටහන

ගම්පහ ප්‍රජා ආරක්ෂණ පුහුණු මධ්‍යස්ථානයේදී රටේ විවිධ ප්‍රදේශ නියෝජනය කරන ලද පොලිස් නිලධාරීන් 31 දෙනෙකුට (ස්ත්‍රී 6, පුරුෂ 25) මිනිස් ජාවාරම වැළැක්වීම, ප්‍රජා ආරක්ෂණ ක්‍රමවේදය, මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ කාන්තාවන්, දරුවන් හා වැඩිහිටියන් වැනි විපතට පත් විය හැකි කණ්ඩායම් හි අයිතිවාසිකම් වැනි ක්ෂේත්‍ර පිළිබඳව දින 5 ක පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

### 2.3.2 ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

I. අධීක්ෂණය හා වාර්තාකරණය පිළිබඳ රටේ කාර්ය බලකාය අහෝසිකිරීම හා ප්‍රකාරතාවන් ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් රජයේ හවුල්කරුවන් සමග සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ ජ්‍යෙෂ්ඨ නියෝජිතගේ ළමා හා ආයුධ සන්නද්ධ ගැටුම් පිළිබඳ වැඩසටහන් නිලධාරී ලංකාවට පැමිණියේය. මෙකී සංචාරයට එක් වී සිටි තාක්ෂණික කාණ්ඩායම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡාවක්ද පැවැත්වීය.

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් කිහිපයක ශ්‍රී ලංකා හමුදාව පදිංචි වී සිටීම කණ්ඩායම සැලකිල්ල යොමු කළ එක් කරුණක් විය. ඔවුන්ගේ සංචාරයෙන් පසු කිලි / විග්නේෂ්වර විද්‍යාලය, පුනරින්, කිලිනොච්චි හි හමුදාව රැඳී සිටීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දී තිබුණි. ආරක්ෂක මණ්ඩලයේ යෝජනා 1612 හා 1882 අනුව — ශ්‍රී ලංකාවේ ආයුධ සටන්හි නිරත ළමුන්— පිළිබඳ මහලේකම්වරයාගේ හතරවැනි වාර්තාව මගින් 2012 දෙසැම්බර් මසදී ශ්‍රී ලංකාව නින්දාව පිළිබඳ ලැයිස්තුවෙන් ඉවත් කෙරිණි. මහලේකම්වරයා ගැටුම් කලාපයන්හි සිටි ළමුන්ගේ තත්ත්වය පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබා දෙමින් ඔහුගේ වාර්ෂික වාර්තාව ආරක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර ඔවුන්ගේ ආරක්ෂාව සඳහා පියවර ගැනුණි.

II. යුනිසෙෆ් ආයතනය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අරමුදල් සපයන ලද වැඩසටහනක් වූ —ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ වාර්තා කිරීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රජාවන්ගේ විශ්වාසය වර්ධනය කිරීම— කිලිනොච්චියේදී පවත්වන ලද අවස්ථාවේදීද වැඩසටහනට සහභාගී වූවන් කිලි / විග්නේෂ්වරා විද්‍යාලය, පුනරින් කිලිනොච්චිය හි හමුදාව රැඳී සිටීම පිළිබඳ ඉහත ප්‍රශ්නයම මතුකරමින් ඒ සම්බන්ධයෙන් උචිත පියවර ගන්නා මෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් මේ පිළිබඳව බ්‍රිගේඩියර් ආර්. පී.යූ.එස්.පී. රාජපතිරණ, වෙත ලිඛිතව දැනුම් දෙන ලෙසට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය ප්‍රාදේශීය සම්බන්ධීකාරක කනගරාජා මහතාට උපදෙස් දෙන ලදී. 2012 ජූලි මස කිලිනොච්චි ආරක්ෂක බලකා මූලස්ථානය, අදාළ මූලස්ථානය වෙනත් ස්ථානයකට ගෙන යෑම සඳහාත් පාසල යළි විවෘත කිරීම සඳහාත් ක්ෂණික පියවර ගන්නා බව දැනුම් දුන් අතර ඒ සඳහා සුළු කාලයක් ගත විය හැකි බවටත් දැනුම් දී තිබුණි. එසේම, හමුදා කඳවුර ස්ථාපිත කිරීමට නියමිත නව ගොඩනැගිල්ලේ කටයුතු සම්පූර්ණ වන තුරු ශිෂ්‍යයින්ට පුනරින් මහා විද්‍යාලයට යාම සඳහා වන ප්‍රවාහන පහසුකම් සූදානම් කර දෙන ලදී.

### 2.3.3 වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ජාතික උපදෙස් සාකච්ඡාව

ශ්‍රී ලංකාවට වියපත්වීම පිළිබඳ විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායම වෙත යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වීම සඳහා රටේ වියපත් භාවයට පත්වෙමින් සිටින ජනතාව මුහුණ දෙන ගැටළු සාකච්ඡා කිරීම පිණිස 2012 ජූනි මස 4 සිට 6 දක්වා ජාතික උපදෙස් සාකච්ඡාවක්

සංවිධානය කෙරුණි. මැඩ්රිඩ් ක්‍රියාකාරී සැලසුම, රාජ්‍ය අංශයේ හා රාජ්‍ය නොවන අංශයේ වැඩිහිටියන් සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලයන්, මානව හිමිකම් ගැටලු පිළිබඳ ප්‍රසිද්ධ අධිකාරීන් යනාදිය මත සාකච්ඡාව පදනම් විය. මහාචාර්ය සාවිත්‍රි ගුණසේකර මහත්මිය සමුළුව ඇමතුවාය. ශීර්ෂයන් පහක් තෝරාගැණුනු අතර එක් එක් ශීර්ෂය යටතේ නිශ්චිත ක්ෂේත්‍රයන් පිළිබඳව සාකච්ඡා කොට සුදුසු නිර්දේශ සකස් කෙරිණ. අවසානයේදී මෙකී නිර්දේශ විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායම වෙත ඉදිරිපත් කෙරිණි. තෝරාගත් ශීර්ෂයන් පහ සහ එක් එක් ශීර්ෂය යටතේ සාකච්ඡා කළ සමහර ක්ෂේත්‍රයන් කෙටියෙන් පහත දක්වා තිබේ.

A) සාමාන්‍ය සෞඛ්‍යය හා මානසික සෞඛ්‍යය
- i) ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය
- ii) උපදේශනය, අපකීර්තීන් අවම කිරීම හා ජංගම සෞඛ්‍ය සේවා
- iii) රෝග සඳහා වන ජාතික මට්ටමේ නිවාරණය

B) සමාජ ආරක්ෂාව හා සමාජ සුබසාධනය
- i) වැඩිහිටියන් සඳහා 3%ක් රැකියා වෙන් කිරීම
- ii) ප්‍රවාහනය සඳහා සහන ගාස්තු
- iii) වැඩිහිටියන්ට කාන්තා හා ළමා කාර්යාංශය හරහා පොලිස් ස්ථාන තුළට ප්‍රවේශයන් ලබාගත හැකි වීම
- iv) දෙමාපිය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සඳහා දරුවන් දායක වීම

C) ගැටුම් හා විනාශකාරී අවස්ථා / අධ්‍යාපනය, උපදේශනය හා සන්නිවේදනය
- i) වැඩිහිටියන් ඔවුන්ගේ අයිතීන් සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම
- ii) වෙන් වූ අන්තර්ජාල හා පුස්තකාල පහසුකම්
- iii) මාධ්‍යය සඳහා කාලය වෙන් කිරීම

D) ප්‍රතිපත්තිය, නෛතික හා ආයතනික රාමුව
- i) සියළු දෙනාටම ජාතික විශ්‍රාම වැටුප් හා වර්තමානයේ ගෙවනු ලබන 1000/- දීමනාව වැඩි කිරීම
- ii) විශ්‍රාම ගැනීමේ වයස 65 දක්වා වැඩි කිරීම

විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායම වෙත යවන ලද නිර්දේශ ඇමුණුම් 11 හි දක්වා ඇත.

### 2.3.4 ආගම හා මානව හිමිකම්

මෑතකාලීන වසර වල සිට රටේ වර්ධනය වෙමින් පවතින ආගමික නොසන්සුන්තාවය කොමිෂන් සභාවේ අවධානය යොමුවී තිබෙන කරුණකි. සමාලෝචන වර්ෂය තුළ ආගමික නායකයින් සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා මානව හිමිකම් පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කොමිෂන් සභාව තීරණයක් ගත් අතර එකී දැනුම්වත් කිරීම තුළින් රටේ ආගමික නොසන්සුන්තාවය තුරන් කිරීමට අපේක්ෂා කෙරිණි. එහි ප්‍රථම පියවර වශයෙන් කොමිෂන් සභාව මානව හිමිකම් හා ආගම යන තේමාව යටතේ කාර්ය මණ්ඩලය සඳහා විශේෂ දේශන මාලාවක් සංවිධානය කළ අතර ඒ තුළින් ජනතාව ආගමික සහජීවනය පිළිබඳ දැනුවත් කිරීම අපේක්ෂා කෙරිණ.

i) හින්දු ආගම - හින්දු ආගම හා සම්බන්ධ මූලධර්ම හා ශ්‍රී ලංකා සමාජය කෙරෙහි එහි අදාළත්වය

- විනිසුරු සී. වී. විග්නේෂ්වරන් මහතා විසිනි.

ii) බෞද්ධ ආගම - බෞද්ධ ආගම හා සම්බන්ධ මූලධර්ම හා ශ්‍රී ලංකා සමාජය කෙරෙහි එහි අදාළත්වය

- රාජා කුරුප්පු මහතා විසිනි.

iii) ක්‍රිස්තියානි ආගම - ක්‍රිස්තියානි ආගම හා සම්බන්ධ මූලධර්ම හා ශ්‍රී ලංකා සමාජය කෙරෙහි එහි අදාළත්වය

- පූජ්‍ය වෙස්ලි ඇලෙක්සැන්ඩර් පියතුමා විසිනි.

කතෝලික ආගම හා සම්බන්ධ මූලධර්ම හා ශ්‍රී ලංකා සමාජය කෙරෙහි එහි අදාළත්වය

iv) ඉස්ලාම් ආගම - ඉස්ලාම් ආගම හා සම්බන්ධ මූලධර්ම හා ශ්‍රී ලංකා සමාජය කෙරෙහි එහි අදාළත්වය

- ජෙසීමා ඉස්මයිල් මහත්මිය, කොමසාරිස් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

### 2.3.5 විවිධ නොහැකියාවන් සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශයක් ලබාගැනීම පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව

මෙම අංශය නොහැකියාවන් සහිත පුද්ගලයින් සඳහා ඇති ප්‍රවේශයන් පිළිබඳව වාර්තාවන්නා වූ වර්ධනය වෙමින් පවතින සිද්ධීන් පිළිබඳව සැලකිලිමත් වූ අතර විවිධ නොහැකියාවන් සහිත පුද්ගලයන් සඳහා වන ප්‍රවේශයන් සඳහා ඇති අයිතිය යන තේමාව යටතේ මාධ්‍ය සාකච්ඡාවක් ද සංවිධානය කළේය. නොහැකියාවන් සහිත පුද්ගලයින්ට නිදහසේ ගමන් කිරීමට ඇති අයිතිය පිළිබඳව සමාජය දැනුම්වත් කිරීම හා එවන් පුද්ගලයින්ට ප්‍රජාව තුළ නිදහසේ හැසිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලසීම පිණිස සියලුම පාර්ශ්වකරුවන්ට ඇති වගකීම පිළිබඳව දැනුම්වත් කිරීම මෙම සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ විය. 'ඉදිරිය' ආයතනයේ ප්‍රධාන විධායක / මහ ලේකම්, ආචාර්ය අජිත් පෙරේරා SLFRR 221/2009 අංකයෙන් යුත් 2009 අප්‍රේල් මස ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ගෙනහැර දක්වමින් සඳහන් කරනු ලැබුයේ, ජනතාවගේ ආරක්ෂාව හා යහපත වර්ධනය කරන හා ජීවිත තත්ත්වය සැලකිය යුතු අන්දමින් දියුණු කරන පරමතම ජනතා යහපත පිළිබඳ හදිසි ජාතික ගැටළුවකදී අර්ථාන්විත ශක්ති සම්පන්න විසඳුමක් බවට මෙකී නියෝගයේ ක්‍රියාත්මක භාවය පත්වන බවට විශ්වාස කෙරුණු බවයි. ඔහු වැඩිදුරටත් සඳහන් කරනු ලැබුයේ ඉහත නියෝගයට වසරක් ගත වී ඇතත් බොහෝ උල්ලංඝනය වීම් සිදුව ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අර්ථවත් පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බවත්ය.

### 2.3.6 විමර්ශනය පිළිබඳ APF පුහුණු අත්පොත

ආසියානු ශාන්තිකර සංසදය තොරතුරු, ප්‍රලේඛනය හා විශේෂඥ උපදෙස් ඉදිරිපත් කිරීම මගින් විමර්ශන පුහුණු අත්පොතක් සම්පාදනය කිරීම සඳහා දායක වන ලෙස ලෝක ව්‍යාප්ත ආයතන ගණනාවකට ආරාධනා කළේය. ඉහත ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එහි යෙදවුම් ප්‍රධාන වශයෙන් පහත කරුණු සම්බන්ධයෙන් සැපයීය.

i. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවීමේ පසුබිම හා එහි විමර්ශන ක්‍රමවේදය
ii. ලබා දෙන ලද ප්‍රශ්නාවලී සඳහා විස්තර සපයන ලදී.

අත්දැකීම් බහුල විමර්ශකයෙකු වූද, විමර්ශන පිළිබඳ පුහුණුකරුවෙකු වූද, විවිධ වර්ගයේ විමර්ශන පැවැත්වීම පිළිබඳ වසර 10කට වඩා අත්දැකීම් සහිත පුද්ගලයෙකු වූද ගැරත් ජෝන්ස් මහතා විසින් අත්පොත සම්පාදනය කර තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයේ යහපත උදෙසා වැඩසටහන් කිහිපයක් පසුව පැවැත්වීම සඳහා ඔහුට ආරාධනා කිරීමට යෝජනා කරයි.

අධ්‍යාපන හා විශේෂ වැඩසටහන් අංශය විසින් සංවිධානය කෙරුනු මානව හිමිකම් වැඩසටහන්

| වැඩසටහන් වර්ගය | තේමාව | වැඩ සටහන් සංඛ්‍යාව |
|---|---|---|
| **මානව හිමිකම් පිළිබඳ දැනුම්වත් කිරීම** | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 01 |
| **සාකච්ඡා** | වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාතික ප්‍රඥප්තිය | 01 |
| **සාකච්ඡා - මාධ්‍ය** | ප්‍රවේශයන් සඳහා අයිතිය | 01 |
| **සැමරීම්** | ලෝක විනීත දිනය<br>ලෝක වැඩිහිටි දිනය<br>ජාත්‍යන්තර මානව හිමිකම් දිනය | 03 |
| **පුහුණුවීම්** | සමථකරණය | 01 |
| **රැස්වීම්** | | 01 |
| **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා විශේෂ දේශනා** | උපදේශන<br>ආගම හා මානව හිමිකම්<br>වැඩිහිටි අයිතිවාසිකම්<br>මානව හිමිකම් දිනාගැනීම සඳහා<br>ආත්මයට අභියෝග කිරීම<br>ළමා අයිතිවාසිකම් | 09 |
| | **එකතුව** | **17** |

මානව හිමිකම් පිළිබඳ වැඩසටහන් 26ක සම්පත්දායකයන් වශයෙන් සහභාගි වන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල නිලධාරීන් සහභාගී වී ඇත.

### 2.3.7 අවසාන නිගමනය

මානව හිමිකම් පිළිබඳ ප්‍රතිමාන හා ප්‍රමිතීන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා මෙම අංශය විසින් වැඩසටහන් දිගටම පවත්වාගෙන යනු ලැබේ. පසුගිය වසර කිහිපය තුළ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම්, ප්‍රජාව තුළ ඔවුන් නිදහසේ හැසිරීම හා ජීවිතය සතුටින් ගත කිරීම සම්බන්ධයෙන් මෙම අංශය අවධානය යොමු කර තිබුණි. ශ්‍රී ලංකාව වේගයෙන් වර්ධනය වන වියපත් ජනතාවක් සිටින රටක් වී තිබීම අවධානය යොමු කළ යුතු තවත් ක්ෂේත්‍රයක් වී තිබීමෙන් මෙම වසරේදී මෙම අංශය වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාවක් පවත්වන ලදී. සාකච්ඡාව අවසානයේදී එහි නිර්දේශ වියපත් වීම පිළිබඳ විවෘතාශ්‍ර ක්‍රියාකාරී කමිටුව වෙත යවන ලදී. මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනයක් තමන්ට ලබා දෙන ලෙසට වෙනත් ආයතන ඉල්ලා සිටින විටෙක අංශය විසින් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සම්පත් දායකයින් වශයෙන් යවනු ලැබේ.

## 2.4 පරිපාලන හා මූල්‍ය අංශය

### 2.4.1 පරිපාලන අංශය

2012 වසර පසුගිය වසර මෙන් සුපුරුදු මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විතව ආරම්භ වූ අතර මණ්ඩල සාමාජිකයන් නාමික වශයෙන් විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා සභාපතිවරයා වශයෙන්ද, ජෙසීමා ඉස්මයිල් මිය, ටී. ඊ. ආනන්දරාජා මහතා, ආචාර්ය බර්නාඩ් ද සොයිසා හා ආනන්ද මෙන්ඩිස් මහතා කොමසාරිස්වරුන් වශයෙන්ද විය. කෙසේ වෙතත්, පෙබරවාරි මස 1 දින ආනන්ද මෙන්ඩිස් මහතා ඉල්ලා අස්වූ අතර 2012 පෙබරවාරි 13 දින ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා එකී පුරප්පාඩුව පිරවීම සඳහා පත් කරනු ලැබීය. 2012 මැයි 02 දින පරීක්ෂණ හා විමර්ශන අධ්‍යක්ෂිකා වශයෙන් කටයුතු කරමින් සිටි සමන්ති ජයමාන්න පරණගම මහත්මිය කොමිෂන් සභාවේ දීර්ඝ කාලයක් පුරප්පාඩු වී පැවති කොමිෂන් සභාවේ ලේකම් තනතුරට පත් කරනු ලැබීය. පරීක්ෂණ හා විමර්ශන අධ්‍යක්ෂ තනතුර හා පරිපාලන හා මූල්‍ය අධ්‍යක්ෂක යන තනතුරු පුරවා නොමැති වුවද කොමිෂන් සභාව නිලධාරීන් දෙදෙනෙකු එකී අංශ සඳහා වැඩ බැලීමට හා පත් කර ඇති අතර ඔවුන්ගේ අධීක්ෂණය යටතේ අදාළ අංශයන්හි කටයුතු සිදුවෙමින් පවතී.

කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය අංක 165, කින්සි පාර, කොළඹ 08 යන පරිශ්‍රයට ගෙන යාමෙන් පසු වෙනස් වූ හැකියාවන් සහිත පුද්ගලයින් සිතෙහි තබාගනිමින් පරීක්ෂණ හා විමර්ශන අංශයට අධික ඉඩ ප්‍රමාණයක් වෙන් කිරීමට හැකි වී තිබේ. ඒ අනුව විවිධ අරමුණු සඳහා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන අය සඳහා වඩාත් හොඳ පහසුකම් සැපයීමටද හැකි වී තිබේ.

සමාලෝචන වසර තුළදී මානව හිමිකම් කොමිෂන් සභා සේවකයින්ගේ වැටුප් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2010 ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ඇතිකිරීම සඳහා වන මූලික සාකච්ඡාද මෙම වසරේදී සිදුවිය.

කාර්ය මණ්ඩල නිලධාරීන් විසින් ඉටු කළ යුතුව ඇති පුළුල් පරාසයක විහිදුනු කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වෘත්තිය දැනුම හා කුසලතාවන් වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ට පුහුණුවීම් ලබාදීම නිතර අවශ්‍ය වේ. කාර්ය මණ්ඩලය සඳහා වන දේශීය හා විදේශීය පුහුණුවීම් වසර තුළදී ලබා දී තිබේ. (ඇමුණුම් 111 හා IV බලන්න)

පැමිණීම පිළිබඳ වඩාත් සාර්ථක කළමනාකරණයක් සඳහාත් නියමිත වේලාවට සේවයට පැමිණීම හා පිටවීම පිළිපැදීම සඳහාත් පරිගණකගත පැමිණීම් සටහන් හා ඇඟිලි සලකුණු සටහන් පද්ධතියක් ප්‍රධාන කාර්යාලයේ සවි කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය සාර්ථක වී ඇති අතර කාර්යාලයේ පරිපාලන කටයුතු කාර්යක්ෂම වී ඇත.

වසර තුළදී පිළිවෙලින් කිලිනොච්චිය හා පුත්තලම යන ස්ථානවල ජංගම කාර්යාල විවෘත කර ඇති බැවින් යාපනය, අනුරාධපුරය වැනි ප්‍රාදේශීය කාර්යාලවලට හෝ කොළඹ ප්‍රධාන කාර්යාලය වැනි දුරබැහැර ප්‍රදේශවලට යාමට සිදුවීමෙන් අපහසුතාවයන්ට මුහුණ දුන් එකී ප්‍රදේශයන්ට අයත් ජනතාවගේ අපහසුතාවයන් අවම වනු ඇත.

වැටුප් හා සේවක මණ්ඩල කොමිසම වෙත ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට බඳවාගන්නා කාර්ය මණ්ඩල සඳහා වන යෝජනාවක් සකස් කිරීමට පියවර ගැනෙමින් පවතී.

මුදල් රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වත්කම් පරීක්ෂා කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කොට තිබේ.

## 2.4.2 මුල්‍ය අංශය

### 2012 වර්ෂය සඳහා විසර්ජන ගිණුම

| | මුදල (ලංකා රුපියල්) |
|---|---|
| රජයේ දායකත්වය | |
| පුනරාවර්තන | 137,500,000.00 |
| ප්‍රාග්ධන | 1,940,000.00 |
| විදේශ ප්‍රදාන (UNFPA) | 535,254.00 |
| අනෙකුත් ලැබීම් | 246,375.93 |
| මුළු ආදායම | **140,221,629.93** |
| පුද්ගලික පඩිනඩි | 80,805,000.00 |
| ගමන් වියදම් | 996,078.02 |
| සැපයුම් | 5,266,708.21 |
| නඩත්තු වියදම් | 2,358,517.40 |
| සේවා | 48,120,072.30 |
| මාරු කිරීම් | 200,000.00 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 214,829.13 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 1,234,249.32 |
| ධාරිතා වර්ධනය | 200,000.00 |
| වෙනත් ප්‍රාග්ධන වියදම් (UNFPA ව්‍යාපෘති ක්‍රියාකාරකම්) | 535,254.00 |
| මුළු වියදම් | **139,930,708.38** |

## තුන්වැනි පරිච්ඡේදය

# ප්‍රාදේශීය කාර්යාල

කොමිෂන් සභාව විසින් පිහිටුවන ලද ප්‍රාදේශීය කාර්යාල දහයක් පවතින අතර ඒවා ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් විසින් මෙහෙයවනු ලැබේ. මෙම කාර්යාලයන්හි සිටින උපකාරක කාර්ය මණ්ඩලයට විමර්ශන නිලධාරීන් හා අනෙකුත් කාර්ය මණ්ඩලය ඇතුළත් වේ. 2012 වසරේදී පිලිවෙලින් කිලිනොච්චි හා පුත්තලම යන ස්ථානයන්හි ජංගම කාර්යාල දෙකක් විවෘත කරන ලදී. කිලිනොච්චි ජංගම කාර්යාලය යාපනය ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරයා විසින් පරීක්ෂා කෙරේ. පුත්තලම ජංගම කාර්යාලය 2012 දෙසැම්බර් මස විවෘත කළ අතර වයඹ පළාත් ජනතාවට සේවය කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලයක් එහි නොමැති බැවින් වර්තමානයේ එහි කටයුතු ප්‍රධාන කාර්යාලයට අයත් විමර්ශන නිලධාරියෙකු විසින් පරීක්ෂා කෙරේ. කාලයක සිට උප කාර්යාලයක් නුවරඑළියෙහි ක්‍රියාත්මක වෙමින් තිබෙන අතර පැමිණිලි ලබාගැනීම සඳහා මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරියෙකු සෑම බදාදා දිනකම එම කාර්යාලයට පැමිණේ. මෙකී කාර්යාල තුන නුදුරු අනාගතයේදී ස්ථිර කාර්යාල බවට පත් කිරීමට අපෙක්ෂා කෙරේ. 2012 වසරේදි. එක් එක් කාර්යාලය විසින් ඉටු කරන ලද කාර්යයන්හි කෙටි සාරාංශයක් පහත දැක්වේ.

### 3.1 අම්පාර ප්‍රාදේශීය කාර්යාලය

අම්පාර කාර්යාලය වෙත ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 139 ක් වන අතර බලපැවරුම තුළට පැමිණෙන ඒවායින් 07 ක් වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන්ද, 03 ක් අඩන්තේට්ටම් කිරීම සම්බන්ධයෙන්ද, 05 ක් අත්තනෝමතික ලෙස අත් අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන්ද, 26 රැකියා සම්බන්ධයෙන්ද, 32 අධ්‍යාපනය සම්බන්ධයෙන්ද හා 60 රජයේ අකර්මන්‍ය බව සම්බන්ධයෙන්ද විය. අනෙක් ඒවා වෙනත් බලධාරීන්ට එරෙහිව වූ ඒවා වේ. වසර තුළ පසුගිය වසරේ නොවිසඳුලන ඒවාද ඇතුළුව කාර්යාලය සිද්ධි 161 ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කළේය.

**පැමිණිලි වර්ගීකරණය - අම්පාර**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 07 |
| | අඩන්තේට්ටම් කිරීම | 03 |
| | අත් අඩංගුවට ගැනීම / රඳවා ගැනීම් | 05 |
| රැකියා | | 26 |
| අධ්‍යාපන | | 32 |
| අකර්මන්‍ය බව | | 60 |
| වෙනත් | | 06 |

පොලිස් ස්ථාන හා බන්ධනාගාර මැදිරි වෙත නිල පිරික්සුම් 104 ක් කෙරුණි. සමාලෝචන වසරේදී නිලධාරීහු රැඳවියන් 84 දෙනෙක් බැලීමට ගියහ.

මෙම කාර්යාලය විසින් ශිෂ්‍යයින්, ගුරුවරුන් පොලිස් නිලධාරීන්, රජයේ නිලධාරීන් හා සිවිල් සමාජ සාමාජිකයන් ඉලක්ක කරගනිමින් ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, වධහිංසා, මිනිස් ජාවාරම, වැඩිහිටි අයිතිවාසිකම් වැනි විවිධ මානව හිමිකම් ක්ෂේත්‍ර පිළිබඳව වැඩමුළු 14 ක් ද දැනුවත් කිරීමේ වැඩසටහන් 28 ක් ද මෙහෙයවන ලදී.

වර්ෂය තුළ උපදෙස් ලබාගැනීම සඳහා පුද්ගලයන් 906 දෙනෙකු කාර්යාලය වෙත පැමිණියහ.

## 3.2 අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය

අනුරාධපුර කාර්යාලය වෙත වර්ෂය තුළදී පැමිණිලි 748 ලැබුණි. වර්ෂය ආරම්භයේදී අවශ්‍ය කටයුතු කළ යුතු පැමිණිලි 395 ක් ඉතිරිව පැවතුණි. වධහිංසා පිළිබඳ පැමිණිලි 40 ක් ද අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් පිළිබඳව 63 ක් ද, අඩන්තේට්ටම් පිළිබඳව 50 ක් ද අතුරුදහන් වු පුද්ගලයින් පිළිබඳ පැමිණිලි 02 ක් ද, අත් අඩංගුවේදී මිය යෑම් පිළිබඳ 01 ක් ද, රජයේ අකර්මන්‍ය බව පිළිබඳ 165 ක් ද, සහ ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහිවද විය. වර්ෂය තුළදී නිර්දේශ සඳහා වු සිද්ධි 20 ක්ද වැඩිදුර විභාගය සඳහා ප්‍රධාන කාර්යාලයට යැවු සිද්ධි 115 ක් සමග සිද්ධි 722ක කටයුතු අවසන් කිරීමට කාර්යාලයට හැකි විය. ඉදිරි වර්ෂයට ගෙන යාම සඳහා සිද්ධි 421 ක් ඉතිරි විය.

**පැමිණිලි වර්ගීකරණය - අනුරාධපුර**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 40 |
| | අඩන්තේට්ටම් | 50 |
| | අත් අඩංගුවට ගැනිම් / රඳවා තැබීම් | 63 |
| | අතුරුදහන් වීම් / ආගිය අතක් නොමැතිවීම් | 02 |
| රැකියා | | 115 |
| අකර්මන්‍ය බව | | 165 |
| අධ්‍යාපනය | | 74 |
| දේපල හා උපයෝගිතා | | 198 |
| රජයේ සුභසාධන | | 08 |
| අත් අඩංගුවේදී මිය යාම් | | 01 |
| වෙනත් | | 03 |

මෙම කාර්යාලය පොලිස් ස්ථාන වෙත නිල පිරික්සුම් 144 ක් ද, පුනරුත්ථාපන මධ්‍යස්ථාන 02 කද යෙදුණි. එසේම කාර්යාලය පොලිසිය, යුධ හමුදාව, රජයේ නිලධාරීන් හා සමාජය ඉලක්ක කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 19 ක් මෙහෙයවු අතර එයට 1580කට අධික පුද්ගලයින් සංඛ්‍යාවක් සහභාගි වුහ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සාමාජිකයන් 64 දෙනෙකු සඳහා වු වැඩිහිටි අයිතිවාසිකම් හා ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ විශේෂ වැඩසටහනක් සමග මානව හිමිකම් දිනය සමරන ලදී.

## 3.3 බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය

මෙම වර්ෂය තුළදී බදුල්ල කාර්යාලය වෙත පැමිණිලි 326 ක් ලැබුණි. වධහිංසා හා සම්බන්ධ පැමිණිලි 01 ක් පමණක් වූ අතර පහරදීම් 07 ක්ද, අඩන්තේට්ටම් 28 ක්ද, අත් අඩංගුවට ගැනීම් හා රඳවාතැබීම් 11 ක් ද ලැබුණු අතර, ආගිය අතක් නොමැති වීම් පිළිබඳ පැමිණිලි කිසිවක් නොලැබුණි. රජයේ අකර්මන්‍ය වීම් පිළිබඳව 50 ක් ද, දේපල හා උපයෝගිතා පිළිබඳ 59 ක් ද, රැකියා හා අධ්‍යාපන සම්බන්ධ පැමිණිලි පිලිවෙලින් 87 ක් හා 18 ක් ද ලැබී තිබුණි. ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහි වූ ඒවා වේ. පැමිණිලි 19 ක් බලපැවරුම් සීමාවට ඇතුලත් නොවූ ඒවා විය. සිද්ධි 204 ක කටයුතු අවසන් කිරීමට කාර්යාලයට හැකි විය. නිර්දේශ සඳහා සිද්ධි 08 ක් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කෙරිණ.

**පැමිණිලි වර්ගීකරණය - බදුල්ල**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 01 |
| | අඩන්තේට්ටම් පහර දීම් | 35 |
| | අත් අඩංගුවට ගැනීම් / රඳවා තැබීම් | 11 |
| රැකියා | | 87 |
| අකර්මන්‍ය බව | | 50 |
| අධ්‍යාපනය | | 18 |
| දේපල හා උපයෝගිතාව | | 59 |
| රාජ්‍ය සුබසාධනය | | 08 |
| වෙනත් | | 38 |

කාර්යාලය පොලිස් ස්ථාන වෙත නිල පිරික්සුම් 51 ක් සිදු කළේය.

මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 20ක් පොලිසිය ඉලක්ක කරගනිමින් පවත්වන ලදී. ඒවා ප්‍රධාන වශයෙන් පිළිවෙලින් මහියංගනය හා බොරලන්ද යන ස්ථානයන්හි පිහිටි පොලිස් පුහුණු පාසල් වල පවත්වන ලද අතර වැඩසටහන් තුනක් පමණ සිවිල් සමාජ සාමාජිකයන් සඳහා පවත්වන ලදී. එසේම වැඩිහිටි පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රජා නායකයන් සඳහා එක් වැඩසටහනක් පවත්වන ලදී. වර්ෂය තුළදී සිවිල් සමාජ රැස්වීම් හතරක් හා තෙදින තරුණ කඳවුරක් කාර්යාලය විසින් සංවිධානය කෙරිණ.

2012 වසරේදී විවිධ ගැටලු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා පුද්ගලයන් 1100 ක් පමණ කාර්යාලය වෙත පැමිණියහ.

## 3.4 මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය

සමාලෝචන වර්ෂය තුළදී මඩකලපුව කාර්යාලය වෙත පැමිණිලි 389 ක් ලැබු ණි. වධහිංසා සම්බන්ධයෙන් 3 ක් ද, අඩන්තේට්ටම් පිළිබඳ 27 ක් ද අත්අඩංගුවට ගැනීම් පිළිබඳ 23 ක් ද, අතුරුදහන් වීම් පිළිබඳ 10 ක් ද, රැකියා සම්බන්ධ 33 ක් ද අධ්‍යාපනය සම්බන්ධ 87 ක් ද, අකර්මන්‍ය බව සම්බන්ධව 85 ක් ද දේපළ හා උපයෝගිතා පිළිබඳ 39 සහ ඉතිරි ඒවා වෙනත් බලධාරීන්ටද එරෙහිව වූ ඒවා වේ. වර්ෂය තුළදී සිද්ධි 297 ක් විසඳීමට කාර්යාලයට හැකි වූ අතර වර්ෂය අවසානයේ නොවිසිඳී සිද්ධි 92 ක් ඉතිරි විය.

**පැමිණිලි වර්ගීකරණය - මඩකළපුව**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 03 |
| | අඩන්තේට්ටම් පහර දීම් | 27 |
| | අත් අඩංගුවට ගැනීම් / රඳවා තැබීම් | 23 |
| | අතුරුදහන් වීම් / ආගිය අතක් නොමැති වීම් | 10 |
| රැකියා | | 33 |
| අකර්මන්‍ය බව | | 85 |
| අධ්‍යාපනය | | 87 |
| දේපල හා උපයෝගිතාව | | 39 |
| වෙනත් | | 82 |

කාර්යාලය පොලිස් ස්ථාන නිල පිරික්සුම් 92 කද, බන්ධනාගාර පිරික්සුම් 10 කද එක් වැඩිහිටි නිවසකද යෙදිනි.

කාර්යාලය දැනුම්වත් කිරීමේ / අධ්‍යාපන වැඩසටහන් 38 ක් මෙහෙයවූ අතර රිට රැස්වීම් 15 ක් විශේෂ වැඩසටහන් 04 ක්, කාන්තා දින සැමරුම් දෙකක්, ළමා දින සැමරුම් එකක්, පොත් දොරට වැඩීම් එකක් හා ශිෂ්‍යයන්, රජයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන් හා පරිවාස නිලධාරීන් හා සිවිල් සමාජ සාමාජිකයන් ඉලක්ක කරගනිමින් පැවැත්වූ වැඩමුළු 12 ක් අඩංගු විය. මෙම අවස්ථාවන් සඳහා 4000කට ආසන්න පුද්ගලයන් පිරිසක් සහභාගි වූහ.

## වෙනත් ක්‍රියාකාරකම්

i) 2006 සිට 2009 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව අතුරුදහන් වූ පුද්ගලයින්ගේ නෑදෑයින් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි 2012 මැයි මස 8 සිට 10 දක්වා ප්‍රධාන කාර්යාලයට අයත් කාර්ය මණ්ඩලය විසින් විභාග කරන ලදී. උක්ත දින තුනේදී සම්පූර්ණයෙන් සිද්ධි 182 ක් විභාග කරන ලදී. වාර්තාව ප්‍රධාන කාර්යාලය විසින් ඉදිරිපත් කෙරෙනු ඇත.

ii) අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දෙමාපියන් හා නෑදෑයින් සහ පුරවැසි කමිටු සාමාජිකයන් සමග පීඩාවට පත් පුද්ගලයන් මුහුණ දෙන ගැටලු පිළිබඳ සාකච්ඡා පැවැත්වීම

iii) මඩකලපුව දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය හේතුවෙන් ළමා මෙහෙකාර සේවයෙහි වර්ධනයක් සිදුවී තිබීම හේතුවෙන් ළමා අයිතිවාසිකම් පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු, පරිවාස නිලධාරීන්, ළමා ආරක්ෂක නිලධාරීන්, රජයේ නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන අංශය හා සිවිල් සමාජය සමග සාකච්ඡා පැවැත්වීම

iv) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳව සිවිල් සමාජ සාමාජිකයන් සමග වැඩමුළු පැවැත්වීම

v) කාත්තාන්කුඩිහිදී මුස්ලිම් ගැහැණු ළමුන් දෙදෙනෙකු මත එල්ල කෙරුණු ප්‍රහාරය පිළිබඳ විභාග කිරීම
  - වාර්තාව 4 වන පරිච්ඡේදයෙහි ඇත.

### 3.5 යාපනය ප්‍රාදේශීය කාර්යාලය

යාපනය කාර්යාලයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 377 ක් වූ අතර එයින් 07 ක් වධහිංසා සම්බන්ධයෙන්ද, 77 අඩන්තේට්ටම් සම්බන්ධයෙන්ද 55 ක් අත් අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන්ද 26 අතුරුදහන් වීම් සම්බන්ධයෙන්ද, 30 අධ්‍යාපනය සම්බන්ධයෙන්ද, 62 රැකියා සම්බන්ධයෙන්ද, 59 රජයේ අකර්මන්‍ය බව සම්බන්ධයෙන්ද, 33 දේපල සම්බන්ධයෙන්ද ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහිව ද විය. වර්ෂය තුළදී සිද්ධීන් 139 ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කිරීමට කාර්යාලයට හැකි විය.

2012 වර්ෂය තුළදී ආරක්ෂක හමුදා විසින් පදිංචි වී සිටින නිවාස හා ඉඩම් සම්බන්ධයෙන් පැමිණිලි ගණනාවක් ප්‍රාදේශීය කාර්යාලය විසින් විභාග කරන ලදී. උක්ත විභාගයේදී ප්‍රාදේශීය කාර්යාලය ගනු ලැබූ පිවරයන්හි ප්‍රතිඵලයක් වශයෙන් නිවාස 82 ක් හා එක් ඉඩමක් ඒවාහි මුල් අයිතිකරුවන්ට යළි ලබා දීමට වර්ෂය තුළදී හැකි විය. කාර්යාලයේ ගොනු කර තිබූ පැමිණිලි 3 ක් යටතේ මෙකී විභාග කටයුතු මෙහෙයවන ලදී.

**පැමිණිලි වර්ගීකරණය - යාපනය**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 07 |
| | අඩන්තේට්ටම් | 77 |
| | අත්අඩංගුවට ගැනීම් / රඳවා තැබීම් | 55 |
| | අතුරුදහන්වීම් / ආගිය අතක් නොමැති වීම් | 26 |
| රැකියා | | 62 |
| අකර්මන්‍ය බව | | 59 |
| අධ්‍යාපනය | | 30 |
| දේපල හා උපයෝගිතාව | | 33 |
| රාජ්‍ය සුභසාධනය | | 06 |
| වෙනත් | | 22 |

කාර්යාලය පොලිස් ස්ථානයන් වෙත නිල පිරික්සුම් 182 කද, බන්ධනාගාර වෙත 11 කද, ළමා නිවාස වෙත 5 කද පුනරුත්ථාපන මධ්‍යස්ථාන 01 කද යෙදුනේය.

කාර්යාලය යුනිසෙෆ් අරමුදල් සපයන ව්‍යාපෘතියක් යටතේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් / වැඩමුළු 17 ක් මෙහෙයවූ අතර ළමා අයිතිවාසිකම් පිළිබඳ රැස්වීම් 10 ක් ද පැවැත්වූයේය. එසේම, පුළුල් පරාසයක මානව හිමිකම් හා ආරක්ෂණ පිළියම් ආවරණය කරමින් තවත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 09ක් කාර්යාලය විසින් පවත්වනු ලැබීය.

පාසල් සිසුවන් අතරේ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් ජාත්‍යන්තර ළමා දිනය සමරන ලද අතර මානව හිමිකම් ප්‍රතිමාන හා ප්‍රමිතීන් පිළිබඳව සිවිල් සමාජ සාමාජිකයන් හා රාජ්‍ය නිලධාරීන් අතරේ සාකච්ඡාවක් පවත්වමින් ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සමරන ලදී.

සමාලෝචන වර්ෂය තුළ සිවිල් සමාජය සමග රැස්වීම් හතරක් හා පොලිසියේ ඉහළ නිලධාරීන් සමග එක් රැස්වීමක් ද පවත්වන ලදී.

## 3.6 කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය

2012 වර්ෂයේදී කල්මුනේ ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණිලි 206 ක් ලැබුණි. වධහිංසාවට එරෙහිව පැමිණිලි 4 ක්ද, අඩන්තේට්ටම් පිළිබඳ 20 ක් ද, අත් අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම් පිළිබඳ 03 ක්ද, අතුරුදහන් වීම් / ආගිය අතක් නොමැතිවීම් පිළිබඳ 06 ක් ද, රජයේ අකර්මන්‍ය බව පිළිබඳ 69 ක්ද, අධ්‍යාපනය සම්බන්ධ 39 ක් ද, රැකියා සම්බන්ධව 23 ක්ද ඉතිරි පැමිණිලි සංඛ්‍යාව වෙනත් බලධාරීන්ට එරෙහිව ද විය.

කාර්යාලය සිද්ධි 232 ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කළ අතර එයින් පැමිණිලි 116 ක් 2012 ලැබුණු ඒවා වූ අතර ඉතිරිය පසුගිය වර්ෂයන්ට අයත් ඒවා විය.

**පැමිණිලි වර්ගීකරණය - කල්මුණේ**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 04 |
| | අඩන්තෙට්ටම් | 20 |
| | අත් අඩංගුවට ගැනීම් / රඳවා තබා ගැනීම් | 03 |
| | අතුරුදහන් වීම් / ආගිය අතක් නොමැති වීම | 06 |
| රැකියා | | 23 |
| අකර්මන්‍ය බව | | 69 |
| අධ්‍යාපනය | | 39 |
| දේපල හා උපයෝගිතාව | | 05 |
| වෙනත් | | 35 |

කාර්යාලීය ප්‍රදේශයන්හි පවතින සියලු පොලිස් ස්ථාන ආවරණය කරමින් නිලධාරීහු පොලිස් ස්ථාන වෙත අධීක්ෂණ පිරික්සුම් 33 ක යෙදුණහ. මෙම කාර්යාලය විසින් මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂාව, ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, ළමා අපයෝජන හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩ ක්‍රියා යනාදී ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ඉලක්ක කණ්ඩායම් තුළට පාසල් ගුරුවරු හා සිසුන් 2600 ක් ඇතුලත් වූ අතර 1000 ක් පමණ වූ අනෙකුත් අය තුළට කාන්තාවන්, රජයේ නිලධාරීන් හා සිවිල් සමාජ සාමාජිකයන් ඇතුලත් විය.

වර්ෂය තුළදී කාර්යාලය විසින් වත්මන් හා හදිසි මානව හිමිකම් ගැටලු සාකච්ඡා කිරීම සඳහා රැස්වීම්, උපදෙස් රැස්වීම් හා සාකච්ඡා පවත්වන ලදී. මෙලෙස කාර්යාලය අදාළ පාර්ශ්වකරුවන් සමග සිය දිවි හානි කර ගැනීමේ ප්‍රවණතාවයෙහි වර්ධනය, ලිංගික හිංසනය, ළමා අපයෝජනය, මත්පැන් භාවිතයේ වර්ධනය වැනි මාතෘකා සාකච්ඡා කිරීම පිණිස රැස්වීම් 15 ක් පැවැත්වූයේය. එසේම සංක්‍රමණික සේවකයන් හා මිනිස් ජාවාරම, වැඩිහිටි අයිතිවාසිකම් හා වැඩිහිටියන් සඳහා යහපත් සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා ප්‍රදේශයේ රෝහල්වල පවතින වෘද්ධ චිකිත්සකයින්ගේ හිඟතාවය ඇතුළත් බොහෝ ගැටලු සාකච්ඡා කළ වැඩමුළු 07 ක් ද පැවැත්වුණි. කාර්යාලය විසින් ප්‍රදේශයේ ධීවරයින් මුහුණපාන ගැටළු, පාසල් හි විනය, ළමා ආරක්ෂාව හා ළමා අපයෝජනය පිළිබඳ සිද්ධි සම්බන්ධව ආගමික නායකයන්ගේ කාර්ය භාරය පිළිබඳ සාකච්ඡාවන් 05 ක් පවත්වන ලදී.

වැදගත් මානව අයිතිවාසිකම් දින කිහිපයක් සැමරීම සඳහා උත්සව ද පැවැත්විණි. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා මෙහෙකාර සේවය පැවැත්වීම යන තේමාත්මක පෝස්ටරයක් සමග ජාත්‍යන්තර කම්කරු දිනය සැමරීම සඳහා 2012 ජූනි මස 12 දින

පෝස්ටර් ව්‍යාපාරයක් පැවැත්වුණ අතර එය ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන, කලාප අධ්‍යාපන කාර්යාල හා පාසල් වලට බෙදා හැරිණ.

වධ හිංසා දිනය සනිටුහන් කිරීම සඳහා වධහිංසාවන්ට ලක් වූ වින්දිතයන් ඇතුළත්ව සහභාගිවන්නන් 50 දෙනෙකු සමග 2012 ජූනි 26 දින වැඩසටහනක් පවත්වන ලදී.

ජාත්‍යන්තර කාන්තා දිනය සනිටුහන් කිරීම පිණිස ජංගම අත්සන් ව්‍යාපාරයක් 2012 පෙබරවාරි 27 හා 28 දිනයන්හිදීද, මාර්තු මස 1, 2 හා 5 යන දිනයන්හිදීද විවිධ ප්‍රදේශයන්හි පිළිවෙලින් පවත්වන ලද අතර අවසාන වශයෙන් මාර්තු මස 08 වන දින සහභාගිවන්නන් 55 දෙනෙකු සමග ක්‍රිස්ටා ඉල්ලම්හිදී කාන්තා දිනය සමරන ලදී.

- දෙමළ හා මුස්ලිම් සිසුන් 100කගේ සහභාගිත්වය ඇතිව සාමය හා අවිහිංසාව, මානව ගරුත්වය / ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන වැඩසටහනක් සමග කාරතිවු සන්මුහා විද්‍යාලයේ ජාත්‍යන්තර සාම දිනය සමරන ලදී. මෙය තවත් සංවිධාන දෙකක් එක්ව සිදු කරන ලද සාමුහික ප්‍රයත්නයකි.

## 3.7 මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

වර්ෂය තුළ නුවර කාර්යාලය වෙත පැමිණිලි 584 ක් ලැබුණු අතර එයින් 28ක් වධහිංසා සම්බන්ධයෙන්ද, 34ක් අඩන්තෙට්ටම් සම්බන්ධයෙන්ද, 34ක් අත් අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන්ද, 01 ආගිය අතක් නොමැති වීම සම්බන්ධයෙන්ද, 75 ක් රජයේ අකර්මන්‍ය බව සම්බන්ධයෙන්ද, 90 ක් රැකියා සම්බන්ධයෙන්ද 35 ක් අධ්‍යාපනය සම්බන්ධයෙන්ද වූ අතර ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහිවද විය. කාර්යාලය සිද්ධි 471 ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කළ අතර සිද්ධි 1219 ක් නිර්දේශ සඳහා සහ වැඩිදුර විභාග සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යැවීය. මෙයට 2012 ජනවාරි මස 21 දින වන විට කටයුතු අවසන් නොකළ පසුගිය වසරේ සිද්ධි ද ඇතුළත්ය.

**පැමිණිලි වර්ගීකරණය - මහනුවර**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධ හිංසා | 28 |
| | අඩන්තේට්ටම් | 34 |
| | අත් අඩංගුවට ගැනීම් / රඳවා තැබීම් | 34 |
| | අතුරුදන්වීම් / ආගිය අතක් නොමැතිවීම | 01 |
| රැකියාව | | 90 |
| වෙනස් කොට සැලකීම | | 279 |
| අකර්මන්‍ය බව | | 75 |
| අධ්‍යාපනය | | 35 |
| වෙනත් | | 08 |

2012 වර්ෂය තුළ පොලිස් ස්ථාන වෙත නිල පිරික්සුම් 433ක්ද, බෝගම්බර බන්ධනාගාරය වෙත 04 ක්ද, ළමා නිවාස වෙත නිල පිරික්සුම් 02 ක්ද රැඳවියන්ගේ හා එහි වාසය කරන්නන්ගේ සුබසාධනය අධීක්ෂණය කිරීම පිණිස යෙදුණි.

තම බලපැවරුම ක්‍රියාත්මක කරමින් කාර්යාලය පාසල් සිසුන්, පොලීසිය, යුධ හමුදාව, රජයේ නිලධාරීන්, සිවිල් සමාජ සංවිධාන හා

පොදුවේ මහජනතාව ඉලක්ක කරමින් අධ්‍යාපනික / පුහුණු / දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා දේශන 55 ක් සංවිධානය කළේය. එසේම, කාර්යාලය විසින් තවත් විශේෂ වැඩසටහන් තුනක් සංවිධානය කළේය. ඉන් එක් වැඩසටහනක් කාන්තා දින සැමරුම වන අතර දෙවැන්න මානව හිමිකම දින සැමරුම් වැඩසටහනයි. විශේෂ සිදුවීමක් ලෙස 40 දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව සිවිල් සමාජ හමුවක් ද පවත්වන ලදී.

සමාලෝචන වර්ෂය තුළදී කාර්යාලය මහජන උපදෙස් සාකච්ඡා 3039 ක් පැවැත්විය. (නුවරඑළිය ජංගම කාර්යාලයෙහි පවත්වන ලද ඒවාද ඇතුළුව)

### 3.8 මාතර ප්‍රාදේශීය කාර්යාලය

සමාලෝචන වර්ෂය තුළ මාතර කාර්යාලය වෙතට පැමිණිලි 645 ක් ලැබුණි. වධහිංසා සම්බන්ධයෙන් පැමිණිලි 59 ක් ද, අඩන්තේට්ටම් සම්බන්ධයෙන් පැමිණිලි 37 ක් ද, අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් සම්බන්ධයෙන් පැමිණිලි 64 ක් ද, ආගිය අතක් නොමැති වීම සම්බන්ධයෙන් පැමිණිලි 01 ක් ද, රජයේ අකර්මන්‍යය බව සම්බන්ධයෙන් පැමිණිලි 75 ක් ද, දේපල හා උපයෝගිතාව සම්බන්ධයෙන් පැමිණිලි 103 ක් ද, අධ්‍යාපනය සම්බන්ධයෙන් පැමිණිලි 128 ක් ද, රැකියා සම්බන්ධයෙන් පැමිණිලි 113 ක් ද, ලැබුණු අතර ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහිව විය.  වසර ආරම්භයේදී පසුගිය වසර වලට අදාළ සිද්ධි 108 ක් ඉදිරියට ගෙනෙන ලදී. වර්ෂය තුළදී සිද්ධි 573 ක කටයුතු අවසන් කළ අතර වසර අගදී නොවිසඳී පැවතුණු සිද්ධීන් හි ශේෂය 180 ක් විය.

**පැමිණිලි වර්ගීකරණය -  මාතර**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 59 |
| | අඩන්තේට්ටම් | 37 |
| | අත් අඩංගුවට ගැනීම් / රඳවා තැබීම් | 64 |
| | අතුරුදන්වීම / ආගිය අතක් නොමැති වීම | 01 |
| රැකියා | | 113 |
| අකර්මන්‍ය බව | | 75 |
| අධ්‍යාපනය | | 128 |
| දේපල හා උපයෝගිතාව | | 103 |
| රාජ්‍ය සුබසාධනය | | 09 |
| වෙනත් | | 56 |

කාර්යාලය පොලිස් ස්ථාන 62 ක් වෙත නිල පිරික්සුම් 258 ක යෙදුනු අතර නිල පිරික්සුම් 8 ක් ගාල්ල හා මාතර බන්ධනාගාර වෙත සිදු කරන ලදී. එසේම, බූස්ස රැඳවුම් කඳවුර වෙත නිල පිරික්සුම් 02 ක් සිදු කරන ලදී.

කාර්යාලය දැනුම්වත් කිරීමේ වැඩසටහන් /විශේෂ වැඩසටහන් 34 ක් යුධ හමුදාව, පොලිසිය, පාසල් සිසුන් සිවිල් සමාජය හා තරුණ පිරිස් වෙනුවෙන් පවත්වන ලදී. එසේම, කාර්යාලය විසින් සිවිල් සමාජ හමුවක්ද සංවිධානය කර තිබුණි. ළමා දින හා මානව හිමිකම් දින ද සමරන ලදී. මෙකී සියලු වැඩසටහන් හා සිදුවීම් සඳහා 2000කටත් අධික ජන සහභාගිත්වයක් තිබුණි.

### 3.9 ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය

2012 වර්ෂය තුළ ත්‍රිකුණාමල කාර්යාලය වෙත පැමිණිලි 167 ක් ලැබුණි. වධහිංසා සම්බන්ධයෙන් 02 ක්ද, අඩන්තේට්ටම් සම්බන්ධයෙන් 10 ක් ද, අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් 56 ක් ද, ආගිය අතක් නොමැති වීම් සම්බන්ධයෙන් 03 ක් ද, පැහැර ගැනීම් සම්බන්ධයෙන් 02 ක් ද, රැකියා සම්බන්ධයෙන් 18 ක් ද, රජයේ අකර්මන්‍ය බව සම්බන්ධයෙන් 24 ක් ද වූ අතර ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහි ඒවා විය. සිද්ධි 62 ක් පසුගිය වසර වලින් ඉදිරියට ගෙන එන ලද ඒවා විය. වර්ෂය තුළ කාර්යාලය සිද්ධි 76 ක කටයුතු අවසන් කළ අතර ඉදිරි වසර වෙත ගෙන යාම සඳහා සිද්ධි 62 ඉතිරිව පැවතුණි.

**පැමිණිලි වර්ගීකරණය - ත්‍රිකුණාමලය**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 02 |
| | අඩන්තේට්ටම් | 10 |
| | අත් අඩංගුවට ගැනීම / රඳවා තැබීම | 56 |
| | අතුරුදහන් වීම් / ආගිය අතක් නොමැතිවීම | 03 |
| | පැහැර ගෙන යාම් | 02 |
| රැකියා | | 18 |
| අකර්මන්‍ය බව | | 24 |
| අධ්‍යාපනය | | 04 |
| දේපල හා උපයෝගිතාව | | 10 |
| වෙනත් | | 38 |

කාර්යාලීය පොලිස් ස්ථාන වෙත නිල පිරික්සුම් 62 ක යෙදුන අතර රිමාන්ඩ් බන්ධනාගාරය වෙත පිරික්සුම් 03 ක නිරත විය. දැනුවත් කිරීමේ / අධ්‍යාපනික වැඩසටහන් පහත පරිදි පවත්වන ලදී. එනම්, යුධ හමුදාව සඳහා වැඩසටහන් 08, පොලිසිය සඳහා 10, පාසල් ළමුන් සඳහා 02, ප්‍රජා නායකයන් සඳහා 02 සහ සිවිල් සමාජය සඳහා වැඩසටහන් 04 ක් වශයෙනි.

### 3.10 වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය

සමාලෝචන වර්ෂය තුළ වව්නියාව කාර්යාලය වෙත පැමිණිලි 367 ක් ලැබුණි. පැමිණිලි 02 ක් වධහිංසා වලට එරෙහිවද 30 ක් අඩන්තේට්ටම් වලට එරෙහිවද 57 ක් අත්අඩංගුවට ගැනීම් හා රඳවා තබාගැනීම් වලට එරෙහිවද, 39 ක් ආගිය අතක් නොමැති වීම් සම්බන්ධයෙන්ද, 16 ක් රජයේ අකර්මන්‍ය බව සම්බන්ධයෙන්ද, 44 ක් දේපල සම්බන්ධයෙන්ද, 45 ක් අධ්‍යාපනය සම්බන්ධයෙන්ද 28ක් රැකියා සම්බන්ධයෙන්ද වූ අතර ඉතිරිය වෙනත් බලධාරීන්ට එරෙහිව විය. වර්ෂය තුළ කාර්යාලය සිද්ධි 262 ක කටයුතු අවසන් කළේය.

**පැමිණිලි වර්ගීකරණය - වවුනියාව**

| පැමිණිලි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 02 |
| | අඩන්තේට්ටම් | 30 |
| | අත් අඩංගුවට ගැනීම / රඳවා තැබීම | 57 |
| | අතුරුදහන් වීම් / ආගිය අතක් නොමැතිවීම | 39 |
| රැකියාව | | 28 |
| අකර්මන්‍ය බව | | 16 |
| අධ්‍යාපනය | | 45 |
| දේපල හා උපයෝගිතාව | | 44 |
| රාජ්‍ය සුභසාධනය | | 12 |
| වෙනත් | | 94 |

කාර්යාලය වර්ෂය තුළ පොලිස් ස්ථාන වෙත නිල පිරික්සුම් 29 ක යෙදී ඇති අතර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත නිල පිරික්සුම් 02 ක යෙදී තිබේ.

දැනුම්වත් කිරීම් / අධ්‍යාපන වැඩසටහන් / වැඩමුළු / දේශන හා රැස්වීම් 14 ක් සිවිල් සමාජය, ළමා ආරක්ෂණ නිලධාරින් හා යුධ හමුදාව ඉලක්ක කරගනිමින් වත්මන් කාලසීමාව තුළ පවත්වන ලදී.

නිලධාරීන් විසින් විපතට පත්වීමේ ඉඩකඩ ඇති ගම්මාන වෙත නිල පිරික්සුම් 04 ක යෙදී ඇති අතර එකී ගම්මාන වල දැනුවත් කිරීමේ වැඩසටහන්ද පවත්වනු ලැබිය.

ප්‍රාදේශීය කාර්යාලය විසින් මානව හිමිකම් දිනය සමරන ලදී.

## 3.11 ජංගම / උප කාර්යාල

### 3.11.1 ජංගම කාර්යාලය - කිලිනොච්චිය

මෙම කාර්යාලය 2012 ඔක්තෝබර් මස විවෘත කළ අතර දැනට යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරයා විසින් අධීක්ෂණය කෙරේ. කාර්යාලය වෙත 2012 දෙසැම්බර් 31 වන දින දක්වා පැමිණිලි 35 ක් ලැබුණි. එයින් පැමිණිලි 09 ක කටයුතු අවසන් කරන ලදී. කෙටි කාල සීමාව තුළ කාර්යාලයට සිද්ධි 196 ක් සඳහා උපදෙස් ලබා දීමට හැකි විය.

**පැමිණිලි වර්ගීකරණය - කිලිනොච්චිය**

| පැමිණිලි වර්ගීකණය | | සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| පුද්ගල නිදහස | වධහිංසා | 03 |
| | අඩන්තෙට්ටම් | 01 |
| | අත්අඩංගුවට ගැනීම් / රඳවා ගැනීම | 04 |
| | අතුරුදහන් වීම / ආගිය අතක් නොමැති වීම | 04 |
| රැකියා | | 05 |
| අකර්මන්‍ය බව | | 05 |
| අධ්‍යාපනය | | 02 |
| දේපල හා උපයෝගිතාව | | 09 |
| රාජ්‍ය සුබසාධනය | | 02 |

### 3.11.2 ජංගම කාර්යාලය - පුත්තලම

මෙම කාර්යාලය 2012 දෙසැම්බර් 06 දින විවෘත කරන ලද අතර ප්‍රධාන කාර්යාලයේ විමර්ශන නිලධාරියෙකු විසින් අධීක්ෂණය කෙරේ. මාසය තුළ පැමිණිලි 05 ක් ලැබුණි.

### 3.11.3 උප කාර්යාලය - නුවරඑළිය

මහනුවර ප්‍රාදේශීය කාර්යාලය විසින් සෑම බදාදා දිනකම නුවර එළියේ ජංගම කාර්යාලයක් පවත්වනු ලබන අතර එහිදී මහජනතාවට උපදෙස් සැපයේ.

වර්ෂය තුළ පැමිණිලි 09 ක් ලැබුණි. කෙසේ වෙතත් මෙම කාර්යාලයට ලැබෙන පැමිණිලි වලට අදාළ විභාගයන් මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේදී පවත්වනු ලැබේ.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව- ප්‍රාදේශීය කාර්යාල
## පැමිණිලි කාණ්ඩය - 2012

| පැමිණිල්ලේ ස්වභාවය | අම්පාර | අනුරාධපුර | බදුල්ල | මඩකලපුව | යාපනය | කල්මුනේ | මහනුවර | මාතර | ත්‍රිකුණාමලය | වවුනියාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වධහිංසා | 07 | 40 | 01 | 04 | 07 | 04 | 28 | 59 | 02 | 03 | **154** |
| අඩන්තේට්ටම් | 03 | 50 | 07 | 20 | 77 | 20 | 34 | 37 | 10 | 30 | **288** |
| අත් අඩංගුවට ගැනීම් හා රඳවාගැනීම් | 05 | 63 | 39 | 03 | 55 | 03 | 34 | 64 | 56 | 57 | **379** |
| ආගිය අතක්නොමැතිවීම / පැහැර ගෙන යාම / අතුරුදහන්වීම | | 02 | - | 06 | 26 | 06 | 01 | 01 | 05 | 39 | **86** |
| අකර්මන්‍ය බව | 60 | 165 | 50 | 23 | 59 | 69 | 75 | 75 | 24 | 16 | **616** |
| රැකියා | 26 | 115 | 87 | 69 | 62 | 23 | 90 | 113 | 18 | 28 | **631** |
| වෙනස් කොට සැලකීම | - | - | - | - | - | - | 279 | - | 04 | - | **283** |
| හිතුවක්කාර ක්‍රියාමාර්ග | | | | | | | | | | | |
| අධ්‍යාපනය | 32 | 74 | 18 | 39 | 30 | 39 | 35 | 128 | 04 | 45 | **444** |
| සෞඛ්‍යය | - | - | 01 | 06 | 02 | 06 | - | 01 | - | - | **16** |
| දේපල හා උපයෝගිතා | - | 198 | 59 | 05 | 33 | 05 | - | 103 | 02 | 44 | **449** |
| රාජ්‍ය සුභසාධනය | - | 08 | 08 | 08 | 06 | 08 | - | 09 | 08 | 12 | **67** |
| පරිසරය | - | 02 | 06 | 03 | 01 | 03 | 02 | 03 | - | 01 | **21** |
| ළමා | - | - | - | 05 | - | 05 | 03 | 01 | - | - | **14** |
| කාන්තා | - | - | - | - | - | - | 02 | - | - | - | **02** |
| වෙනත් | 06 | 01 | 31 | 13 | 19 | 13 | 03 | 49 | 34 | 93 | **262** |
| මා.හි.කො. බලපැවරුමට ඇතුළත් නොවන | - | 29 | 19 | 02 | - | 02 | - | - | - | - | **52** |
| නීතියෙන් පරිබාහිර ඝාතන | - | - | - | - | - | - | - | - | - | - | **-** |
| අත්අඩංගුවේදී මියයාම් | - | 01 | - | - | - | - | - | - | - | - | **01** |
| නාඳුනන පුද්ගලයන් විසින් තර්ජනය කිරීම් | - | - | - | - | - | - | - | - | - | - | **-** |
| එකතුව | **139** | **748** | **326** | **206** | **377** | **206** | **584** | **645** | **167** | **367** | **3765** |

## හතරවැනි පරිච්ඡේදය

# විශේෂ වාර්තා

## 4.1 පරීක්ෂණ හා විමර්ශන අංශය

### 4.1.1 පරිසර සිද්ධි වාර්තාව

**චන්ද්‍රා අමරසිංහ මිය**
**එදිරිව**
**සභාපති** BOI/ **සභාපති** CEA / **සභාපති ශ්‍රී ලංකා** L R&D **සංස්ථාව / සභාපති** UDA
**සිද්ධි අංක** : HRC/2073/09, HRC /1166/09,HRC/4945/09,HRC/5405/09
**මෙකී පැමිණිලි පහත සඳහන් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් කර තිබුණි** .

1. ආයෝජන මණ්ඩලය (BOI)
2. මධ්‍යම පරිසර අධිකාරිය (CEA)
3. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC)
4. ජාඇල ප්‍රාදේශීය සභාව

පැමිණිලිකාරිය සඳහන් කරනුයේ BOI ආයතනය පිළිවෙලින් අංක 111, මෛත්‍රී මාවත, ඒකල හා පන්සල පාර, ඒකල යන ලිපිනයන්හි පිහිටි රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් ආයතනය හා මෙල්වයර් රූෆින් ලිමිටඩ් ආයතනය සමග මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් (මෙම ලේඛණයේ EIAR ලෙස සඳහන් කොට තිබේ) ලබා නොගෙන ගිවිසුමකට එළඹී ඇති බවය.

එසේම රයිනෝ රූෆින් ලිමිටඩ් ආයතනය ස්ථාන තුනක කර්මාන්ත ශාලා ඉදි කර ඇති බවට වැඩිදුරටත් සඳහන් කර තිබේ. එකී ස්ථාන පහත පරිදි වේ.

1. අංක 111 මෛත්‍රී මාවත, ඒකල
2. අංක 144/11 මිනුවන්ගොඩ පාර, ඒකල
3. අංක 30, මිනුවන්ගොඩ පාර, ඒකල

මේ පිළිබඳව BOI ආයතනයහි ස්ථාවරය වුයේ, රයිනෝ නිර්දිෂ්ට ව්‍යාපෘතියක් නොවන නිසාත්, BOI ආයතනය පාරිසරික බලපෑම් තක්සේරු කිරීමෙන් අනතුරුව හා එකී බලපෑම අවම කිරීම සඳහා පියවර ගැනීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ඇතිව අවසර ලබා දී තිබෙන නිසාත් (EIAR) පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීමට අවශ්‍ය නොවූ බවය. අංක 111, මෛත්‍රී මාවත, ඒකල යන ලිපිනයෙහි පිහිටි රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් ආයතනයේ තත්ත්වයන්ට යටත්ව මධ්‍යම පරිසර අධිකාරිය BOI ආයතනයට එහි එකඟතාවය ලබා දී තිබේ.

මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාවරය වුයේ, රූෆින් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් ආයතනය මෛත්‍රී මාවතහි කර්මාන්ත ශාලාව පටන් ගැනීමට පෙරාතුව අංක 30, මිනුවන්ගොඩ පාර, ඒකල යන ලිපිනයෙහි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන ගොස් තිබුණු බවය. පූර්ව කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ප්‍රදානය කර තිබුණු අතර එය මේ වන විට අවලංගු වී ඇත. නව කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් ගත් කළ පාරිසරික ආරක්ෂණ බලපත්‍රය මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත යුතුව ඇත්තේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට මසකට පෙරාතුව පමණි.

මෙල්වයර් රූෆින් ලිමිටඩ් සම්බන්ධයෙන් කිසිවක් සඳහන් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය අපොහොසත් වී තිබේ.

SLLRDC ය අංක 111, මෛත්‍රී මාවත යන ලිපිනයෙහි උස් බිමක පිහිටා තිබූ, කර්මාන්ත ශාලාව පිළිබඳව සඳහන් කළ අතර ඒ සඳහා SLLRDC යෙන් බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය නොවූ බව ද සඳහන් කළේය. එසේම පෙත්සම්කරු විසින් පහත් වගුරු බිමක පිහිටා ඇති බවට චෝදනා කළ මෙල්වයර් රූෆින් ලිමිටඩ් පිළිබඳව කිසිදු සඳහනක් කර නොමැත.

මේ සම්බන්ධයෙන් ජා-ඇල ප්‍රාදේශීය සභාවේ ස්ථාවරය වූයේ, රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් ආයතනය විවේක කාමරයක් සහ ගබඩා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබුණ බවත් ඒ සඳහා අවසර ලබාගැනීමෙන් අනතුරුව එකී ආයතනය කර්මාන්ත ශාලාවක් ඉදි කිරීමට පටන් ගෙන ඇති බවත්ය. මහජන විරෝධතාවයක ප්‍රතිඵලයක් වශයෙන් අදාළ අනුමැතිය අවලංගු කර ඇති අතර ඊට එරෙහිව සමාගම අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

ඉන් අනතුරුව සමථයක් ඇති වී ඇති අතර, සමාගම ගොඩනැගිලි ඉල්ලුම්පත් 13 ක් ඉදිරිපත් කර තිබෙන අතර ඒවා ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබ ඇත. සමාගම නීති ගාස්තු වශයෙන් ප්‍රාදේශීය සභාවට රු. 945,000/- මුදලක් ගෙවා තිබුණි.

## A) පරීක්ෂණ නිලධාරීවරයාගේ නිරීක්ෂණ

1988 අංක 56 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ ප්‍රසිද්ධ කරන ලද ගැසට් පත්‍රයේ නිර්දිෂ්ඨ ව්‍යාපෘති වශයෙන් අදාළ ව්‍යාපෘති දෙක පළ කරන ලදී.

ඒ අනුව, මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ඇතිව පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ. ඒ අනුව 1 හා 2 වග උත්තරකරුවන් ජාතික පාරිසරික පනතේ අනුගම්‍ය විධිවිධාන අනුව ක්‍රියාත්මක වී නොමැත. ඒ අනුව පරිසර ආරක්ෂා කිරීම සඳහා EIAR වාර්තාවක් ඉදිරිපත් කළ යුතුව ඇතිව සකස් කර ඇති නීති යටතේ සකස් කර ඇති ගැසට් රෙගුලාසි තුළ නිර්දිෂ්ඨ ව්‍යාපෘති වශයෙන් ඇස්බැස්ටෝස්, යකඩ හා වානේ නිෂ්පාදනය සලකා බැලීමට ඔවුහු අපොහොසත් වී තිබේ.

BOI හි හා මධ්‍යම පරිසර අධිකාරියෙහි අනුමැතිය ලබා නොගෙන පරිසර දූෂණයට ඉඩ දෙමින්, කාර්මික අපද්‍රව්‍ය හා අපද්‍රවයන් ප්‍රතිචක්‍රීකරණය හෝ පිරියම් නොකර මුදා හරිමින් පන්සල පාර ඒකල යන ස්ථානයෙහි මෙල්වයර් රෝලින් ලිමිටඩ් ආයතනය වානේ නිෂ්පාදනය ආරම්භ කරනු ලැබුයේ කුමන තත්ත්වයන් යටතේද යන්න 1 හා 2 වන වග උත්තරකරුවන් විසින් පැහැදිලි කර නොමැත. එසේම, රයිනෝ රූෆින් ආයතනයට 30,000 පමණ ජනතාව ජීවත් වන ප්‍රදේශයක සිය කර්මාන්ත ශාලාව පිහිටුවීමට ඉඩ දීම තුළින් ජාතික පාරිසරික පනතේ අනුගම්‍ය විධිවිධාන අනුගමනය කිරීමට 1 හා 2 වන උත්තරකරුවන් තවදුරටත් අපොහොසත් වී තිබේ. ඒ මගින් ඔවුහු එම ප්‍රදේශයේ ජනතාවගේ පිරිසිදු වාතය හා පිරිසිදු පානීය ජලය සඳහා වන අයිතිය අහිමි කර තිබේ. එම ප්‍රදේශයේ පවතින වාතය ඇස්බැස්ටෝස් හා වානේ දූවිලි මගින් දූෂණය වී ඇති අතර කිසිදු පිරියම් කිරීමකින් තොරව පරිසරයට මුදා හැරෙන වානේ නිෂ්පාදන අපද්‍රව්‍ය හා ඇස්බැස්ටෝස් හේතුවෙන් ළිං වල ජලය රොන් බොරින් දූෂණය වී තිබේ.

වාරිමාර්ග රක්ෂිත ප්‍රදේශයක පිහිටා ඇති ඉඩමක් මෙල්වයර් රෝලින් ලිමිටඩ් අල්ලා ගැනීම හා පහත් වගුරු බිමක් පිරවීම වැළැක්වීමට 3 වන වගඋත්තරකරු පියවර ගෙන නොතිබුණි. කර්මාන්ත ශාලාව කොළඹ දිස්ත්‍රික්කයේ පහත් තෙත්බිමක් වශයෙන් හඳුනාගැනීමේ අංක 18 (ඒ 2 ලෙස ලකුණු කර ඇති 2008.04.17 දිනැති අංක 1345 දරන ගැසට් පත්‍රය බලන්න) යටතේ විස්තර කෙරෙන ප්‍රදේශයක පිහිටා ඇත. ප්‍රදේශයේ වායු හා ජල දූෂණය සම්බන්ධයෙන් 3 ව වග උත්තරකරුද වගකිව යුතුය.

රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් ආයතනය විවේක කාමරයක් හා ගබඩා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා වන බලපත්‍රය යටතේ කර්මාන්ත ශාලාවක් ඉදි කරමින් සිටින බවට ජනතා උද්ඝෝෂණයක් නැගුණු අවස්ථාවේදී 4 වන වගඋත්තරකරු ගොඩනැගිලි අනුමැතිය අවලංගු කර තිබේ. ඉන් අනතුරුව සමාගම අභියාචනාධිකරණය හමුවේ ඉල්ලුම්පත්‍රයක් ගොනු කර ඇති අතර තහනම් නියෝගයක් ලබා ගෙන තිබුණි. තහනම් නියෝගයේ බලය මත සමාගම ඉදි කිරීම් කටයුතු කරගෙන යාමේදී 4 වන වගඋත්තකරුට අසරණව ඒ දෙස බලා සිටීමට සිදු වී තිබේ. 4 වන වගඋත්තරකරු ඒ වන විටත් ඉදි කර තිබූ ගොඩනැගිල්ල කඩා දැමීම සඳහා නියෝගයක් ලබා ගැනීමට නඩුවක් ගොනු කළ යුතුව තිබුණු අතර එසේ කිරීමට අපොහොසත් වී තිබේ.

පෙත්සම්කරු ලිපි ගණනාවක් ලියා තිබෙන අතර උක්ත රජයේ ආයතන 4 වෙත අවස්ථා ගණනාවකදී නියෝජනය කර ඇත. ඔහුට අනුව මෙකී ආයතන උත්තරයක් හෝ ප්‍රතිචාරයක් දක්වා නැත. තොරතුරු දැනගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කරන ලද අයිතියක් නොවුවද ශ්‍රේෂ්ඨාධිකරණය සීමාසහිත පාරිසරික පදනම එදිරිව නාගරික සංවර්ධන අධිකාරිය (ගෝල්ෆේස් ග්‍රීන් නඩුව) SCRF අංක 47/2004 නඩුවේදී භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට අදාළ අයිතිය තුළ තොරතුරු දැනගැනීම සඳහා වන අයිතිය ඇතුලත් විය හැකි බව දක්වා ඇති අතර එය මහජන සුබසිද්ධිය සඳහා වන කාරණාවක් සම්බන්ධයෙන් වූ අයිතීන් ඵලදායී අයුරින් යොදා ගැනීමට පුද්ගලයෙකුට හැකියාව ඇති කරන බවට සඳහන් කළේය.

උක්ත රාජ්‍ය ආයතන හතර, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරන ලද එහි රෙගුලාසි, 1993 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී නීතිය, විශේෂයෙන් ප්‍රාදේශීය සභා යනාදිය හා සම්බන්ධ සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ අනුමැතිය පිළිබඳ එහි විවිධ ගැසට් පත්‍රිකා යනාදිය අනුගමනය කිරීමට අපොහොසත් වී ඇති බව සටහන් කළ යුතුය.

## B) නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් 1, 2, 3 හා 4 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර තිබේ. ඒ අනුව නීතියේ සම ආරක්ෂාව, 14(1) ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ඔහුට අහිමි කර තිබෙන අතර රයිනෝ රූෆින් ආයතනය හා මෙල්වයර් රෝලින් ලිමිටඩ් ආයතනය හා සම්බන්ධ මහජන සුබසාධනය පිළිබඳ කාරණාවන් වලදී ඔහුගේ අයිතීන් ඵලදායී අයුරින් යොදාගැනීම සඳහා වන ඔහුගේ තොරතුරු සඳහා වන නිදහස ද අහිමි කර තිබේ.

එබැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) හා 14(1) යනාදී ව්‍යවස්ථාවන් මගින් තහවුරු කර ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් 1 සිට 4 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කරනු ලැබ ඇති බව ප්‍රකාශයට පත් කරයි.

මධ්‍යම පරිසර අධිකාරිය නිසි ඇගයීමක් හා තක්සේරුවක් පවත්වන තුරු පහත සඳහන් ආයතන වෙත ප්‍රදානය කරනු ලැබ ඇති බලපත්‍ර අත් හිටුවීමට නිර්දේශ කෙරේ.

1) රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ්
2) ශ්‍රී ලංකා ඇස්බැස්ටෝස් ලිමිටඩ්
3) මෙල් වයර් රෝලින් ලිමිටඩ්

පන්සල පාර, ඒකල යන ස්ථානයෙහි පිහිටා ඇති මෙල්වයර් රෝලින් ලිමිටඩ් හි කර්මාන්තශාලාව පහත් වගුරු බිමක් ලෙස ප්‍රකාශයට පත් කර තිබෙන ජා-ඇල ඇල මාර්ගයට අයත් රක්ෂිතය තුළ පිහිටා තිබේද යන්න පිළිබඳව SLLRDC විසින් විමර්ශනය කළ යුතු බවට නිර්දේශ කෙරෙන අතර එසේ පිහිටා ඇත්තේ නම් එහි ඉදිකිරීම් තහනම් කළ යුතුය. එම නිසා SLLRDC විසින් නිසි ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කරන තුරු මෙල්වයර් රෝලින් ලිමිටඩ් වෙත ප්‍රදානය කර ඇති අනුමැතිය අත්හිටුවිය යුතුය.

## C) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත සඳහන් කාරණා වැදගත් කාරණා වශයෙන් සටහන් කරයි.

1. අංක 30, මිනුවන්ගොඩ පාර, ජා ඇල හි පිහිටා ඇති ශ්‍රී ලංකා ඇස්බැස්ටෝස් ආයතනය පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් (EPL) නොමැතිව ක්‍රියාත්මක වන අතර බලපත්‍රය අලුත් කරගෙන නොමැත.
2. අංක 144/11, මිනුවන්ගොඩ පාර, ජා-ඇල ලිපිනයෙහි පිහිටා ඇති රයිනෝ රූෆින් ප්‍රොඩක්ට්ස් කර්මාන්ත ශාලාව සින්ක් ඇලුමිනියම් තහඩු නිෂ්පාදනය කරන අතර EPL බලපත්‍රයක් රහිතව ක්‍රියාත්මක වේ.
3. මෙල්වයර් රෝලින් ලිමිටඩ් ආයතනය පන්සල පාර, ඒකල යන ලිපිනයෙහි යකඩ හා වානේ කර්මාන්ත ශාලාවක් මෙහි වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති කිසිදු රාජ්‍ය ආයතනයකින් බලපත්‍ර කිසිවක් ලබා නොගෙන පවත්වා ගෙන යයි.

   එම නිසා පහත සඳහන් ආයතනයන් නිසි බලපත්‍ර හා අවසර ලබාගන්නා තුරු ඒවාහි නිෂ්පාදන ක්‍රියාකාරකම් අත්හිටුවන ලෙසට නිර්දේශ කෙරේ.

1) රයිනෝ රූෆින් ලිමිටඩ්
2) ශ්‍රී ලංකා ඇස්බැස්ටෝස් ලිමිටඩ්
3) මෙල්වයර් රෝලින් ලිමිටඩ්

1996 අංක 2 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් විසින් ගන්නා ලද පියවර පිළිබඳව කොමිෂන් සභාවට දැනුම් දෙමින් 2012.01.31 වන දින හෝ ඊට පෙර මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තාවක් එවන ලෙස කොමිෂන් සභාව වැඩිදුරටත් නියම කරයි.

### 4.1.2 කාත්තාන්කුඩි සිද්ධිය පිලිබඳ විශේෂ මැදිහත්වීම්

උපකාරක පන්ති ගුරුවරයෙකු කාත්තාන්කුඩි ප්‍රදේශයේ නොසිටි බැවින් වයස අවුරුදු 17 ක් හා 18 ක් වූ කාත්තාන්කුඩි ප්‍රදේශයේ ගැහැණු ළමුන් දෙදෙනෙකු ගුරුවරයෙකු සොයා මඩකලපුව නගරයට ගොස් තිබේ. ගුරුවරයෙකු නොසිටි බැවින් ගැහැණු ළමුන් දෙදෙනා අන්තර්ජාල මධ්‍යස්ථානයකට (සයිබර් කැෆේ) ගොස් තිබෙන අතර ඔවුහු එයින් පිටවී පැමිණීමේදී පුද්ගලයෙකු ඔවුන්ව දැක කාත්තාන්කුඩි වල සිටි ඔහුගේ මිතුරෙකුට දුරකථන ඇමතුමක් දී මෙකී ගැහැණු ළමුන් දෙදෙනා අන්තර්ජාල මධ්‍යස්ථානයකින් නිල් චිත්‍රපට (අසභ්‍ය චිත්‍රපට) බලා පැමිණන බවට දක්වා තිබුණි. කාත්තාන්කුඩිවලට බස් රථයෙන් පැමිණීමෙන් පසු තරුණයින් පිරිසක් යතුරුපැදි වලින් පැමිණ ඔවුන්ව එළවන්නට පටන් ගත් අතර බොහෝ අපහාසාත්මක වචන භාවිතා කර බැන වදිමින් ත්‍රීරෝද රථයකින් ඔවුන්ව නිවෙසකට පැහැර ගෙන ගොස් තිබිණ. එම ස්ථානයේදී කාන්තාවන් දෙදෙනෙකු ගැහැණු ළමුන් දෙදෙනාගේ ඇඳුම් ගලවා ඔවුන්ව පරීක්ෂා කර ඇති අතර ඉන්පසු ඔවුන්ට වධහිංසා සිදු කොට අමානුෂික ලෙස සලකා තිබේ. ඉන්පසුව තරුණයෝ මෙකී ගැහැණු ළමුන් දෙදෙනා සමග මුස්ලිම් සංවිධාන සංධානය වෙතට (මින් ඉදිරියට මෙම වාර්තාවෙහි සංධානය ලෙස හැඳින්වේ) හා මුස්ලිම් පල්ලිය වෙතට රැගෙන ගොස් ඔවුන්ව එහි සිට ජනතාව වෙත භාර දී ඇත. එම ස්ථානයේදී පවා මෙකී ගැහැණු ළමුන් දෙදෙනාට පහර දී පරුෂ වචනයෙන් බැන වැදී පැය 4 ක් එම ස්ථානයේ රඳවාගෙන සිට ඇත. මේ අවස්ථාවේදී විශාල පිරිසක් සංධානය වටා රැස් වෙමින් සිටියහ. පොලීසිය කඳුලු ගෑස් යොදා ගනිමින් විරෝධතාවේ නිරත වී සිටි 1000කට අධික පිරිසක් අතරින් ගැහැණු ළමුන් දෙදෙනාගේ ආරක්ෂාව වෙනුවෙන් ඔවුන් දෙදෙනා පොලිස් භාරයට ගෙන තිබුණි. ගැහැණු ළමුන් දෙදෙනාගේ ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් අනතුරුව ඔවුන් දෙදෙනා මඩකලපුව රෝහලට ඇතුළත් කළ අතර ඔවුන් සඳහා ආරක්ෂාවද සැපයුහ. ගැහැණු ළමුන් දෙදෙනා දින 3 ක් රෝහලෙන් ප්‍රතිකාර ලැබූ අතර, පසුව ඔවුන් දෙදෙනා දින 07 ක් ළමා නිවාසයක රඳවා තබන ලදී. ඉන් අනතුරුව අධිකරණය ගැහැණු ළමුන් දෙදෙනා ඔවුන්ගේ දෙමාපියන් වෙත භාර දුන්නේය.

අධිකරණයට ගොනු කර තිබූ පැමිණිල්ලේ මෙකී ගැහැණු ළමුන් දෙදෙනා තදබල කායික හා මානසික පීඩාවට ලක් කර ඇති බවත්, එම හේතුවෙන් ඔවුන්ට තම එදිනෙදා කටයුතු වල පවා නිරතවීමට අපහසුවී ඇති බවත් සඳහන් කර තිබුණි.

මෙම සිද්ධිය සම්බන්ධ පැමිණිල්ලක් මානව හිමිකම් කොමිෂන් සභාවට අයත් මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කර තිබුණු අතර එය අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයට යොමු කෙරුණි. මෙම සිද්ධියේදී කාත්තාන්කුඩි පොලිසිය නීතිමය පියවර ගනු ලැබුවද අත් අඩංගුවට ගත යුතු හා අධිකරණයට ඉදිරිපත් කළ යුතු සැකකරුවන් ගණනාවක් තවමත් සිටින බවට පැමිණිල්ල මගින් චෝදනා කර තිබුණි. මෙම පෙත්සමෙහි වග උත්තරකරුවන් වශයෙන් කාත්තාන්කුඩි පොලිසිය සහ කාත්තාන්කුඩි සංධානය පත් කර තිබුණි.

මානව හිමිකම් කොමිෂන් සභාව පොලිසිය කැඳවා තවමත් අත් අඩංගුවට නොගෙන ඇති සැකකරුවන් ඉක්මනින් අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නියම කළේය. ඉන් අනතුරුව සියලුම සැකකරුවන් අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බව පොලිසිය දැනුම් දෙන ලදී.

කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය - (එක් ගැහණු ළමයෙකුගේ වයස අවුරුදු 17 කි) වැනි සම්මුතීන්හි අන්තර්ගත විවිධ වගන්ති මගින් දැක්වෙන්නා වූ ගැහැණු ළමුන් දෙදෙනාගේ අයිතින් සංධානයේ සාමාජිකයන්ගේ ක්‍රියාමාර්ග තුළින් උල්ලංඝනය වී තිබේ. කෙසේ වෙතත්, මෙම සංවිධාන නිලධාරීන්ගේ ක්‍රියාමාර්ග **පරිපාලන හෝ විධායක** ක්‍රියාමාර්ගයක් යන නිර්වචනය තුළට නොවැටෙන හෙයින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පනත යටතේ කිසිදු පියවරක් ගැනීමට හැකියාවක් නොමැත.

මෙම තත්ත්වයන් යටතේ මෙම සිද්ධියෙහි ප්‍රතිඵලයක් වශයෙන් දැඩිලෙස උල්ලංඝනය කර ඇති කාන්තා හා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිශ්චිත පියවරයන් ගැනීම අවශ්‍ය වේ. එම නිසා නීති ලේකම් හා සංධානයේ නිලධාරීන් අතරේ සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී ගැහැණු ළමුන් දෙදෙනා සම්බන්ධයෙන් කිසිදු නිශේධාත්මක සමාජ ව්‍යංගත්වයන් සිදු නොවිය යුතු බවටත්, ඔවුන්ගේ දෛනික කටයුතු කරගෙන යාම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගිය යුතු බවටත් නිලධාරීන් වෙත කොමිෂන් සභාව දැනුම් දුන්නේය. එම ප්‍රදේශයේ නීතියට ගරු නොකරන තරුණ පිරිසක් සිටින බව සාකච්ඡාවේදී අනාවරණය වූ බැවින් නීතිය හා සාමය පවත්වාගෙන යාම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කොමිෂන් සභාව විසින් සංවිධානය වෙත දන්වන ලදී. සංධානය තරුණයන් දැනුම්වත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීමට භාරගත්තේය.

දෙවන රැස්වීම මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු, සංධානයේ නිලධාරීන්, මඩකලපුව හා කොළඹ ජම්මියතුල් උලමා සභාවේ නියෝජිතයින්, පෙත්සම්කරුවන්, පීඩාවට පත් ගැහැණු ළමුන් දෙදෙනා යනාදීන්ගේ සහභාගිත්වයෙන් මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයේදී පැවැත්වුණි. මෙම සාකච්ඡාවේදී කාත්තාන්කුඩි ප්‍රදේශයේ පවතින සියලුම මුස්ලිම් පල්ලි වල ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ගැහැණු ළමුන් දෙදෙනාගේ නිර්දෝෂී බව නිවේදනය කිරීමට සංධානය භාර ගත්තේය.

ගැහැණු ළමුන්ට, දරුවන්ට විශ්වාසය තැබිය හැකි ආරක්ෂිත සමාජයක් ගොඩනැගීම සඳහා පියවර ගැනීමට සියලු දෙනා එකඟ විය. 2012.02.05 දින කාත්තන්කුඩි වල පිහිටා තිබෙන සියලුම මුස්ලිම් පල්ලි හරහා ගැහැණු ළමුන් දෙදෙනාගේ නිර්දෝෂීභාවය පිළිබඳ නිවේදනය සිදු කළ බව 2012.02.06 දිනැති ලිපියක් මගින් සංධානය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දුන්නේය.

## 4.2 අධීක්ෂණ හා සමාලෝචන අංශය

බන්ධනාගාර කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සමග පවත්වන ලද විශේෂ උපදෙස් සාකච්ඡාව පිළිබඳ වාර්තාව

### i) තදබදය

- B වාර්තාව පිළිබඳ සාවධාන අධ්‍යයනයකින් පසු හා ඉදිරිපත් කෙරෙන සැකකරුවන් පිළිබඳ සාවධාන පරීක්ෂණයකින් පසු අවශ්‍ය නඩු වලදී පමණක් මහේස්ත්‍රාත්වරුන් විසින් සැකකරුවන් රිමාන්ඩ් කරනු ලබන්නේ නම් හා අනෙකුත් සෑම නඩුවකදීම ඇප ලබාදෙන්නේ නම් රිමාන්ඩ් බන්ධනාගාරයන්හි පවතින තදබදය අඩු කළ හැකිය. මේ අනුව ඇප ලබාදීමට නොහැකි අවස්ථාවලදී පමණක් සැකකරුවන් රිමාන්ඩ් භාරයේ සිටිනු ඇත.

- මත්ද්‍රව්‍ය වැරදිකරුවන් අත් අඩංගුවේ සිටියදීම ඔවුන්ට පුනරුත්ථාපන වැඩසටහනක් ආරම්භ කළ හැකි මධ්‍යස්ථාන වෙත යවනු ලබන්නේ නම් රිමාන්ඩ් බන්ධනාගාරයන්හි පවතින තදබදය අවම කළ හැකිය.

- ප්‍රජාපාදක විශෝධන පනතෙහි අපරාධ විෂයපථය පුළුල් කරන්නේ නම් බන්ධනාගාරයන්හි පවතින තදබදය අවම කළ හැකිය.

### ii) දීර්ඝ කාලීන රක්ෂිත බන්ධනාගාරගත සිරකරුවෝ

- අධිචෝදනා හෝ චෝදනා භාර නොදී රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් ප්‍රමාදයක් ඇති කරන නෛතික, පරිපාලනමය හා ආයතනිකමය හේතූන් සමාලෝචනය කිරීමට
- චෝදනා හෝ අධිචෝදනා බාරදීමටත් සන්දේශ හා වාර්තා ලබාගැනීමටත් ප්‍රමාදයන් ඇති කරන හේතු සොයා බැලීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අධිකරණ අමාත්‍යාංශයේ නිලධාරීන්, සෞඛ්‍යය හා අනෙකුත් අදාළ බලධාරීන් යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කරන්න.
- එවන් ප්‍රමාදයන් අධීක්ෂණය කිරීම සඳහා බලධාරීන්ට ප්‍රවේශය සහිතව සියලුම සිරකරුවන්ගේ දත්ත සමුදායක් හා තොරතුරු ජාලයක් නිර්මාණය කරන්න.
- සිරකරුවන්ට සැලකීම සඳහා වන සම්මත මෙම රීතීන්ට අනුව සිරකරුවන් සැලකීමට ලක් වන්නේද යන්න පරීක්ෂා කර බැලීම සඳහා නිතිපතා බන්ධනාගාර සුපරීක්ෂා කරන්න. මහේස්ත්‍රාත්වරුන් බන්ධනාගාරයන්හි තත්ත්වය සුපරීක්ෂා කිරීම සඳහා තම නෛතික බලය යොදා ගැනීමේදී බන්ධනාගාර පිළිබඳ ක්‍රමික සුපරීක්ෂණය මහේස්ත්‍රාත්වරුන් විසින් තහවුරු කරනු ලැබීම අවශ්‍ය වේ.
- ජාත්‍යන්තර නීතීන් හා ප්‍රමිතීන් මගින් පිළිගෙන තිබෙන්නා වූ සිරකරුවන්ට සැලකීම සඳහා වන සම්මත අවම රීති හා මූලික සිද්ධාන්ත පිළිබඳව බන්ධනාගාර නිලධාරීන් අතරේ දැනුවත්භාවය වර්ධනය කරන්න.

### iii) මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන්

මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන්ගේ මරණීය දණ්ඩනය අහෝසි කිරීමට හා මරණීය දණ්ඩනය ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවම ලෙස අඩු කරගැනීමට.

#### A) සිරකරුවන්ට සැලකීම සඳහා වන ක්‍රියාමාර්ග.

- රිමාන්ඩ් බන්ධනාගාරයන්හි යහපත් තත්ත්වයන් පැවතීම සඳහා සිරකරුවන්ට සැලකීම පිළිබඳ අවම ප්‍රමිතීන් හා මූලික සිද්ධාන්ත සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට
- පුද්ගලයන්ගේ කුසලතාවයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට හා සිරකරුවන්ගේ ඵලදායී භාවිතාව සඳහා ඒවා වර්ධනය කිරීමට උපකාර කිරීම
- බන්ධනාගාර සුබසාධන නිලධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම සඳහා යාන්ත්‍රණයක්.

## B) දීර්ඝකාලීන රැඳවුම් හා බන්ධනාගාරයන්හි පවතින තදබදය සඳහා වන පියවර .

- බන්ධනාගාරයන්හි සිරකරුවන්ගේ දීර්ඝ කාලීන රැඳවීම් ශ්‍රී ලංකා ක්‍රමයේ පවතින ආයතනික හා කාර්ය පටිපාටිමය දුර්වලතාවය ඔප්පු කරයි. මෙම හිඩැස ජයගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව යනාදි ආයතන ඵලදායී ලෙස වෙනස් විය යුතුය. අනෙකුත් පාර්ශ්වයන්ටද (උදා : නීතිඥයින්, මහජනතාව) මේ සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඇත.
- නඩුවල හිරවීම සඳහා සුදුසු පියවරයන් ලබා දීමට හා යොදාගැනීමටත් එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීමටත් "සිද්ධි කළමනාකරණ කමිටුවක්" පත් කිරීම, මෙම අධිකාරියට අදාළ නිල ආයතනයන්ට අයත් විවිධ නියෝජිතයන් ඇතුලත් විය යුතුය.
- ඇප ලබාදීම පිළිබඳ ගැටලු ඉහළ මට්ටමක පවතී. මේ සම්බන්ධයෙන් සිවිල් සමාජයේ උපරිම සහයෝගය සඳහා වන හදිසි අවශ්‍යතාවය එමගින් ඔප්පු කෙරේ.
- සමථ මණ්ඩලයේ අධික මැදිහත්වීම්
- සුළු වරදකරුවන් සම්බන්ධ සිද්ධි සමාලෝචනය කිරීම සඳහා බන්ධනාගාරයන්හි, බන්ධනාගාර පරීක්ෂණ සැසි / විවෘත අධිකරණ සැසි වාරානුකූලව පැවැත්වීම හා රිමාන්ඩ් බන්ධනාගාර සිරකරුවන් සඳහා රීති නියමයන් පිළියෙල කිරීම
- නඩු විභාගයේදී කලින් වරද පිළිගන්නා චූදිතට සම්මාන දීම සඳහා සම්මාන ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම (උදා : ඇප හෝ සිරගත කාල සීමාව අඩු කිරීම වැනි)
- අනවශ්‍ය කල්දැමීම් සඳහා නීතිඥවරුන්ට එරෙහිව ගාස්තු නියෝග පැනවීම

## C) මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් සඳහා වන පියවර

- මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදවල් යටතේ අත් අඩංගුවට ගනු ලබන සිරකරුවන්ගේ සංඛ්‍යාව වසරින් වසර සැලකිය යුතු ප්‍රතිශතයකින් වර්ධනය වෙමින් පවතින බව බන්ධනාගාර වාර්තා පෙන්නුම් කරයි. අනෙකුත් ඒවා අතරේ, හෙරොයින් සිද්ධි ඉහළ තැනක් ගනී. ඉතා ශක්තිමත් ආකාරයේ පුනරුත්ථාපන හා වැළැක්වීමේ යාන්ත්‍රණයන්හි විශේෂ අවශ්‍යතාවයන් පවතින බව පෙනේ. ඖෂධවලට ඇබ්බැහි වූ තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත වඩාත් ඵලදායක හා ප්‍රායෝගික අදියරයකට ගෙන ඒම වඩාත් හොඳ පිළිතුරක් වනු ඇත. එය බන්ධනාගාරයන්හි පවතින තදබදය පිළිබඳ ගැටලුව සඳහා වන පියවරයන්හි කොටසක් වශයෙන් අත්‍යවශ්‍ය වේ.
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් රෝගීන් ලෙස සැලකිය යුතු අතර සිරකරුවන් වශයෙන් ඔවුන් බන්ධනාගාරගත කිරීම වෙනුවට පුනරුත්ථාපනය කිරීමට පියවර ගත යුතුය.
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් සඳහා පමණක් වෙනමම ස්ථාන / බන්ධනාගාර පිහිටුවීම

## D) අඩු දැනුවත් භාවය සඳහා පියවර ගැනීම.

- රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ මගින් නොමිලේ සැපයෙන නීති ආධාර සඳහා පවතින පහසුකම් පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමට ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් තිබීම.
- වධහිංසා වලට ලක් වූ තත්ත්වයක් යටතේ අනුගමනය කළ හැකි පියවරයන් සම්බන්ධයෙන් සිරකරුවන්ට ඇත්තේ අඩු දැනුමකි. නීති ආධාර පමණක් නොව රිමාන්ඩ් සිරකරුවන් වශයෙන් ඔවුනට අවශ්‍ය දැනුමද ලබා දිය යුතුය.

## E) නිෂේධාත්මක සමාජ ගැටළු සඳහා වන පියවරයන්

- සිරකරුවන් රිමාන්ඩ් බන්ධනාගාර ගතව සිටින කාලසීමාව තුළ සිරකරුවන්ගේ පවුල් සම්බන්ධ ගැටළු සලකා බැලීම සඳහා (ඔවුන්ගේ වැඩි යහපත වෙනුවෙන් විශේෂයෙන් පාසල් යන වියේ පසුවන දරුවන් සම්බන්ධයෙන්) විශේෂ යාන්ත්‍රණයක් ඇති කළ යුතුය.
- ජනතාවගේ මූලික පසුබිම සම්බන්ධයෙන් විවිධාකාර පියවරයන් නිර්මාණය කිරීම මගින් ඔවුන් තරගකාරී ආර්ථික, සමාජ, සංස්කෘතික හා අනෙකුත් ගැටලු කෙරෙහි ප්‍රතිචාර දක්වන ආකාරය සාර්ථක අන්දමින් වෙනස් කළ හැකිය (උදා : විධිමත් හා අවිධිමත් අධ්‍යාපනය, සංස්කෘතික හා සමාජ පදනම වැනි දේ)
- සිරකරුවෝද තම සමාජයේම කොටසක් වන බැවින් සිරකරුවන් සම්බන්ධ සිවිල් සමාජයේ සම්ප්‍රදායික ප්‍රතිචාරය වෙනස් කිරීම සඳහා සුදුසු පියවරයන් ගත යුතුය.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිරකරුවන්ගේ පවුල් සඳහා උපදේශන යෝජනා ක්‍රම පැවතීම.

F) පුනරුත්ථාපනය හා වෙනත් අදාළ ගැටලු සඳහා පියවරයන් .

- පුනරුත්ථාපන වැඩසටහන් හා වෘත්තිය පුහුණු ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීම - රජයෙන් හෝ එවන් අරමුණක් සඳහා අනුග්‍රාහකත්වය ලබාගැනීම සඳහා වන උපාය මාර්ග
- ඵලදායී පුනරුත්ථාපනය සඳහා රජය හා අනෙකුත් සම්බන්ධිත ආයතන අතර කැපවීම වර්ධනය කිරීම
- බන්ධනාගරයෙන් නිදහස් වී යන විට ඔවුන්ව පුනරුත්ථාපනය කිරීම සඳහා අතර මැද නිවාස ගොඩනැගීම. මෙය පූර්ව සිරකරුවන්ට යළි සමාජය හා සම්බන්ධ වීමටත්, තවදුරටත් අපරාධ ක්‍රියාකාරකම් හා ඔවුන් සම්බන්ධ වීමෙන් වළක්වාලීමටත් උපකාරී වනු ඇත.

G) යළි ඒකාබද්ධ කිරීමේ ගැටලු සඳහා පියවරයන්.

- පුනරුත්ථාපන ක්‍රියාදාමය අවසන් කරන අය සඳහා පළාත් ආරක්ෂණ මධ්‍යස්ථාන (පුනරුත්ථානයෙන් පසු අවම වශයෙන් මාස 06 ක් සඳහා පිහිටුවීම)
- තමන් හා තම පවුල් වෙනුවෙන් ආදායමක් උපයා ගැනීමට මොවුන්ට හැකි බව තහවුරු කිරීම සඳහා මෙකී සේවාලාභීන් පිළිබඳව පසුවිපරම් කිරීම පිණිස රජයේ වෘත්තීය පුහුණු, සමාජ සේවා ආයතනයන්ගෙන් අනිවාර්ය සේවා
- සිරකරුවන් බන්ධනාගාරයෙන් නිදහස් වූ පසු ඔවුන්ට ආධාර කිරීම සඳහා වන ක්‍රමවේදයක් ඇති කිරීම
- බැංකු වල සහයෝගය ඇතිව නිදහස් කෙරුණු සිරකරුවන් හට ණය අවස්ථා ලබා දීම

H) පාර්ශ්වකරුවන් අතරේ පවතින සමීප අන්තර් සම්බන්ධතාවයෙහි මදිකම සඳහා පියවර

- බන්ධනාගාර බලධාරීන්ට සිවිල් සමාජය සමග දැඩි හා විශ්වාසදායී අන්තර් සම්බන්ධතාවයක් පවතී. ඒ අනුව බන්ධනාගාර තත්ත්වයන් දියුණු කිරීමේ අරමුණින්, මානව, මූල්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් ලබා දීම මගින් ආධාර කිරීම සඳහා අවංක හා වගකීම් සහිත බාහිර ආයතනවලට බන්ධනාගාර වලට ප්‍රවේශ වීමට හැකියාව ලබා දිය හැක.
- විවිධ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රවේශය හා ප්‍රයෝජන සහිතව සිරකරුවන් පිළිබඳ පරිපූර්ණ ජාතික දත්ත සමුදායක් නිර්මාණය කිරීම
- ප්‍රගතිය ඇගයීමේ අරමුණ සඳහා වගකිවයුතු ආයතන අතරේ කාර්තුමය රැස්වීම් පැවැත්වීම

I) මරණීය දණ්ඩනය පිළිබඳ ගැටළු සඳහා වන පියවරයන්.

- අපගේ ආගම හා අප සමාජ සංස්කෘතිය විසින් මරණීය දඬුවම පිළි නොගැනේ. කොමිෂන් සභාවද වර්ධනය වෙමින් පවතින අපරාධ සඳහා පිළිතුර එය බව පිළි නොගනී. එම නිසා, මරණීය දණ්ඩනය අහෝසි කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගත යුතු බවට යෝජනා කෙරේ.
- ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ සම්මුතිය (ICCPR) හි දෙවන සංධානය ස්ථිර කිරීම හා දේශීය නීතිය එහි අවශ්‍යතාවන් ළඟා කර ගැනීම සඳහා සංශෝධනය කිරීම
- මරණීය දණ්ඩනය නියම වී ඇති සියලුම සිරකරුවන්ගේ මරණීය දණ්ඩනය අහෝසි කිරීමටත් ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවම ඔවුන්ට නියම කිරීමටත් අවශ්‍ය පරිපාලනමය හා අධිකරණමය පියවර ගැනීම

J) ආගමන හා විගමන නීතිය යටතේ රැඳවියන් පිළිබඳ ගැටළු සඳහා පියවරයන්.

- රැඳවුම් මධ්‍යස්ථානයෙහි දැනට පවත්නා තත්ත්වය සැලකිල්ලට ගනිමින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී බවට ගරු කරමින් සහ දුබලතා සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන්ට විසඳුම් සපයමින් එම මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට ගෙන යාම
- ආගමන හා විගමන පාලක විසින් මධ්‍යස්ථානය සඵලදායක ලෙස කළමනාකරණය කිරීමට හා එම රැඳවියන්ගේ ආරක්ෂාව සහතික කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබාදීම
- අදාල රටවල තානාපති කාර්යාල / මහ කොමසාරිස් කාර්යාල / කොන්සල් කාර්යාල සමග සම්බන්ධීකරණය කර අදාල රටවලට පිටමං කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීම
- එම රැඳවියන් සම්බන්ධ දත්ත සමුදායන් රැස් කර පවත්වා ගෙනයාම
- ආයතනික අනන්‍යතාවය යළි නම් කිරීම
- තාවකාලික ස්ථානයකට හෝ මිනුවන්ගොඩ යෝජිත ස්ථිර ගොඩනැගිල්ල හෝ ප්‍රතිස්ථාපන ගත කෙරෙන තුරු දැනට පවතින ගොඩනැගිලි අලුත්වැඩියා කර මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානයේ රැඳවුම් තත්ත්වය වැඩි දියුණු කිරීම

එබඳු ප්‍රතිසංස්කරණයකට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමට සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM) එහි කැමැත්ත ප්‍රකාශ කළේය.

පස්වැනි පරිච්ඡේදය

# තවත් ජයග්‍රහණ කිහිපයක්

## 5.1 ක්‍රියාකාරකම් කිහිපයක් කෙටියෙන්

### 5.1.1 දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේදී මානව හිමිකම් පිළිබඳ දැනුවත් භාවය අවදි කිරීම

2012 පෙබරවාරි මස අනුරාධපුරයේදී පවත්වන ලද **දැයට කිරුළ** ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේදී ශ්‍රී ලංකාව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රදර්ශන කුටියට ගොඩ වී ප්‍රශ්නෝත්තර තරගයට සහභාගිවී වුවන්ට ත්‍යාග ලබා දෙන ලදී. මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනික වටිනාකමකින් යුත් අත් පත්‍රිකා ප්‍රදර්ශන කුටියට නැරඹීමට පැමිණි පුද්ගලයින් වෙත බෙදා හරින ලදී.

### 5.1.2 මානව හිමිකම් පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර තැබීමේ උළෙල

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2012 අප්‍රේල් 23 දින කොළඹ විශ්ව විද්‍යාලයීය උපාධි අධ්‍යයන පීඨයේදී **මානව හිමිකම් පිළිබඳ උසස් ඩිප්ලෝමා** පාඨමාලාව ආරම්භ කර තැබීමේ උළෙලක් සංවිධානය කළේය. මෙකී උළෙල මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා මහතාගේ අනුග්‍රහය යටතේ පවත්වන ලදී. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ උපදෙස් ඇතිව ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ඇත.

### 5.1.3 වධහිංසාවන්ට ලක්වූවන්ට සහය පළකිරීමේ ජාත්‍යන්තර දිනය - 2012

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව **පුනරුත්ථාපනය යනු වධහිංසාවන්ට ලක් වුවන්ගේ අයිතියකි** යන තේමාව යටතේ වධහිංසාවන්ට ලක් වූ වින්දිතයන්ට සහයෝගය පිණිස වන ජාත්‍යන්තර දිනය සනිටුහන් කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කළේය. මෙම වැඩසටහන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා මහතාගේ අනුග්‍රහය යටතේ 2012 ජුනි 26 වන දින මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙම වැඩසටහනට බස්නාහිර පළාත් පොලිස් දෙපාර්තමේන්තුවට අයත් පොලිස් ස්ථානාධිපතිවරු, බන්ධනාගාර පුනරුත්ථාපන නිලධාරීහු හා සිවිල් සමාජ සහභාගි වූහ.

### 5.1.4. මානසික ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම උපකාරී විය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එහි කාර්ය මණ්ඩලය සඳහා 2012.07.25 දින මානව හිමිකම් කොමිෂන් සභා ශ්‍රවණාගාරයේදී සංවිධානය කරන ලද විශේෂ දේශනයකට ජාතික මානසික සෞඛ්‍යායතනයේ අධ්‍යක්ෂක වෛද්‍ය ජයාන් මෙන්ඩිස් මහතා සහභාගි විය. ආයතනය සංවර්ධනය කිරීම සඳහා අභියෝග රැසකට මුහුණදීමට සිදුවූ බව සඳහන් කළ ඒ මහතා ආයතනයේ සීමාවට පැමිණි පුද්ගලයින්ගේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට උපකාර කළ බවද සඳහන් කළේය.

මෙම අවස්ථාවේදී **මානසික ආබාධ සහිත පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වන මූලධර්ම හා මානසික සෞඛ්‍යය රැකවරණය දියුණු කිරීම** පිළිබඳ භාෂා ත්‍රිත්වයෙන් (සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මුද්‍රණය කරන ලද පෝස්ටර් වෛද්‍ය ජයාන් මෙන්ඩිස් මහතා වෙත භාර දෙන ලදී.

### 5.1.5 සිවිල් සමාජ හමුවීම්

ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවනාගාරයේදී 2012 ඔක්තෝබර් මස සිවිල් සමාජ සමග ද හමුවක් පවත්වන ලදී. රැස්වීමට සහභාගි වීම සඳහා වන ආරාධනය පුවත්පත් දැන්වීමක් හරහා සිදු කරන ලද අතර මෙවන් ස්වභාවයේ අවස්ථාවන්ට සහභාගි වීම සඳහා හැකි වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලබන සිවිල් සමාජ සංවිධානයන්ට පමණක්ය යන චෝදනාවට ප්‍රතික්‍රියා දැක්වීම සඳහා මෙය වඩාත් ධනාත්මක පියවරක් ලෙසට අගය කෙරිණ. විශ්ව කාලාන්තර සමාලෝචනය පිළිබඳ බිම් මට්ටමේ පවතින නොදැනුවත්බව, මානව හිමිකම් ආරක්ෂකයින් විසින් රැඳවුම් ස්ථාන සඳහා ප්‍රවේශයන් ලබාගැනීමට ඇති හැකියාව එවන් ස්ථාන සඳහා නීතිඥවරුන් විසින් කරනු ලබන සංචාර මෙන් වියදම් අධික වීම, පොදුවේ ජනතාව අතරේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බල පැවරුම හා ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම්වත්භාවය සම්බන්ධ අවශ්‍යතාවය යනාදිය සාකච්ඡා කළ අනෙකුත් මාතෘකා අතර විය. සාකච්ඡාවෙන් පසු සහභාගි වන්නන් කණ්ඩායම් පහකට බෙදා සම්පූර්ණ කිරීමට ආකෘති පත්‍ර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලදී. කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් හි සිවිල් සමාජය නිරත වීම වර්ධනය කිරීමේ ක්‍රම සහ උපක්‍රම පිළිබඳව අදහස් ලබාගැනීම එහි අරමුණවිය.

### 5.1.6 මාධ්‍යවේදීන් සඳහා වන මානව හිමිකම් පිළිබඳ පුහුණු වැඩසටහන :

UNDP ආධාර යටතේ 2012 ඔක්තෝබර් 15 හා 16 දිනයන්හි සංවිධානය කෙරුණු මානව හිමිකම් පුහුණු වැඩසටහන මානව හිමිකම් කොමිෂන් සභාව හා දේශීය ජන සන්නිවේදන මාධ්‍යයන් අතර ඉතා වැදගත් අභිසාරිතා ලක්ෂයක් සනිටුහන් කළ අතර එය කොමිෂන් සභාවේ දැනුවත් කිරීමේ ප්‍රයත්නයන්ට තවදුරටත් හැකියාව ද ඇති කරයි.

LLRC නිර්දේශ පිළිබඳ ගෝලීය පිළිගැනීම මත පදනම්ව මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන 2011 - 2016 දක්වා වූ කාලසීමාව වෙනුවෙන් ජාතික ක්‍රියාකාරී සැලසුමක් සම්මත කරගැනීම, ඉතා මෑතකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශ්ව කාලාන්තර සමාලෝචන වෙත ප්‍රථම වතාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම යනාදිය කාර්ය බහුල වසරක කොමිෂන් සභාවේ තවත් සුවිශේෂී වැදගත් සලකුණක් විදහා පාන අවස්ථාවකි.

### 5.1.7 ඔබගේ අයිතීන් කියා පෑමට ඇති අයිතිය පිළිබඳ පෝස්ටරයක්

**ඔබගේ අයිතීන් කියා පෑමට ඇති අයිතිය** පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කොට භාෂා ත්‍රිත්වයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිටපත් 5000 ක් මුද්‍රණය කරන ලදී. පොලිස්පතිවරයා හරහා මෙකී පෝස්ටරය දිවයිනේ සියළු පොලිස් ස්ථාන වෙත බෙදා හරින ලදී.

### 5.1.8 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මානව හිමිකම් පිළිබඳ අධ්‍යයන සමුළුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වරට 2012 දෙසැම්බර් මස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මානව හිමිකම් පිළිබඳ අධ්‍යයන සමුළුවක් පවත්වන ලදී. මෙම සමුළුවේ අරමුණු බවට පත්ව තිබුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මානව හිමිකම් මෙවලම් පිළිබඳ මූලික දැනුමක් ලබාදීම සහ එකී මෙවලම් සඳහා වන අපගේ රජයේ බැඳීම් පිළිබඳ මූලික දැනුමක් ඇති කිරීම වේ. මෙම සමුළුව එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලද අතර නියෝජ්‍ය කථානායක කාර්යාලය මගින් සංවිධානය කෙරුණි.

### 5.1.9 ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ දිනය සැමරීම

2012 වසරේ මානව හිමිකම් දිනය සඳහා එක්සත් ජාතීන්ගේ සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද තේමාව වූ 'My Voice Counts'(මගේ හඬත් වටී) යන තේමාව යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2012 දෙසැම්බර් 10 දින මානව හිමිකම් දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වැඩසටහන සංවිධානය කෙරිණ. මෙකී තේමාව සිතෙහි රඳවාගෙන කොමිෂන් සභාව එහි වැඩසටහන තුළට කණ්ඩායම් සාකච්ඡාවක් ඇතුළත් කළ අතර එහිදී කොමිෂන් සභාව විසින් තෝරන ලද විවිධ මාතෘකා යටතේ කීර්තිමත් මණ්ඩල සාමාජිකයෝ කෙටියෙන් අදහස් දැක්වූහ. මෙම සාකච්ඡාවේ අරමුණ වූයේ අයිතිවාසිකම් ඉල්ලා සිටින ජනතාව වෙනුවෙන් හඬක් නැගීම වේ. තෝරාගත් මාතෘකා පහත පරිදි ය.

- ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම්
- කාන්තා අයිතිවාසිකම්
- ළමා අයිතිවාසිකම්
- භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිවාසිකම්

එක් එක් කථිකයා සඳහා විනාඩි 05 - 07 ක කාලයක් මාතෘකාව හඳුන්වා දීම සඳහා වෙන් කර තිබුණි. මාතෘකාව හඳුන්වා දීමෙන් පසු සියලු මණ්ඩල සාමාජිකයන් හා ප්‍රේක්ෂණ සාමාජිකයන් යන අයගේ සහභාගිත්වයෙන් ප්‍රශ්න හා පිළිතුරු සැසියක් ද පැවැත්විණ. කොටහේන විවේකානන්ද විද්‍යාලයීය සිසුන්ගේත්, බම්බලපිටිය මුස්ලිම් බාලිකා විද්‍යාලයීය සිසුවියන්ගේත්, හෙල්ප් ඒජ් වැඩිහිටියන්ගේත් සංස්කෘතික අංගයකින් වැඩසටහන නිමාවට පත් විය.

### 5.2 රැස්වීම් / උපදෙස් රැස්වීම් / මාධ්‍ය සාකච්ඡා / මාධ්‍ය නිවේදන - 2012

මේ අවස්ථාවන්හිදී සාකච්ඡා කරන ලද කරුණු කිහිපයක් කෙටියෙන්,

#### 5.2.1 අතිගරු ජනාධිපතිතුමන් සමග වූ හමුව

ගොඩනැගිල්ල මිලදී ගැනීම

- කිලිනොච්චිය, පුත්තලම, කුරුණෑගල, රත්නපුර, මොනරාගල හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක 06 හි නව ප්‍රාදේශීය මධ්‍යස්ථාන විවෘත කිරීම සඳහා වන යෝජනාව
- 2011 - 2016 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම.

#### 5.2.2 රජයේ භාණ්ඩාගාර නිලධාරීන් සමග වූ හමුව

- අතිගරු ජනාධිපතිතුමා සමග සාකච්ඡා කරන ලද කාරණා වැඩිදුර සාකච්ඡාව සඳහා යොමු කරන ලදී.

#### 5.2.3 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සමග වූ හමුව

- 'Z' ස්කෝර් මතභේදය හා සම්බන්ධ කාරණා සාකච්ඡා කළ අතර නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගන්නා ලෙසට යෝජනා කරන ලදී.

#### 5.2.4 අහමඩියා මුස්ලිම් නියෝජිත පිරිස සමග වූ හමුව

- අහමදි සරණාගතයන් සම්බන්ධ ව්‍යාජ කථා පුවත්පත්හි පළ කිරීමෙන් ඔවුන්ගේ ආගමික විශ්වාසය උදාසීනත්වයට පත් කිරීම පිළිබඳ ගැටළු

#### 5.2.5 පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයට අයත් ඇගයීම් කමිටුව සමග වූ හමුව

- භූමිකා ආධාර පිළිබඳ බලපෑම හා ඵලදායිතාවය තක්සේරු කිරීම
- අනාගත ආධාර ලබාදීම දියුණු කර සැලසුම් කිරීම

#### 5.2.6 ජාත්‍යන්තර කම්කරු සහයෝගිතාවය සඳහා වන ඇමෙරිකානු මධ්‍යස්ථානය සමග වූ හමුව

කටාර් රාජ්‍යයේ මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා සමග වූ හමුවකට පහසුකම් සැපයීම හා සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීම සඳහා කටාර් රාජ්‍යයේ මානව හිමිකම් කොමිෂන් සභාව සමග සමීප සම්බන්ධතාවයන් ඇති කිරීම

#### 5.2.7 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම පිළිබඳ ඉලක්ක කණ්ඩායම් හමුව

වැවිලි කර්මාන්ත අමාත්‍ය හා අතිගරු ජනාධිපතිතුමාගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිතවරයා විසින් ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම 2011 – 2016 ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පවත්වන ලද රැස්වීම් වලට සහභාගි වීම

#### 5.2.8 හමුව - විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

- අපරානුමත කළ මානව හිමිකම් සම්මුතීන් පිළිබඳ සාමයික වාර්තා පිළියෙල කිරීම

#### 5.2.9 හමුව - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නියෝජිතයින්

- සිරකරුවන් සඳහා වන මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම

#### 5.2.10 හමුව - ජාතික මානසික සෞඛ්‍යය ආයතනය

- මානසික ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම

### 5.2.11 2012.08.14 දින පොලිස්පතිතුමා සමග වූ හමුව

- පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එම දෙපාර්තමේන්තුවට එරෙහිව ගොනු කරන ලද සිද්ධි ඇතුළුව පොලිස් නිලධාරීන්ට එරෙහි මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම
- භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- පොලිස් නිලධාරීන් අතරේ මිනිස් ජාවාරම සම්බන්ධ නෛතික විධිවිධාන පිළිබඳ දැනුම අවම වීම
- සුදු වෑන් රථ හා සම්බන්ධ පැහැර ගැනීම
- විරෝධතා ව්‍යාපාර හා පෙළපාලි විසුරුවා හැරීම සහ එවන් අරමුණු සඳහා පොලිසිය විසින් ගිනි අවි භාවිතා කිරීම

### 5.2.12 විවිධ හැකියාවන්ගෙන් යුත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ මාධ්‍ය නිවේදනය

- අබලතාවන් සහිත පුද්ගලයින් විසින් මුහුණ දෙනු ලබන ගැටලු සහ 2006 අංක 01 දරණ ප්‍රවේශයන් පිළිබඳ රෙගුලාසින් 2009.09.18 දිනැති විශේෂ ගැසට් නිවේදනය මගින් 2014 දක්වා කල් දමා තිබීම පිළිබඳ කාරණාව
- ඉහත සඳහන් කළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා දැනටමත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පියවර ගෙන තිබේ.
- ප්‍රවේශයන් පිළිබඳ රෙගුලාසි කිසිවක් උල්ලංඝනය වී තිබේද යන්න කොමිෂන් සභාවට දැනුම්දීම සඳහා පුද්ගලයන්ට ආරාධනා කිරීම

### 5.2.13 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෑතකාලීන කටයුතු පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව

- බන්ධනාගාරයන්හි හා රිමාන්ඩ් බන්ධනාගාරයන්හි පවතින තදබදය
- කාත්තාන්කුඩි හි පාසල් සිසුවියන් දෙදෙනෙකුට සිදුවූ හිරිහැරය
- සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු
- ඉහළ එලදායිත්වයෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද ?

### 5.2.14 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර සංක්‍රමණික දිනය වෙනුවෙන් නිකුත් කරන ලද පණිවුඩය

- විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික සේවකයින් මිලියන 1.8 කට අධික සංඛ්‍යාවක් සිටින අතර වසරකට විදේශගත වන සංඛ්‍යාව 250,000 ක් බව සඳහන් කෙරිණ.
- රටේ ආර්ථික සංවර්ධනය සඳහා සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය හඳුනාගැනීම වැදගත්ය.
- සත්කාරක රටවල්හි ඔවුන්ගේ දේශීය බලපැවරුම තුළ සංක්‍රමණික සේවකයින්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණාත්මක පියවර ගැනීම අවශ්‍ය වේ.

## හයවැනි පරිච්ඡේදය

# විදේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

### 6.1. ජාතික මානව හිමිකම් ආයතන සඳහා එක්සත් ජාතීන්ගේ ආධාර - මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන, ශ්‍රී ලංකාව 2012

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වූ එක්සත් ජාතීන්ගේ ආධාරය 2009 වසරේ නොවැම්බර් මස ආරම්භ වූ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන හරහා 2009 සිට ක්‍රියාත්මක කර තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යළි ' ශ්‍රේණිය දක්වා උසස් කිරීමට ආධාර කිරීම සඳහා වූ 2008 වසරේ පවත්වන ලද මානව හිමිකම් පිළිබඳ කවුන්සිල් රැස්වීමේදී ඔවුන් විසින් ලබා දෙන ලද පොරොන්දුවෙන් පසුව ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීම මත එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් මෙම ව්‍යාපාතිය ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වුයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත තාක්ෂණික හා මුල්‍යමය ආධාර සැපයීම වේ. 2007 වර්ෂයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව A ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා පහළ වැටීමටත් 2009 දී එය යළි තහවුරු වීමටත් හේතු වූ කාරණා ලෙස ජාතික මානව හිමිකම් ආයතන සඳහා වන ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුව (ICC) විසින් හඳුනාගන්නා ලද ප්‍රධාන ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් ඵලදායිතාවය ශක්තිමත් කිරීම මෙම ආධාරය මගින් ඉලක්ක කෙරේ. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහ එක්සත් ජාතීන්ගේ ජ්‍යෙෂ්ඨ මානව හිමිකම් උපදේශකගේ මුල්‍ය හා තාක්ෂණික ආධාර සහිතව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තම කාර්ය මණ්ඩලය සමග ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල හරහා ඒකාබද්ධ වැඩසටහන ක්‍රියාත්මක කළේය. 2012 වර්ෂයේදී OHCHR හා UNHCR යන ආයතන දෙකම ඒකාබද්ධ වැඩසටහනට මුල්‍ය ආධාර සැපයුහ.

වාර්තා කරන 2012 වසර කාලසීමාවේදී එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පහත සඳහන් අංශ ඇතුළුව එහි මූලික බල පැවරුම් ක්ෂේත්‍ර සඳහා තවදුරටත් ආධාර කරන ලදී.

මානව හිමිකම් කොමිෂන් සභාවේ උපාය මාර්ගික දර්ශනය ජ්‍යෙෂ්ඨ මානව හිමිකම් උපදේශක හරහා ආසියානු ශාන්තිකර සංසදය, UNDP ප්‍රාදේශීය කාර්යාලය හා OHCHR යන ආයතනයන්ගෙන් සමන්විත ත්‍රෛපාක්ෂික කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ දින 21ක හැකියා ඇගයුමක් සිදු කරන ලදී. මෙම ක්‍රියාකාරකමට අදාල පසුවිපරමේදී හැකියා ඇගයීමේ නිර්දේශ, ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම, LLRC නිර්දේශ හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අයත් ජාතික තලයේ හා ප්‍රාදේශිය තලයන්හි සියලුම නිලධාරීන් සමග වූ පුළුල් සාකච්ඡා මත පදනම් වූ තුන් වසරක උපාය මාර්ගික සැලසුමක් බිහි කිරීමේදී එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පහසුකම් සපයන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සියලුම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය පැවති මෙම වැඩමුළුවේ ප්‍රතිඵල මත පදනම්ව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2012 වසර සඳහා වන තම ක්‍රියාකාරී සැලසුම සකස් කළේය. එක්සත් ජාතීන්ගේ ජ්‍යෙෂ්ඨ මානව හිමිකම් උපදේශක හා කොමසාරිස්වරුන් අතර වූ ක්‍රමික රැස්වීම් හරහා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මධ්‍යම කමිටු රැස්වීම්වල UNDP හි ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරීවරයාගේ සහභාගිත්වයද හරහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් හා කටයුතු පිළිබඳව තම දෘෂ්ටිකෝණය නිතිපතා සන්නිවේදනය කිරීමට එක්සත් ජාතින්ගේ සංවිධානය උත්සාහ දරා තිබේ.

**ප්‍රාදේශීය කාර්යාල -** එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන තාක්ෂණික පුහුණුවීම් ලබාදීම, උපකරණ සැපයීම, නීති උපදෙස් පතන්නන්ට ආධාර කිරීමට අරමුදල් සැපයීම හා සිවිල් සමාජ සමග සම්බන්ධවීම යනාදී ආකාරයන් මගින් ප්‍රාදේශීය කාර්යාලයන් වෙත ආධාර සැපයීම තවදුරටත් ඉදිරියට ගෙන ගියේය. ඒකාබද්ධ වැඩසටහන හරහා, 2012 වර්ෂයේදී කිලිනොච්චියේ ජංගම සෞඛ්‍ය සායනයක් පැවැත්වීමට UNHCR ආධාර කළ අතර එමගින් උතුරු පළාතේ තවමත් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා නොමැති යුද්ධයෙන් විපතට පත් ප්‍රදේශ සඳහා සේවා සැපයේ.

**ජාතික ප්‍රතිපත්තිය හා ව්‍යවස්ථාකරණය :** 2012 වසරේදී මානව හිමිකම් කොමිෂන් සභාවේත්, එක්සත් ජාතීන්ගේ සංගමයේත් පාර්ලිමේන්තුවේත් සහයෝගය ඇතිව පාර්ලිමේන්තු ව්‍යාපෘතිය මගින් ජාත්‍යන්තර මානව හිමිකම් නීති හා ප්‍රමිතීන් පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් තුළ සංවේදිතාවයක් ඇති කිරීම සඳහා සැලසුම් කරන ලද උපදෙස් සාකච්ඡා මාලාවක ප්‍රථම උපදෙස් රැස්වීම හා අධ්‍යාපනික සමුළුවක් සංවිධානය කෙරුණි.

පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තු පරිශ්‍රයතුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 73 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව මානව හිමිකම් පිළිබඳව සම්පූර්ණ දිනක අධ්‍යයන සමුළුවක් පවත්වන ලදී. මින් අනතුරුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් හා එක්සත් ජාතීන්ගේ කණ්ඩායම යනාදීන් අතරේ මානව හිමිකම් පිළිබඳ සංවාදයක් පැවැත්විණ.

මානව හිමිකම් පිළිබඳ තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා ද ව්‍යාපෘතිය පාර්ලිමේන්තුව සමග එක්ව කටයුතු කරයි. ප්‍රථම පියවර වශයෙන් ව්‍යාපෘතිය පිලිපීන පාර්ලිමේන්තුවේ මානව හිමිකම් පිළිබඳ තේරීම් කාරක සභාව සහ එහි කථානායකවරයා හමු වී සාකච්ඡා කිරීම සඳහා නියෝජ්‍ය කථානායකවරයාට සහ තවත් මන්ත්‍රීවරයෙකුට නිරාවරණ සංචාරයක් සංවිධානය කළේය.

වැඩිහිටි අයිතිවාසිකම් හා ජාතික ප්‍රතිපත්ති සම්පාදක බලාධිකාරයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායම (OEWG ය)සඳහා වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳව හා නිර්දේශ සකස් කිරීම පිළිබඳව ප්‍රාදේශීය හා ජාතික මට්ටමෙන් උපදෙස් සාකච්ඡා මාලාවක් පැවැත්වීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට තාක්ෂණික හා මූල්‍ය ආධාර ව්‍යාපෘතිය විසින් සපයන ලදී.

සිවිල් සමාජය සමග සම්බන්ධ වීම, සිවිල් සමාජ ක්‍රියාධරයන් පිළිබඳ පුළුල් විහිදුමක් ඇතුලත් වන නිර්මාණාත්මක ජාතික හා ප්‍රාදේශීය මට්ටම් හි කාර්තුමය සංවාද / උපදෙස් සාකච්ඡා සඳහා ව්‍යාපෘතිය විසින් ආධාර සැපයීම තවදුරටත් ඉදිරියට ගෙන ගියේය.

2012 වසරේදී ව්‍යාපෘතියට ජාතික මට්ටමේ රැස්වීම් දෙකකට පමණක් ආධාර කිරීමට හැකි වුවද ප්‍රාදේශීය කාර්යාල හරහා රැස්වීම් / උපදෙස් සාකච්ඡා 34 ක් පැවැත්වීම සඳහා ව්‍යාපෘතිය ආධාර සැපයුවේය. මෙකී උපදෙස් සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශීය කාර්යාල 7 ක් විසින් සිවිල් සමාජය සමග වූ ක්‍රියාකාරී සැලසුම් 7 ක් සම්පාදනය කර තිබෙන අතර ඒවා දැනට ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

ව්‍යාපෘතිය පුහුණු මොඩියුලයක් සම්පාදනය කිරීම මගින් හා ප්‍රාදේශීය කාර්යාල හරහා බාහිර විශේෂඥයින්ගේ සහයෝගය ඇතිව සිවිල් සමාජයේ ඉල්ලීම මත ඔවුන් සඳහා දින දෙකක නේවාසික පුහුණුවීම් 10 ක් පැවැත්වීම මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ආධාර කළේය. එසේම ව්‍යාපෘතිය මාධ්‍යවේදීන් සඳහා දින 2 ක නේවාසික පුහුණුවක්ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හරහා මානව හිමිකම් සම්බන්ධයෙන් වූ දින 3 ක පුහුණුවක් තරුණ පිරිස් සඳහා ද පැවැත්වීමට ආධාර කළේය.

**මහජන වාර්තාකරණය :** එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ වැඩසටහන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සඳහා ත්‍රෛභාෂා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා ආධාර කර ඇති අතර එය පවත්වාගෙන යාමටද තම කල් ඉක්මවූ වාර්ෂික වාර්තා ප්‍රසිද්ධ කිරීම, මාධ්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ද ආධාර කර ඇති අතර මාධ්‍ය හමු පැවැත්වීමට ද ආධාර කර තිබේ.

ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක - තනුජා නවරත්න මිය

## 6.2 යුනිසෙෆ් මගින් අරමුදල් සැපයෙන ව්‍යාපෘතිය

ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වාර්තා කිරීම හා ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රජාවේ විශ්වාසය වර්ධනය කරන්න  යන තේමාව යටතේ වූ විශේෂ ව්‍යාපෘතියක් සඳහා 2012 ජුලි මස 25 දින යුනිසෙෆ් ආයතනය විසින් අරමුදල් සැපයුණි.  ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක හයක් ආවරණය කළ අතර  ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් විසින් ඉහත අරමුණ සැපිරීම සඳහා වන විවිධ තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳ ක්‍රියාකාරකම් පවත්වන ලදී. පහත සඳහන් වැඩසටහන් 2012 වසර වෙනුවෙන් සංවිධානය කෙරුණි.

| ප්‍රදේශය | වැඩසටහන් වර්ගය | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| උතුරු පළාත<br>යාපනය හා කිලිනොච්චි<br>දිස්ත්‍රික්ක | දැනුම්වත් කිරීමේ රැස්වීම් | 17<br><br>12 |
| උතුරු පළාත<br>වවුනියාව, මන්නාරම හා<br>මුලතිවු දිස්ත්‍රික්ක | දැනුම්වත් කිරීමේ රැස්වීම් | 12<br>03 |
| | **වැඩමුළු** | **05** |
| | **ක්ෂේත්‍ර මෙහෙයුම්** | **05** |
| **මධ්‍යම පළාත**<br>**නුවරඑළිය දිස්ත්‍රික්කය** | **දැනුම්වත් කිරීම්** | **07** |

ව්‍යාපෘති සම්බන්ධීකාරක -  ශිරානි රාජපක්ෂ, අධ්‍යක්ෂක, අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්

හත්වැනි පරිච්ඡේදය

# 2012 වර්ෂය තුළදී මානව හිමිකම් පිළිබඳ පැවති තත්ත්වය

## නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමේ අවශ්‍යතාවය

වර්තමාන සන්ධර්භය තුළ වැදගත් කාරණයක් වන්නේ නීතියේ ආධිපත්‍ය සුරැකීමේ අවශ්‍යතාවයයි. නිරෝගී ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා රජයේ ප්‍රධාන ආයතන තුන අතර බලතුලනය සහ එකිනෙකා කෙරෙහි ගෞරවයෙන් හා අන්‍යොන්‍ය අවබෝධයෙන් කටයුතු කළ යුතුව ඇත. ඒ මගින් වඩා හොඳ සංවරණයක් පවත්වා ගැනීමේ අවස්ථාව හා හැකියාව උදාවනු ඇත. පසුගිය කාලයේ මතු වූ අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කිරීමේ ක්‍රියාකලාපය පවතින නීතියට අනුකූල වෙතත්, ඒ සම්බන්ධ සමස්ථ ක්‍රියාවලියම ගමන් කළ ආකාරය අධිකරණයේ ස්වාධීනත්වය මෙන්ම ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර ගැටළුවක් කරා ගමන් කිරීමේ ස්වභාවයක් දක්නට ලැබුණි. මෙය නීතිය කෙරෙහි ජනතාවගේ විශ්වාසය දුර්වල කරන්නක් වන අතර, එකිනෙක ආයතන තමන්ගේ සීමාවන් තුළ ස්වාධීනව හා අපක්‍ෂපාතීව ක්‍රියා කරනු දැකීමේ ජනතා අපේක්ෂාව බිඳ වැටීමටද හේතු වන්නක් වේ. අධිකරණයට ස්වාධීනව ක්‍රියා කිරීමේ හැකියාවක් නොමැත්තේය හෝ එකී ස්වාධිනත්වය දුර්වල වන ආකාරයෙන් වෙනත් ආයතන ක්‍රියා කරන්නේය යන හැඟීම ජනතාව තුළ ඇතිවීම හානිකර මෙන්ම එය නීතියේ ආධිපත්‍ය දුර්වල කිරීමටද හේතුවක් වනු ඇත. මෙකී දෝෂාභියෝග ක්‍රියාවලියේදී පවතින නීතියේ අඩුලුහුඩුකම් හඳුනාගෙන එය සකස් කර අධිකරණයේ ස්වාධීනත්වය වඩාත් තහවුරු කරන ආකාරයේ නීතිමය ප්‍රතිපාදන සැළසීමේ ක්‍රියාවලියකට ගමන් කිරීමේ සාකච්ඡාවක් ඇති කර ගැනීමට මෙය ඉතා හොඳ අවස්ථාවක් විය. එහෙත් මෙකී අවස්ථාව එකිනෙක පාර්ශවයන් විසින් පොදු ප්‍රතිපත්තිමය කාරණයන් ඉස්මතු කිරීමකට වඩා එකිනෙකා කෙරෙහි ඇති කරගත් ගැටුමක් ලෙස ගැටුම්කාරී ස්වභාවයෙන් ක්‍රියා කරන්නට විය. අනෙක් අතට එය දේශපාලන පක්‍ෂ අතර එකිනෙක පක්‍ෂ වල බලය පෙන්නවීමේ හා පක්‍ෂ කෙරෙහි ජනතා ආකර්ෂනය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ලෙසටද සිදුවීම් පෙළගැසෙනු දක්නට ලැබුණි. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවකට තිබූ අවස්ථාව මගහැරී ගිය අතර, එය වඩාත් අහිතකර ලෙස සමාජගත විය. අධිකරණයේ ස්වාධීනත්වය ඉතා ඉහළ මට්ටමක පැවතිය යුතුවා මෙන්ම ඒ සඳහා විනිසුරුවරුන්ට ස්වාධීනව කටයුතු කිරීමේ උපරිම අවස්ථාව ඇති වන ආකාරයට නීතිය සංශෝධනය විය යුතුව ඇත. වෘත්තීමය ගැටළුවකින් තොරව බිය හා සැක රහිතව සාධාරණව හා අපක්ෂපාතීව කටයුතු කිරීමේ ඉඩකඩ ඔවුනට නීතිය මගින් තහවුරු කළ යුතුව ඇත. මෙහිදී විනිසුරුවරයෙකු ඉවත් කිරීමේ ක්‍රියාදාමයද විනිවිඩභාවයකින් යුතු ස්වභාවික යුක්ති මූලධර්මයන් අනුගමනය කරන ක්‍රමවේදයක් තිබිය යුතුය. විනිසුරුවරයෙකු ඉවත් කිරීමේදී දැනට අනුගමනය කරන ක්‍රමවේදයන් දෝෂාභියෝග ක්‍රියාදාමය ඊට වැඩි සාධාරණ වූ හා පුළුල් වූ ක්‍රියාදාමයකට ගමන් කිරීම වඩා ප්‍රජාතන්ත්‍රවාදී හා වඩා යෝග්‍ය වනු ඇත. මෙහිදී පොදුරාජ්‍ය මණ්ඩලීය ලතිමර් මූලධර්ම ගරු කරමින් විනිසුරුවරයෙකුට එරෙහි චෝදනා සුදුසු වෙනත් මණ්ඩලයක් මගින් විමර්ශනය කිරීමද එය නැවත දෝෂාභියෝග ක්‍රියාවලිය හා සම්බන්ධ කිරීමද හෝ වෙනත් එවැනි සුදුසු ක්‍රමවේදයක් යොදා ගැනීමේ උචිත බව පිළිබඳව සංවාදමය කතිකාවතක් ආරම්භ කිරීම අවශ්‍යව පවතී. නීතිය කෙරෙහි ජනතා විශ්වාසය වඩාත් පිළිගැන්විය හැක්කේ එවැනි කතිකාවතක් හරහා ගොඩනගා ගන්නා ව්‍යුහයක් තුළය. එකී අවස්ථාව ඉක්ම ගියද එවැනි සම්බාදකයක අවශ්‍යතාවය තවදුරටත් වලංගුව පවතී.

## අතුරුදන් වූ හා ආගිය අතක් නොමැති පුද්ගලයෝ

අතුරුදන් වූවන් පිළිබඳ විමර්ශන කමිටුව හා දේශපාලන සිරකරුවන් නිදහස් කර ගැනීමේ ව්‍යාපාරය ඒකාබද්ධව අතුරුදන් වූවන් පිළිබඳ කාන්තා විරෝධතා පෙළපාලියක් සංවිධානය කර තිබුණි. ප්‍රධාන වශයෙන් උතුරු නැගෙනහිර කාන්තාවන් 25 දෙනෙකු පමණ මෙම සංකේතාත්මක පෙළපාලියට එක් වූ අතර කොච්චිකඩේ හින්දු කෝවිලක සිට තවත් හින්දු කෝවිලක් පින්තුපිටිය හින්දු කෝවිල දක්වා වූ මාර්ගවල පෙළපාලියෙහි නිරත වූහ. ඔවුහු කපුරු ගිනි හට්ටි ඔවුන්ගේ සංස්කෘතික සම්ප්‍රදායන්ට අනුව ඔසවා ගෙන ගියහ. අතුරුදන් වූ තම ස්වාමිපුරුෂයන්, පියවරුන්, පුතුන් පිළිබඳ තොරතුරු ඉල්ලා යාඥා කොට කන්නලව් කළහ. සමහර පුද්ගලයන් සුදු වෑන් රථ මගින් පැහැරගෙන යන ලද බව දනිති. බහිර් අධිකරණ අත් අඩංගුවට ගැනීම් හා පැහැරගෙන යාම් යනාදිය ප්‍රජාතන්ත්‍රවාදයකදී පිළිගත නොහැක.

LLRC වාර්තාව තවදුරටත් මෙසේ වාර්තා කර තිබුණි :
පොලිස් ස්ථානයන් වෙත, මානව හිමිකම් කොමිෂන් සභාව වෙත හා රතුකුරුස සමාජය වෙත විධිමත් පැමිණිලි කර ඇති බව අවස්ථා ගණනාවකදී අනාවරණය විය. සමීප නෑදෑයෝ අතුරුදන් වූ මෙකී පිරිස් ආගිය තැන් තවමත් නොදන්නා බැවින් තවදුරටත් පැමිණිලි කරමින් සිටිති. මෙකී චෝදනා නිසි පරිදි විමර්ශනය කරන බවත් අපරාධකරුවන් නීතිය හමුවට ගෙනෙන බවත් තහවුරු කිරීම සඳහා ක්ෂණික පියවර ගැනිම වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් යොමු කිරීමට රජය බැඳී සිටී. බාර වීම මගින්  හෝ අත් අඩංගුවට ගැනීම මගින් රජයේ බලධාරීන් විසින් තම භාරයට  ගනුලබන සෑම පුද්ගලයෙකුගේම ආරක්ෂාව හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම රජයේ වගකීම වේ.

## අදහස්

සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම යනාදිය ඇතුළත් විවිධ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම් ගණනාවක් රජය විසින් යෝජනා කර තිබේ. LLRC නිර්දේශ පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුම අවංකත්වයෙන් ක්‍රියාත්මක කළ යුතු වේ. මෙකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම ජාතික සමගිය හා සාමය ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. රජය රටෙහි සාමය, ස්ථාවරත්වය හා වර්ධනය සහිත යුගයකට මගපෙන්වීම සඳහා ඇතුළත හා පිටත පවතින උග්‍ර ජාතිභේදවාදී හා අන්තවාදී දේශාභිමානී මූල ධාතු නොසලකා හැර ඉදිරියට යා යුතුය. වඩාත් වැදගත් ලෙස නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කළ යුතු අතර පළිගැනිම් සඳහාත් එදිරිපිරිමැහුම් සඳහාත් ඉඩක් නොතිබිය යුතුය.

රටේ පරිපාලනයේදී අනුප්‍රාප්ති රජයන් සමාජ සුබසාධන පියවරයන් යොදා ගෙන තිබීම නිසා ශ්‍රී ලංකාව 1948 වර්ෂයේ  නිදහස ලබා ගැනීමට පෙර සිටම සමාජ සුබසාධන රාජ්‍යයක් ලෙස පැවත ඇත.

1930 ගණන් වල මැද භාගයේදී සමාජ අඩු වරප්‍රසාද සහිත සමාජ පංතීන්ට අභිවෘද්ධිය සැලසීම සඳහා මූලිකව ආරම්භ කරන ලද සූරියමල් ව්‍යාපාරය වැනි ව්‍යාපාර සඳහා මෙය ආරෝපණය කළ හැකිය. එම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදය යටතේ අන්තර්ගත කොට ඇති සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් මෙන් නොව ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සඳහන් අයිතිවාසිකම් සඳහා නෛතික වලංගුභාවය ලබාදීම පිණිස පාර්ලමේන්තුව විසින් වර්තමානයේ ව්‍යවස්ථාවන් සම්මත කර නොමැති වුයේ වුවද ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සමාජ සුබසාධන පියවරයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ  දක්වා ඇති රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ විධි නියෝග මූලධර්ම හා මූලික යුතුකම් විධිවිධාන සලසයි. මෙලෙස, ජීවන තත්වයන්හි අඛණ්ඩ වර්ධනය, විවේකය පූර්ණ සතුටින් ගත කිරීම, රටේ පාලනයේදී සමාජ හා සංස්කෘතික අවස්ථාවන්, ප්‍රමාණවත් ආහාර, ඇඳුම් පැළඳුම් හා නිවාස යනාදිය ඇතුළත් ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් ආරක්ෂා කරමින් ජනතාවගේ සමාජ හා ආර්ථික සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණු මගින් ව්‍යවස්ථාදායකයට හා විධායකයට මගපෙන්විය යුතු බව මෙම මූලධර්ම සඳහන් කරයි.

2009 වසරේ රටේ පැවති අභ්‍යන්තර යුද්ධය අවසන් කිරීමෙන් පසු ආරම්භ කරන ලද මහා පරිමාණ වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2012 වර්ෂයේදීත් ඉදිරියට ගෙන යන ලදී. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 80%ක් දැනටද ජීවත් වන්නේ ග්‍රාමීය හා වැවිලි කර්මාන්ත  ප්‍රදේශ වලය. එම නිසා මාර්ග ජාලයන්, විදුලිය, ජලය, වාරිමාර්ග, පාසල්, මාතෘ සායන ගම නැගුම වැඩසටහනට ඇතුලත් කර තිබේ. 2012 වර්ෂයේදී **ගමකට එක් වැඩක්** යන යෝජනා ක්‍රමය යටතේ දිවයිනේ සෑම ගමකම එක ව්‍යාපෘතියක් නිර්මාණයකිරීම / ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියනයක් ලබා දුන් වැඩසටහනක් ද ආරම්භ කෙරුණි. රටේ විවිධ පළාත්වල මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී, රටේ කුඩා නගර ගණනාවක් අනෙකුත් පළාත් වල සිදුවන සංවර්ධන වේගය සමග සමගමනයක් ඇති කර ගැනීමට දැඩි උත්සාහයක නිරත වන බව හඳුනා ගැනිණි. එම නිසා, 2015 වසරේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂාවෙන් මෙම වසරේදී **පුර නැගුම** නම යටතේ රට පුරා පිහිටි නොදියුණු ප්‍රදේශීය සභා යටතට පැමිණෙන කුඩා නගර 108 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. මෙම වැඩසටහන යටතේ පොදු වැසිකිළි, ත්‍රිරෝද රථ ගාල් ඇතුළු රථ ගාල්, වෙළඳ සංකීර්ණ, සතිපොළ ප්‍රදේශයන්, ප්‍රාදේශීය සභා ගොඩනැගිලි, පුස්තකාල, ළමා උද්‍යාන, ප්‍රවේශ මාර්ග, පානීය ජලය හා විවේක ස්ථාන යනාදි යටිතල පහසුකම් අදාළ ප්‍රාදේශිය සභාවන් විසින් ඇති කළ යුතුය. පුරනැගුම වැඩසටහනට ඇතුළත් අංග කෙරෙහි අවධානය යොමු කරමින් උතුරු නැගෙනහිර පළාත්වල ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් වැඩසහටන් දියත් කෙරෙමින් පවතින බැවින් පුර නැගුම වැඩසටහන උතුරු නැගෙනහිර ප්‍රදේශ වලට පිටින් පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කෙරේ.

නාගරික පරිසරයේ තත්ත්වය දියුණු කළ බොහෝ ව්‍යාපෘති ආරම්භ කොට සම්පූර්ණ කළ නිසා 2012 වර්ෂයේදී නාගරික සංවර්ධනය ඉහළ ප්‍රවර්තන ශක්තියක් ලබා ගත්තේය. මෙම සංවර්ධනයන්හි අරමුණ වන්නේ ජීවත්වීමේ හා වැඩ කිරීමේ සාකල්‍ය පරිසරයක් රටට උරුම කිරීමයි. එම නිසා කොළඹ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ කෙරෙහි වැඩි අවධාරණයක් සිදුකරමින් වර්ෂය තුළදී මහජන උපයෝගිතා, විනෝදාත්මක පහසුකම් හා නාගරික අලංකරණය යනාදී වැඩසටහන් සඳහා අධික ප්‍රමුඛතාවක් ලබා දෙන ලදී.

මෙම වර්ෂය තුළ අවුරුදු 30කට ප්‍රථම ඉදි කරන ලද හා ජරාවාස වී පැවති පහළ මධ්‍යම පන්තියේ සහාධිපත්‍ය නිවාස ගණනාවක් 18000කටත් අධික පදිංචිකරුවන් පිරිසකට සෙත සලසමින් අළුත්වැඩියා කරන ලදී. වසර කිහිපයකට පෙර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ආරම්භ කෙරුණු ස්ථිර නොවන නිවාස දියුණු කිරීමේ වැඩසටහන් 2012 වර්ෂයේදී ඉදිරියට ගෙන යන ලදී. විදේශ සහයෝගය ඇතිව පුද්ගලික අංශය විසින් ඉහළ ආදායම් උපයන්නන් සඳහා බොහෝ සුඛෝපභෝගී නිවාස සංකීර්ණ ඉදි කෙරෙමින් පවතී.

අවතැන්වූ පුද්ගලයින් සඳහා ස්ථිර නිවාස ලබාදීම වෙනුවෙන් උතුරු - නැගෙනහිර පළාත් තුළ බොහෝ නිවාස යෝජනා ක්‍රම දියත් කර තිබේ.

රජයේ යළි පදිංචි කිරීමේ උත්සාහයන් මෙපරිද්දෙන් දියුණු කරමින් උතුරේ අවතැන් වූ පවුල් සඳහා විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘතියක් යටතේ ණය මුදල් ලබා දුන් අතර නිවාස ඉදිකිරීම් කටයුතු සහභාගිත්ව ප්‍රවේශයක් තුළින් සිදු කෙරිණ.

නාගරීකරණය හා ජනතාවගේ ජීවන ශෛලය වෙනස් වීමත් සමග සෑම නගරයකම නල ජලය සඳහා වන ඉල්ලුම වැඩි වෙමින් පවතී. සියළු ජනතාව වෙත පිරිසිදු පානීය ජලය සැපයිය යුතු අතර නගර හා පුරවර සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීමේදී අනෙකුත් ප්‍රදේශ සඳහා පානීය ජල හා වැසිකිළි පහසුකම් සැපයීම අනිවාර්ය කර තිබේ.

වසර 40 ක් පුරා ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය නොමිලේ ලබා දීම හේතුවෙන් හා එය අනිවාර්ය කර තිබෙන හේතුවෙන් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය 90.8% වේ. රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි ලබා දෙන විශ්ව විද්‍යාල අධ්‍යාපනයද නොමිලේ ලබා දේ. පාසල්හි සිංහල හා දෙමළ යන භාෂා දෙකම ඉගැන්වීම රාජ්‍ය ප්‍රතිපත්තිය වන අතර එමගින් කුඩා කළ සිට වාර්ගික එකමුතුව ප්‍රවර්ධනය කෙරේ. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය සඳහා සුදුසුකම් ලත් ගුරුවරුන් හිඟවීම වර්තමානයේ ගැටලුකාරී තත්ත්වයක් ඇති කර තිබේ. එසේම, පාසල් හරහා ඉංග්‍රීසි භාෂාව හා පරිඝනක අධ්‍යාපනය ඉගැන්වීම ද අවධාරණය කර ඇති කරුණකි.

2012 වර්ෂයේදී දිවයින පුරා ද්විතීක පාසල් 1000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය මෙකී පාසල්වල සිසුන්ගේ තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ ව්‍යාපාර ගණනාවකට ඇතුලත් වී ඇත. මෙලෙස රාජ්‍ය වෙළඳ සංස්ථාව හා එටිසලාට් සමාගම සමග වූ එක් ව්‍යාපාරයකදී අන්තර්ජාල පහසුකම් සමග ලැප්ටොප් දහසක් ලබා දෙන ලදී. ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු වන්නේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් අනුමත කරන ලද ගුරුවරුන් මගින් අන්තර්ජාලය හරහා පාසල් සිසුන්ට විෂය දැනුම ලබාදීම වේ. තවත් ව්‍යාපාරයක් වූ ඉන්ටෙල් ලංකා ව්‍යාපාරය දැනටත් ඉන්ටෙල් ලංකා විසින් පුහුණු කර ඇති පාසල් ගුරුවරුන්ට ඔවුන්ගේ විෂයයන් තුළට ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණය (ICT) ඒකාබද්ධ කරගැනීම සඳහා උදව් කරමින් ලෝකයේ සෙසු අය සමග උරෙනුර ගැටීමට සිසුන්ව සවි බල ගන්වයි.

විශ්ව විද්‍යාල ආචාර්යවරුන් විසින් එක දිගට ගෙන යන ලද වැඩ වර්ජනය ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති කළේය. රාජ්‍ය විශ්ව විද්‍යාලවල පවතින තදබල ඉඩකඩ හිඟය හේතුවෙන් සුදුසුකම් ලත් සිසුන් 150,000 කගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබන්නේ සිසුන් 22,000 ක් පමණි. ඔවුන්ගේ ගැටළුද විශ්ව විද්‍යාල වල නොවිසඳී පවතී. මීට අතිරේකව, Z ස්කෝර් ලකුණු ගැටළුව හේතුවෙන් තවත් සිසුන් 5800 ක් ඇතුළු කර ගැනීමේ ගැටළුවට විශ්ව විද්‍යාල වලට මුහුණදීමට සිදු වී තිබේ.

රාජ්‍ය විශ්ව විද්‍යාල පුද්ගලීකරණය නොකරන බව රජය දැඩි ලෙස ප්‍රකාශ කර තිබෙන නමුත් රටින් ඇදී යන විදේශ විනිමය ඉතිරි කරගැනීම සඳහා තත්ත්වයෙන් ඉහළ පෞද්ගලික අධ්‍යාපන ක්‍රමයක් ශ්‍රී ලංකාව තුළ පිළිගැනීමට එකඟ වී ඇත. ඒ අනුව වෛද්‍යවරුන්ගේ සංගමයේ විරෝධතාවය හේතුවෙන් අවශ්‍ය පුහුණුව රජයේ රෝහල් වලින් ලබාගැනීමට මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ශිෂ්‍යයින්ට නොහැකිවීම හේතුවෙන් නව ශික්ෂණ රෝහලක් සහිතව මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ක්‍රියාත්මක වෙමින් පවතී. රැකියා ලබාගෙන ඇති 95% ක් වූ ඉංජිනේරු උපාධිධාරීන් හා 90% ක් වූ MBBS උපාධිධාරීන් සමග සැසඳීමේදී කලා උපාධිධාරීන් රැකියා ලබාගෙන ඇත්තේ 29% ක් පමණි. එම නිසා ශාස්ත්‍රපති උපාධි විෂයයන්හි සංයුතිය වෙනස් කිරීම සඳහා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි වැනි භාෂාවන් පිළිබඳව අවධාරණයෙන් යුතු යෝජනාව අධ්‍යයනය කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා කාන්තාවන්ගේ හා පුරුෂයන්ගේ ආයු කාලය පිළිවෙලින් අවුරුදු 80 හා 76 දක්වා වර්ධනය වී තිබේ. මෙය සෞඛ්‍ය සේවාවන්හි හා ජනතාවගේ ජීවන තත්ත්වයන්හි වර්ධනයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ රජයේ රෝහල් සහ සෞඛ්‍ය සායන නොමිලේ සේවාවන් සපයන අතර විදේශිකයන් පවා ඇතුළුව සෑම අයෙකුටම මෙමගින් ප්‍රතිකාර ලබා ගත හැකිය. දිවයින පුරා ඇඳන් [3]73437 සහිතව රජයේ රෝහල් 593 තිබේ. මෑතකාලීනව කරන ලද සමීක්ෂණයකින් පෙන්නුම් කෙරෙන්නේ රෝහල් වල පවතින ඇඳන් වලින් 20% ක පමණ සිටින්නේ දුම්කොළ සහ මත්පැන් පානය කිරීමෙන් රෝගාතුර වූ රෝගීන් බවය. එසේම, රටේ රෝග වලින් 72% NCD වලට අයත් වන අතර ඒවා ප්‍රධාන වශයෙන් දුම්කොළ හා මත්පැන් සම්බන්ධ රෝගයන් වේ. දැනට සිගරට් පෙට්ටි වල ලිවීම මගින් කර ඇති අනතුරු ඇඟවීමට වඩා එළදායී ආකාරයක් වන රූප ස්වරූපයෙන් දුම්බීමට එරෙහිව අනතුරු ඇඟවීම පිණිස ගත්

[3] මහ බැංකු වාර්තාව 2012

උත්සාහයට සිගරට් බෙදාහරින්නෝ දැඩි ලෙස විරුද්ධ වූ අතර ඔවුහු මෙම කාරණාව අධිකරණය හමුවට ගෙන ගොස් තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය අධිකරණ තීරණයක් ලැබෙන තුරු බලා සිටී.

දියවැඩියාව, අධික රුධිර පීඩනය, පිළිකා, හෘදයාබාධ,  ආඝාත වැනි බෝවන රෝග පිළිබඳ බිය උපදවන වර්ධනයක් තිබේ. NCD සඳහා ප්‍රධාන අවදානම් සාධක වශයෙන් සැලකෙන්නේ අහිතකර ආහාර පුරුදු, රැකියා ආතති, කායික නිෂ්ක්‍රීයත්වය යනාදිය වේ. එම නිසා  සෞඛ්‍ය අමාත්‍යාංශය පාසල් සිසුන්, තරුණයන් හා මහජනතාව අතරේ නිසි ආහාර ලබාගැනීමේ හා ශාරීරික ව්‍යායාම කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ ව්‍යාපාර ප්‍රවර්ධනයක සක්‍රිය ලෙස නිරත වී සිටී. ඩෙංගු, ෆයිලේරියා හා මෑතකදී මැලේරියා - අවුරුදු ගණනාවකට පෙරාතුව මුළුමනින්ම මෙන් තුරන් කර දැමූවකි මෙය.  මෙවැනි බෝවන රෝග ද තවමත් මහජනතාවගේ අවධානයට ලක්ව පවතී.

2012 සැප්තැම්බර් මස යාපනය අර්ධද්වීපය වසර 25කට පසු ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන ලද අතරක්‍රියාත්මක වර්ෂයේදී ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය ජාතික පද්ධතියට එකතු කරන ලදී. ජනතාව වෙත විදුලිබලය සපයන පද්ධතියක් බවට ජාතික ජාලකය පත් කිරීමේ අරමුණින් කුඩා පරිමාණයේ ජල විදුලි ව්‍යාපෘති 100කට අධික ප්‍රමාණයක් ඉදිකිරීම සඳහා පියවර ගැනේ. දැනටමත් පෞද්ගලික අංශය රටේ කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 100 ක් පමණ මෙහෙයවමින් සිටී. නොරොච්චෝලේ දෙවන අදියර ඉදිකිරීම් කටයුතු හා සාම්පූර්හි නව ගල් අඟුරු බලාගාරයේ කටයුතු සිදුවෙමින් පවතී. වාර්ෂිකව විදුලිය සඳහා වන පිරිවැය වැඩිවෙමින් පවතින බැවින් සූර්ය ශක්තිය, මුහුදු රළ, සුළං හා නැනෝ තාක්ෂණය වැනි විදුලිබලය හා සම්බන්ධ විකල්ප බල මූලාශ්‍ර සොයාගැනීමේ කටයුතු සිදුවෙමින්  පවතී. දැනටමත් සුළං බලය මෙගාවොට් 74 ක් ද, ජීව ස්කන්ධ  බලය මෙගා වොට් 11.5 ක් ද සූර්ය බලය මෙගාවොට්  1.4 ක් ද ජාතික පද්ධතියට[4] සම්බන්ධ කර තිබේ. 2012 ජූලි මාසයේදී ජාතික පද්ධතියට කිලෝවොට් 500 ක් එකතු කරමින් ආරම්භ කළ ප්‍රථම ඩෙන්ඩ්‍රෝ (ග්ලිරිසීඩියා) බලශක්ති බලාගාරය අනුරාධපුරයේ පිහිටා ඇත.

2011 මාර්තු මස දියත් කරන ලද **දිවි නැගුම** ජාතික වැඩ සටහන ආහාර සුරක්ෂිතතාව සැලසීම, කුසගින්න හා දරිද්‍රතාව තුරන් කිරීම සහ ජනතාවගේ පෝෂණ තත්ත්වයන් දියුණු කිරීමට උපකාර කිරීම යනාදිය ඉලක්ක කළේය. 2012 වර්ෂයේදී මෙම වැඩසටහන සියළු ක්ෂේත්‍රයන් තුළ විශේෂයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, කාර්මික හා ධීවර ක්ෂේත්‍රයන් තුළ අති විශාල සාර්ථකත්වයක් අත් කර ගත්තේය. වැඩසටහන දිස්ත්‍රික්ක 25 තුළම ක්‍රියාත්මක කළ අතර පොල් පැල, එළවළු බීජ, පළතුරු පැල, ඖෂධ පැළෑටි, සුළු අපනයන බෝග යනාදිය තෝරාගත් පවුල් අතරේ බෙදා හැරිණ. හතු වගාව, මී මැසි පාලනය, අලංකාර මල් වගාව වැනි ව්‍යාපෘති පටන් ගැනීම සඳහා සම්පත් සපයන ලදී. ශ්‍රී ලංකාවේ වගා කළ හැකි නමුත් දැනට විදේශ රටවලින් ආනයනය කරනු ලබන යම් යම් බෝග වගා කිරීම සඳහා ජනතාව පෙළඹවීමට පියවර ගෙන තිබේ. මෙකී බෝග වන්නේ මුං ඇට, රටකජු, වියළි මිරිස්, සෝයා,  ඉරිඟු වේ. දැනටමත් ශ්‍රී ලංකාව ඉරිඟු අපනයනය කිරීමට පටන් ගෙන තිබේ. මෙම වැඩසටහන යටතේ සිදු කරන කුකුල් පැටවුන් හා කිරි හරකුන් බෙදා හැරීම ඔවුන්ගේ පෝෂණ තත්ත්වය මෙන්ම පවුලේ ආදායම වැඩි කර ගැනීමටද උපකාරී වී ඇත. ගවයන් කුඩා ප්‍රදේශයක තබා ගනිමින් (ගව මඩුව) හා ක්‍රමානුකූලව ආහාර සපයමින් කිරි නිෂ්පාදනය වැඩි කරගත හැකි බවට සොයාගෙන තිබේ. එසේම මෙම අරමුණු සඳහා ගවමඩු 5292 ක් ඉදි කර තිබේ. 2012 වර්ෂය තුළ මෙම වැඩසටහන යටතේ එළුවන් ඇති කිරීමද සැලකිය යුතු ප්‍රගතියක් අත් කර දී තිබේ. වර්ෂය තුළ ධීවර ව්‍යාපෘති 6000කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කර තිබෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු ක්ෂේත්‍ර වල පවා අලුත් මාළු ලබාගත හැකි ව ඇත. වතු කම්කරුවන් තම සුපුරුදු වැඩ වලින් පසු ක්ෂණිකව සුරා සැල් වලට යාම වෙනුවට ඔවුන්ගේ මත්ස්‍ය පොකුණු වල වැඩට යන බවට වාර්තා වී තිබේ.

2012 වර්ෂය තුළ මිනිස් ජාවාරම ප්‍රධාන වශයෙන් සැලකිල්ලට භාජනය වූ කාරණාවක් විය. ඔස්ට්‍රේලියාවට යෑමට උත්සාහ දැරීමේදී 2000 කට වඩා අධික සංඛ්‍යාවක් අත් අඩංගුවට ගැණින. නව අවස්ථාවන් සපයන ස්ථාන සොයාගැනීම සඳහා සිංහල, දෙමළ හා මුස්ලිම් යනාදී  සියලුම ජාතීන්ට අයත් පුද්ගලයින් පොලඹවා තිබෙන අතර මෙම ක්‍රියාදාමය කිසියම් ජාලයක් විසින් මෙහෙයවනු ලැබේ. එසේම ඔවුන්ගේ දේශීය නියෝජිතයන් අහිංසක ජනතාවට මෙකී අවදානම් සහිත මුහුදු ගමන් වල නිරත වීමට පොළඹවති. කෙසේ වෙතත්, ඔස්ට්‍රේලියානු රජය මේ සම්බන්ධව දැඩි පියවර ගැනීමත් සමග හා මෙකී බෝට්ටු ප්‍රථමයෙන් ක්‍රිස්මස් දූපත වෙතටත් පසුව පැපුවා නියුගිනියාවටත් හරවා යැවීමත් සමග මෙම ක්‍රියාදාමයේ අඩුවක් පෙනෙන්නට තිබේ.

සමාජය තුළ කාන්තාවන් දරුවන් සංක්‍රමණික සේවකයන් කායික හා මානසික ආබාධ සහිත පුද්ගලයින් හා වයස්ගත වූවන් හා විශේෂ රැකවරණයට හා අවධානයට  ලක් වීමේ අවශ්‍යතාවයෙන් සිටින විපතට පත් විය හැකි කණ්ඩායම් වශයෙන් සැලකේ.

2012 වර්ෂය තුළදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා බොහෝ සංඛ්‍යාවක් මාධ්‍යයන් මගින් වාර්තා වුවද එකී ක්‍රියාකාරකම් ප්‍රමාණය සමස්තයක් වශයෙන් 2011 වර්ෂයේදී වාර්තා වූ මට්ටමට ළඟා වී නොමැත. කෙසේ වෙතත්, වර්ෂය තුළ සංක්‍රමණික කාන්තාවන්ට එරෙහිව සිදුවී ඇති බවට වාර්තා වී ඇති ප්‍රචණ්ඩ ක්‍රියා විශේෂ වර්ධනයක් පෙන්නුම්  කරයි. මෙම තත්ත්වය සෞදි අරාබිය, ජෝර්දානය වැනි ගල්ෆ් කලාපීය රටවල් හි ගෘහ සේවය සඳහා යන කාන්තාවන්ගේ වයස්සීමාව අවුරුදු 25 දක්වා වැඩි කිරීමටත්,

[4] මහ  බැංකු වාර්තාව  2012

අනාගත සේවායෝජකයෙකුට අනාගත සේවකයින් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම එක් සේවකයෙකු වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 1000 ක මුදලක් තැන්පත් කිරීමට අවශ්‍යතාවයක් ඇති කිරීමටත් වැනි පියවර ගණනාවක් ගැනීමට විදේශ සේවා ප්‍රවර්ධන අමාත්‍යාංශයට අවස්ථාව ලබා දුනි. තවත් වසර කිහිපයකින් ගෘහස්ථ සේවය සඳහා යන නුපුහුණු කාන්තාවන් මුළුමනින්ම නවතාලන ලෙසට රජය යෝජනා කරයි. 2012 වසරට අදාළ ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශයට අදාළ සංඛ්‍යා ලේඛන අනුව කාන්තා පිරිමි අනුපාතය 49% ට 51% කි. ශ්‍රී ලංකාව ගල්ෆ් රටවල් හි පවතින පුහුණු කාන්තා සේවක සංඛ්‍යා එනම්, කුඩා දරුවන් බලා ගන්නන්, කිරිමව්වරු, හෙදියන්, වෙළඳ සහායිකාවන් යනාදිය පිරවීමට අපොහොසත් වී තිබේ. හෙදියන් මැද පෙරදිග රටවල්හි රැකියාවට යාමට අකමැත්තක් දැක්වුවද රජය එවැනි රැකියා අවශ්‍යතාවයන් පිරිමැසීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරයි. ජාතික ළමා ආරක්ෂණ අධිකාරියෙන් ලබාගත හැකිව පවතින සංඛ්‍යා ලේඛනවලට අනුව ළමා ලිංගික සූරාකෑම වාර්ෂිකව වර්ධනය වෙමින් පවතී. පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් හා ක්ෂණික ඇමතුම් අංකය පිළිබඳව ලබා දී ඇති ප්‍රසිද්ධිය හේතුවෙන් අපයෝජන ක්‍රියාවන් පිළිබඳව වර්තමානයේ ජනතාව වඩාත් දැනුවත් බවත් අතීතයේදී මෙන් නොව මෙවන් ක්‍රියා පිළිබඳ සිද්ධි වාර්තා වන බවත් අධිකාරිය සඳහන් කරයි.

ශ්‍රී ලංකාවේ කායික ආබාධිතතා සහිත පුද්ගලයින්ගේ සැලකිය යුතු ප්‍රතිශතයක් ඇත. එය වසර 30ක යුද්ධය හේතුවෙන් විය හැකිය. මෙකී පුද්ගලයින්ටද ප්‍රජාවේ සමාජ, ආර්ථික හා සංස්කෘතික ජීවිතයට පූර්ණ ලෙස සහභාගි වීමට අයිතියක් තිබේ. කෙසේ වෙතත්, එවන් පුද්ගලයින්ට පොදු ගොඩනැගිලි හා පොදු ප්‍රවාහනය යන ස්ථාන කෙරෙහි ඇති සීමාසහිත ප්‍රවේශයන් ප්‍රජාව තුළ තම සාමාන්‍ය ජීවිතය භුක්ති විඳීමට බාධාවක් වී තිබේ. 1996 අංක 28 දරන දුබලතා සහිත පුද්ගලයින් ආරක්ෂා කිරීමේ පනත හා 2006 අංක 01 දරන එහි අන්තර්ගත ප්‍රවේශ වීමේ රෙගුලාසි සමාජ ජීවිතය සමසේ භුක්ති විඳීම වෙනුවෙන් එවැනි පුද්ගලයන් සඳහා අවශ්‍ය නෛතික රාමුව සපයා තිබේ. පොදු ගොඩනැගිලි / ව්‍යුහයන් යන වචන සඳහා මහජනතාව විසින් තම දෛනික ජීවිතයේ භාවිතා කරනු ලබන රජයේ හෝ පෞද්ගලික ගොඩනැගිලි වශයෙන් ඉතා පුළුල් අර්ථකථනයක් ලබා දී තිබේ. එම නිසා ආබාධිතයන් වෙනුවෙන් ප්‍රවේශ පහසුකම් ලබා දීම සඳහා බැංකු, රෝහල්, සාප්පු මධ්‍යස්ථාන, සුපිරි වෙළඳසැල් යනාදී සියල්ලම ඇතුළත් කර තිබේ. කෙසේ වෙතත්, කොළඹ නගරයේ පවා බැංකු හා හොඳින් සංවිධානය වූ වෙළඳ මධ්‍යස්ථානයන්හි ආබාධිතයන් සඳහා ප්‍රවේශ පහසුකම් සපයා නොමැති බව කෙනෙකු දැකිය හැක.

ශ්‍රී ලංකාව තුළ ජනතාවගේ ජීවන තත්ත්වයන් හා සෞඛ්‍යාරක්ෂණ පහසුකම් දියුණු වීමත්, ආයු කාලය වැඩිවීමත් සමග වියපත් බවට පත්වන ජනතාවගේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. අවාසනාවකට මෙන් මෙම කාරණාව සැලසුම්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් හා සෞඛ්‍ය බලධාරීන් විසින් ආමන්ත්‍රණය කර නොමැත. වැඩිහිටියන් සඳහා බොහෝ ප්‍රදේශවල දිවා මධ්‍යස්ථාන පවතින අතර එවා සඳහා වැඩිහිටි ලේකම් කාර්යාලය මූල්‍යාධාර සපයයි. සමාජ සේවා දෙපාර්තමේන්තුව මහජනතාවට සාධාරණ මිලකට ලබා ගත හැකි දිවා සුරැකුම් සේවා නිවසක් ආරම්භ කර තිබෙන නමුත් වැඩිවෙමින් පවතින ඉල්ලුම පිරිමැසීම සඳහා එම සේවාව දියුණු කළ යුතුව ඇත. කෙසේ නමුත් සේවා සඳහා ඉහළ මිලක් ගෙවීමට හැකියාව ඇති පුද්ගලයින් සඳහා බොහෝ පෞද්ගලික නිවාස හා දිවා, රාත්‍රී සුරැකුම් සේවා පවතී.

සමෘද්ධි හා දිවිනැගුම යෝජනා ක්‍රම යටතේ ජීවනෝපාය සංවර්ධන හා ආර්ථික සවිබලගැන්වීමේ වැඩසටහන් වැනි යෝජනා ක්‍රම මගින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම සැලකිය යුතු මට්ටමකින් අඩු කර තිබේ. දිළිඳු ජනතාවට අතිරේක ආදායම් උපයා ගැනීමට උපකාරී වන පිරිසිදු පොල් තෙල්, සිමෙන්ති ගල්, හඳුන්කූරු, ඉටිපන්දම් නිෂ්පාදනය වැනි දිවි නැගුමෙහි ජීවනෝපා සංවර්ධන වැඩසටහන් යටතේ බොහෝ ගෘහ කර්මාන්ත පවත්වා ගෙන යන ලදී. දිළිඳු ජනතාවගේ පවුල් වල සිදුවන මරණ, රෝහල්ගත කිරීම් හා ළමා උපත් වැනි අවස්ථාවන් වලදී ඇති විය හැකි අපහසුකාරී තත්ත්වයන් අවම කිරීම සඳහා සමෘද්ධි යෝජනා ක්‍රමය යටතේ විවිධ ජීවනෝපා වැඩසටහන් ආරම්භ කිරීමට ලබා දී ඇති ණය පහසුකම් නිතරම උපකාරී වී තිබේ.

2012 ට පෙර වර්ෂ දෙකේදී පැවති 8% ක ආර්ථික වර්ධනය වේගය හා සැසඳීමේදී 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය වී ඇත්තේ 6.4% ක් පමණි. දරිද්‍රතාවය අඩකට අඩු කිරීම, විශ්ව ප්‍රාථමික අධ්‍යාපනය ළඟා කර ගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම, 2-015 ඉලක්ක වර්ෂයට ප්‍රථම කාන්තා සවිබල ගැන්වීම යනාදිය ඇතුළු MDG ගණනාවක් රට ළඟා කරගෙන තිබේ. එසේම, 2016 වසරේදී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4000 ක ඉලක්කය අත්පත් කර ගැනීම සඳහා දැ-ඩි ලෙස උත්සාහ කරමින් සිටී. කෙසේ වෙතත්, LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීම මගින් වසර 30 ක වාර්ගික අර්බුදයක් ඇති කළ ගැටලු සඳහා විසඳුමක් ලැබෙනු ඇති බවට බලාපොරොත්තු වූ බැවින් LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඇති වී තිබෙන මන්දගාමිත්වය බොහෝ දෙනාගේ සැලකිල්ල යොමු වූ කාරණාවන් බවට පත් ව තිබේ. සියලු දෙනා දන්නා පරිදි වර්තමානයේ සිදුවෙමින් පවතින දැවැන්තසංවර්ධන වැඩසටහන්හි ඵල වර්තමාන හා අනාගත සියලු ශ්‍රී ලාංකිකයන්ට භුක්ති විඳිය හැකි වන්නේ සාමකාමී පරිසරයක් තුළ පමණි.

ඇමුණුම I:

# විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාව [UPR]
# 2 වන වටය, 14 වන සැසිය, 2-12 වෙත වූ ලිඛිත දේශණය

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව [HRCSL]


අංක 165 කින්සි පාර, බොරැල්ල, කොළඹ 8.
දුරකථනය : ++ 94 112 696 470 රැ,94 112 689 558
ෆැක්ස් : ++ 94 112 694 924
විද්‍යුත් තැපෑල : sechrc@sltnet.lk
වෙබ් අඩවිය : www.hrcsl.lk

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 18 වන සංශෝධන නියමය යටතට එන 1996 අංක 21 දරන පනත මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිහිටුවන ලද අතර ජනතාවගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පුළුල් කාර්ය එයට පවරා තිබේ.

පනතේ 10 වන වගන්තියට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් (10 (අ) වගන්තිය) ප්‍රතිපාදනවලට අනුකූල වීම සහතික කිරීමේ අරමුණින් යම් යම් ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් පැමිණිලි පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම, එබඳු අයිතිවාසිකම් උල්ලංඝනය වීම් හෝ උල්ලංඝනය වීමට අත්‍යාසන්න අවස්ථා පරීක්ෂා කර බලා සාමදාන කරවීම හා සමථකරණය මගින් ඒවාට විසඳුම් සැපයීම [ 10 (ආ-වගන්තිය].

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වලට අනුකූලව ජාතික නීති හා පරිපාලනමය පරිචයන් සකස් කිරීම සඳහාත් මානව හිමිකම් පිළිබඳ [ 10(B) වගන්තියෑදැනුම්වත් කිරීම හා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මතයන් පිලිබඳවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජයට උපදෙස් ලබා දේ. එසේම මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම සඳහා නීති සහ පරිපාලන නියමයන් හා ක්‍රියා පිළිවෙත් සකස් කිරීමේදී කොමිෂන් සභාවට ආණ්ඩුවට උපදෙස් ලබා දීම මගින් සහාය විය හැකිය. එසේම, මානව හිමිකම් වලට අදාළ ගිවිසුම් වලට දායක වීමේ හෝ එකඟවීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් රජයට නිර්දේශ ලබා දිය හැකිය. [ 10(ඉ) වගන්තිය.].

## හැඳින්වීම

1. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ප්‍රථම විශ්ව වාරානුකූල සමාලෝචනයේදී ඉදිරිපත් කරන ලද අවසාන නිගමන හා නිර්දේශ පිළිගනී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පසුගිය සමාලෝචනයේ නිර්දේශ පිළිබඳව ඇතිවූ ප්‍රගතිය අගයමින් හා තක්සේරු කරමින්ද ඊට අතිරේකව, සමාලෝචන කාලසීමාවේදී මානව හිමිකම් තත්ත්වය සමාලෝචනය කරමින්ද මෙම දේශනය ඉදිරිපත් කිරීම මගින් UPR ක්‍රියාදාමයට ප්‍රථම වතාවට සක්‍රිය ලෙස සහභාගි වේ.

මෙම ලිඛිත දේශනය සකස් කිරීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පසුගිය සමාලෝචනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රාජ්‍ය බලධාරීන් සමග අන්තර් සාකච්ඡා පැවැත්වූ අතර වාචික හා ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමින් සිවිල් සමාජය, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන යනාදියන්හි ප්‍රාදේශීය හා දේශීය මට්ටමේ සාමාජිකයන් සමගද අන්තර් සාකච්ඡා පැවැත්වූයේය.

## ජාත්‍යන්තර බැඳීම්

2. ශ්‍රී ලංකාව මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම් රාශියක පාර්ශවකරුවෙක් වේ. එසේ වුවද, රටේ මානව හිමිකම් රාමුව ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම් ස්ථිර කර දේශීය පරිසරයට ගළපා ගත යුතුව ඇත. එසේම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ගිවිසුම් වලට අනුව බැඳීම් සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකාව දිරිමත් කරයි.

2.1. පුද්ගලයින්ට කමිටුව වෙත ප්‍රවේශ වීමට හැකියාව ඇති කරමින්ද අන්තර්ජාතික සිවිල් හා දේශපාලන සම්මුතිය දේශීය නීතිය[5] තුළට පරිවර්තනය කරමින්ද ශ්‍රී ලංකාව විසින් ICCPR හා OPI අපරානුමත කර තිබීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අගය කරයි. ඒ අනුව CAT අපරානුමත කර තිබුනද, CAT සම්බන්ධයෙන් සිදු කර ඇති විශේෂ නියමයන් පිළිබඳව ශ්‍රී ලංකා රජය යළි සලකා බැලීම අවශ්‍ය වේ.

2.2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ESC අයිතිවාසිකම් භුක්ති විඳීම තහවුරු කිරීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ උත්සාහයන් නිරීක්ෂණය කරන අතරේ ICECSR හි විකල්ප සංධානය අපරානුමත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි.

2.3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රජයේත්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හා දේශීය රාජ්‍ය නොවන සංවිධානයන්ගේත් ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා වන මූලාරම්භයන් පිළිබඳ කැපවීම අගය කරන අතරේ, CRPD හා එහි විකල්ප සංධානය අපරානුමත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි. CRPD හි 33 වගන්තිය අනුව ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයක් ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නම් කළ හැකිය.

[5] 2007 අංක 56 දරන ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය පිළිබඳ පනත

2.4. අපරානුමත කරන ලද විවිධ ගිවිසුම් යටතේ ප්‍රවර්ධනය කරන ලද අයිතිවාසිකම් සැපිරීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සංශෝධන, පරිපාලනමය සැලසුම් හා වැඩසටහන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අගය කරයි. සාමයික වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය පියවර ගනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා රජය අදාළ රේඛීය අමාත්‍යාංශ කේන්ද්‍රිය ම්‍යස්ථාන ලෙස පත් කළ යුතු අතර නියමිත වේලාවට වාර්තා නිරීක්ෂණය කොට ඉදිරිපත් කිරීම සඳහා කමිටු පත් කළ යුතුය.

2.5. UPR යටතේ සිදු කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සන්නිවේදනය කිරීම පිළිබඳ රජයේ කාර්යභාරය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණය කරන අතර UPRට පෙර, එකී කාලය තුළ හා ඉන් පසු පළාත් සභා ඇතුළු රාජ්‍ය නිලධාරීන් අතරේ පුළුල් සාකච්ඡා ඇති කිරීමට හා දැනුවත්භාවය වර්ධනය කිරීමට කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි.

## දේශීය සැලකිල්ල
## 3. අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයෝ

2010[6] වසර ආරම්භයේදී අභ්‍යන්තරික වශයෙන් අලුතින් අවතැන්වූ පුද්ගලයින්ගේ සමස්ත සංඛ්‍යාව 317,7902[7] ක් වශයෙන්ද දිගුකාලීනව අවතැන් වී සිටින පුද්ගලයින් සංඛ්‍යාව 304,000 ක් වශයෙන්ද වාර්තා විය. අභ්‍යන්තරික ලෙස අවතැන්වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් යළි පදිංචි කර ඇති බව රජය ප්‍රකාශ කරයි. නමුත් සංග්‍රාහක පවුල් සමග ජීවත් වන අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් පිළිබඳව සහ තිරසාර විසඳුමක් අවශ්‍ය පුද්ගලයින් පිළිබඳව සලකා බැලීම අවශ්‍ය වේ. අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින්ට ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් පවතින අයිතිය තහවුරු කර තිබෙන අතර යටිතල පහසුකම් ගොඩනැගීම හා මූලික ආර්ථික අවස්ථාවන්[8] සඳහා ආධාර සැපයීම යනාදිය මගින් යළි පැමිණි ප්‍රදේශවලට ප්‍රත්‍යානුකලනය කිරීම සඳහා ද ඔවුන්ට පහසුකම් සලසා තිබේ. යළි පැමිණි පුද්ගලයින්[9] සඳහා නිවාස යෝජනා ක්‍රම ලබාදීම තුළින් ජනතාවගේ නිවාස අයිතිය තහවුරු කිරීම සඳහා රජය දරන උත්සාහය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අගය කරයි. කෙසේ වුවද, ඉඩම් පිළිබඳ ආරවුල් ගැටලුකාරී තත්ත්වයන් උග්‍ර කරන අතර රජය දැඩි අවධානයක් මේ සම්බන්ධයෙන් යෙදීම අවශ්‍ය වේ.

සම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින්ගේ හා යළි පැමිණි පුද්ගලයින්ගේ ගැටලු ආමන්ත්‍රණය කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජයට මෙලෙස යෝජනා කරයි.

(අ) නිශ්චිත කාලසීමාවක් තුළ මියගිය පුද්ගලයින්, තුවාල වූවන්, ඉඩම් අහිමිවීම හා දේපලවලට හානි සිදුවීම යනාදිය වෙනුවෙන් දැනට පවතින වන්දි ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙස

(ආ) ඉඩම් හා දේපල සම්බන්ධ ආරවුල් හි බරපතලකම හා ගැටුම් සංවේදිතාව සැලකිල්ලට ගනිමින් ඒ සඳහා සුදුසු රාජ්‍ය යාන්ත්‍රණයක්[10] ඇති කරන ලෙස

## 4. එච් අයි වී / ඒඩ්ස්

එච්අයිවී ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට 1987 වර්ෂයේදී සොයා ගත් අතර ගෝලීය වශයෙන් එහි ව්‍යාප්තිය අවම රටවල් අතරින් ශ්‍රී ලංකාවද එකකි. එහි ප්‍රතිශතය 0.1% කි. 2011 වසර අවසානයේදී රටේ මිලියන 20 ක ජනගහනයට[11] , සාපේක්ෂව එච්අයිවී ආසාදිත පුද්ගලයින් සංඛ්‍යාව 2000 - 4000 අතර ප්‍රමාණයක් සිටීමට හැකියාව ඇති බවට තක්සේරු කරනලද අතර ශ්‍රී ලංකාව 1463[12] සමුච්චිත අගයක් වාර්තා කළේය. එච්අයිවී වෛරසය සමග ජීවත් වන ප්‍රතිකාර සඳහා සුදුසුකම් ලත් සෑම අයෙකු සඳහාම ශ්‍රී ලංකා

---

[6] 2008 ඔක්තෝබර් සිට 2009 ජුනි දක්වා කාලය තුළ රජයේ පාලන ප්‍රදේශ වලට 285,018 ප්‍රමාණයක් ජනතාව පැමිණ තිබේ. (2009 ජුනි මස UNOCHA ඒකාබද්ධ වාර්තාව බලන්න)

[7] 2010 වාර්ෂික වාර්තාව අභ්‍යන්තරික ලෙස අවතැන්වූ පුද්ගලයින් සඳහා වන ජාතික ආරක්ෂණ හා තිරසාර විසඳුම්, මානව හිමිකම් කොමිෂන් සභාව, n.d
http://www.idpsrilanka.lk/html/Project%20Reports/ProjectProposal/Reports/Annual%20Reports/2010%20Annual%20Report,%20NPDS%20for%20IDPs%20Project,%20HRCSL.pdf , [20 February 2012]

[8] "ආහාර සඳහා සේවා" වැඩසටහන ගම්මාන යළි ගොඩනැගීමේදී ප්‍රජා සහභාගිත්වය දිරිමත් කළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. ග්‍රාමීය යටිතල පහසුකම් : වැඩසටහන හරහා වැව් යළි ගොඩනැගීම, පානීය ජල මූලාශ්‍ර, ග්‍රාමීය මාර්ග, ගෙවතු වගාව, ප්‍රජා ශාලා හා පාසල් ගොඩනැගීම යනාදිය සිදු කරන ලදී.

[9] උතුරු නැගෙනහිර නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ 2011 වසර අවසානය වන විට නිවාස ඒකක 49,488 සම්පූර්ණ කරන ලද අතර තවත් නිවාස 50,000 ක් සඳහා වන යෝජනා ක්‍රමයක් ආරම්භ කර තිබේ.

[10] මානව හිමිකම් කොමිෂන් සභාව 2012 දී ආරවුල් විසඳීම සඳහා විකල්ප යාන්ත්‍රණයක් යෝජනා කරන ලදී. (පිටු 30 - 32 අභ්‍යන්තරික අවතැන්වූවන්ගේ දේපල ගැටලු පිළිබඳ නෛතික විශ්ලේෂණය)
http://hrcsl.lk/PFF/Legal%20Analysis%20of%20property%20issues%20affecting%20internally%20Displaced%20Persons%20and%20Refugees%20in%20Sri%20Lanka.pdf

[11] http://www.aidscontrol.gov.lk/nsacp/ (accessed on 3rd March 2012)

[12] http://www.statistics.gov.lk/page.asp?page=Population and Housing (accessed on 3rd March 2012)

රජයේ STD සේවාව විසින් නොමිලේ (ART) චිකිත්සාව ලබා දෙනු ලැබේ.

එච්අයිවී ආසාධිත පුද්ගලයින් සේවාවන් ලබාගැනීමේදී සමාජ අපකීර්තියට හා වෙනස් කොට සැලකීමට ලක්වන අවස්ථා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කර තිබේ. මෙම එච් අයි වී ආසාදිත පුද්ගලයින් විසින් මුහුණ දෙනු ලබන අපකීර්තිය හා වෙනස් කොට සැලකීම අවම කිරීම පිළිබඳව රෝහල් කාර්ය මණ්ඩලය හා බලධාරීන් සංවේදී කිරීම සඳහා  පියවර රැසක් ගෙන තිබුනද පසුගිය කාලයේදී රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ප්‍රතික්ෂේප කිරීම හා එච් අයි වී ආසාදිත පුද්ගලයින්ගේ තත්ත්වයන් පිළිබඳ රහස්‍යභාවය උල්ලංඝනය කිරීම වැනි ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවන් රැසක් දැකිය හැක. ශ්‍රී ලංකාව සඳහා වන (2007 -  2011) ප්‍රධාන සෞඛ්‍ය සැලසුම හා එච් අයි වී වැළැක්වීම හා එච් අයි වී ආසාදිත පුද්ගලයන්ගේ රැකවරණය හා සම්බන්ධ ජාතික මාතෘ හා ළමා සෞඛ්‍ය ප්‍රතිපත්තිය යනාදිය යටතේ ශ්‍රී ලංකා රජයේ උපාය මාර්ගික නියමයන් එච් අයි වී ආසාදිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳව විශේෂිතව සඳහන් කර නොමැත. ශ්‍රී ලංකා රජය එච් අයි වී ආසාදිත පුද්ගලයින් හා සෞඛ්‍ය හා නෛතික සේවා සඳහා ප්‍රවේශයන් සහිත ගෞරවාන්විත ජීවිතයක් තහවුරු කිරීම වෙනුවෙන් LGBTIQ, IDU, CSW ප්‍රජාවන් වැනි ඉලක්කගත ප්‍රජාවන් සඳහා නීතිය පිළිබඳ දැනුවත් කිරීම් හා නොමිලේ නීති ආධාර සැපයීම තහවුරු කිරීම වෙනුවෙන් පියවර ගැනීම අවශ්‍ය වේ.

එසේම, සේවාදායකයින්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම තහවුරු කරන ලෙස පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් ඉල්ලා සිටින NDDCB ආයතනය විසින් නියම කරන ලද අවම ප්‍රමිතීන්ට අනුව මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පුනරුත්ථාපනය  කිරීමටත් රටේ පවතින පුනරුත්ථාපන මධ්‍යස්ථාන නියාමනය කිරීමටත් රජය විසින් එහි ධාරිතාවය වැඩි කිරීම අවශ්‍ය වේ.

**4.2** ජාතික රුධිර පාරවිලයන සේවා පනත් කෙටුම්පත[13] මේ වන තෙක් සම්මත කර නොමැත. රජයේ රෝහල්වල රුධිර පාරවිලයනය හරහා එච් අයි වී ශරීරගත වන පුද්ගලයින් සඳහා ශ්‍රී ලංකා රජය වන්දි ගෙවිය යුතු බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ කරයි.

## 5. ප්‍රකාශනයේ නිදහස

ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වශයෙන් තොරතුරු දැනගැනීම සඳහා වන අයිතිය සමග බැඳී ඇති ප්‍රකාශනයේ නිදහස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිගනී. එසේම, මාධ්‍යවේදීන් සඳහාත් මාධ්‍ය ආයතන සඳහාත් නිදහස් හා ආරක්ෂිත පරිසරයක් තහවුරු කිරීමට කොමිෂන් සභාව රජය දිරිමත් කරන අතරේ අවශ්‍ය සංශෝධන සහිතව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කරන ලෙසටද රජය දිරිමත් කරයි.

## 6. මානව හිමිකම් හා සමාජය

මානව හිමිකම් ප්‍රවර්ධනය කරනු ලබන හා ආරක්ෂා කරනු ලබන සිවිල් සමාජය, මානව හිමිකම් ආරක්ෂකයින්, ක්‍රියාධරයින්, අධ්‍යාපකයින්, ප්‍රවර්ධකයින් හා අධ්‍යාපන ආයතනයන් යනාදියෙහි සුවිශේෂී වටිනාකම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හඳුනාගනී.

පුද්ගලයින්ගේ ආරක්ෂාව හා මානව හිමිකම් ආයතනයන්හි තිරසාරභාවය තහවුරු කරන අතරේ සේවා අවශ්‍යතාවය සහිත පුද්ගලයින් වෙත ඒවා ළඟා කිරීමට හැකියාව ඇතිකිරීම වෙනුවෙන් රජය ඒවා හඳුනාගනිමින් පහසුකම් සැපයිය යුතුය. සමාලෝචන කාලසීමාව තුළදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මානව හිමිකම් ආරක්ෂකයින් 1340 දෙනෙක් පුහුණු කොට ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ වල සේවයේ යොදා තිබේ.

## 7. සිරකරුවන්ගේ අයිතිවාසිකම්

බන්ධනාගාරයන්හි[14] ඉඩකඩ තදබදය වැඩි කරමින් විවිධ බන්ධනාගාරයන්හි සිරකරුවන්ගේ වර්ධනයක් දක්නට ලැබේ. බන්ධනාගාරයන්හි තදබදය වැඩිවීමට හේතු වී ඇත්තේ අභිචෝදනා ප්‍රමාදයන්, විමර්ශන කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන්, ඇප ලබා

[13] ව්‍යවස්ථාදායක 2007 දී ජාතික රුධිර පාරවිලයන සේවා කෙටුම්පත කෙටුම්පත් කළ අතර එය විශේෂයෙන් HIV සඳහා රුධිර පරීක්ෂා කිරීම හා ජාතික රුධිර පාරවිලයන ප්‍රමිතීන් අත් කර නොගන්නේ නම් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සටහන් කරයි.

[14] 2010 වසරේදී විවිධ බන්ධනාගාරයන්හි වරදකරුවන් කළ සිරකරුවන් 32 128 ක් සිටි අතර වරදකරුවන් නොකරන ලද සිරකරුවන් 100,491 දෙනෙකු සිටියහ. 2010 අවසාන වන විට වරදකරු කරන ලද සිරකරුවන්ගේ තදබදය 194.6% වූ අතර වරදකරුවන් නොකරන ලද සිරකරුවන්ගේ තත්ත්වය 275.9% ක් විය. 2010 වන විට විවිධ බන්ධනාගාරයන්හි අනුමත දෛනික ඉඩ පහසුකම් වරදකරු කරන ලද සිරකරුවන් සඳහා 6,728 ක් වූ අතර වරදකරු නොකරන ලද සිරකරුවන් සඳහා එය 5,034 ක් විය. 2010 වසරේදී බන්ධනාගාර ආයතනයන්හි වරදකරු කරන ලද සිරකරුවන්ගේ දෛනික ජන සංඛ්‍යා සාමාන්‍ය 13,094 ක් වූ අතර වරදකරු නොකරන ලද අයගේ එම තත්ත්වය 13,890 ක් විය. තදබදය හේතුවෙන් බන්ධනාගාරයන්හි පහසුකම් විශේෂයෙන් ජල හා වැසිකිලි පහසුකම් ජාත්‍යන්තර බන්ධනාගාර ප්‍රමිතීන්ට අනුකූල නොවන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමිතීන්ටද අනුකූල නොවේ.මූලාශ්‍රය :
http://www.prisons.gov.lk/Statistics/Statics/Title4/4.1.pdf, accessed on 21.04.2012 at 4.00pm and
http://www.prisons.gov.lk/Statistics/Statics/Title3/3.1.pdf, accessed on 21.04.2012 at 4.02 pm

නොදීම් හෝ දැඩි ඇප කොන්දේසි[15] හේතුවෙන් ඇප කොන්දේසි පිරවීමට සිරකරුට ඇති නොහැකියාව යනාදිය වේ. 2000 සිට 2010[16] දක්වා සිරකරුවන් 1064කට මරණීය දණ්ඩනය නියම කර ඇති අතර 1977 වසරේ සිට මරණීය දඩුවම ක්‍රියාත්මක කර නොමැත. ඔවුහු අවම පහසුකම්[17] යටතේ ජීවත් වෙති.

අවසාන සිරගත කිරීමේ දණ්ඩනය නියමකළ කල්හි රැඳවුම් කාලය අඩු කිරීමේ ක්‍රමවේදයක් නොමැත. වරදකරු කරන ලද සිරකරුවන් සිරගත කිරීම අවම කිරීම සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව උපරිම දායකත්වයක් ලබා දෙමින් සිටී. එම නිසා ප්‍රජා පාදක විශෝධනයන් සඳහා යොමු කළ හැකි අපරාධ විෂයපථය ඉතා අවම වේ. බන්ධනාගාරයන්හි පවතින පහසුකම් පුළුල් කිරීමේ සහ අභිචෝදනා කඩිනම් කිරීම සඳහා අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමේ රජයේ ප්‍රයත්නයන්ට ගරු කරන අතරේ කිසිදු ප්‍රමාදයකින් තොරව නිසි පියවර ගැනීම[18] සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි.

## 8. ප්‍රතිකර්ම පියවර සඳහා වන අයිතිය :

පරිපාලකයින් සිය ක්‍රියාකිරීම් හා නොකර හැරීම් සඳහා වගකීම් දැරීමට සිදුකිරීම පිණිස අධිකරණ, අර්ධ අධිකරණ හා අනෙකුත් ආයතන නිර්මාණය කර තිබෙන අතර මහජන පැමිණිලි ලබාගැනීමටත් ඒවාට සහන හා ප්‍රතිකර්ම ලබාදීමටත් හැකිවනු පිණිස ඒවා සවිබල ගන්වා තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විශේෂයෙන් පශ්චාත් ගැටුම් යුගයකදී මෙකී ආයතනයන්හි[19] වැදගත්කම හඳුනාගනී. එසේම, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශිය මට්ටම්හි එකී සේවා පැවතීම හා ඒවාට ප්‍රවේශ වීමට ඇති හැකියාව අසතුටුදායක තත්ත්වයක ඇති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. එබැවින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටම් හි යාන්ත්‍රණ පිහිටුවීම සඳහා උක්ත ආයතනයන්හි ධාරිතා හැකියාව වර්ධනය කරන ලෙස ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි.

## 9. ඉඩම්, නිවාස හා දේපල අයිතිවාසිකම්

ඉඩම්, නිවාස හා දේපල සඳහා සම අයිතීන් තහවුරු කිරීම රජයේ විෂය පථයට යටත් වේ. දිළිඳු බව තුරන් කිරීමේ ප්‍රවේශයක් වශයෙන් දිළිඳු ජනතාවටත් , ඉඩම් අහිමි ජනතාවටත්, අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයින්ගේ[20] දෙවන පරම්පරාවටත් ඉඩම් බෙදා හැරීමේ

---

[15] 2010 වසර අවසාන වන විට සිරකරුවන් 3367 ක්(මුළු සිරකරුවන් සංඛ්‍යාවෙන් 25.5% ක්) දින 14කට වඩා අඩු කාලයක් සිරභාරයේ සිට ඇති අතර සිරකරුවන් 2894ක් (21.9%) දින 14 - 30 ක කාලයක් ද, සිරකරුවන් 2460ක් (18.6%) මාස 1 සිට 6 ක් දක්වාද සිරකරුවන් 509 (3.9%) ක් වසර 4කට වඩාද සිරභාරයේ සිට ඇත. ඇමුණුම 1 බලන්න. වගුව 4 - 2010.12.31 දිනට සියලු සිරකරුවන් සිරභාරයේ ගත කළ කාල දිගුව පෙන්නුම් කරයි. මූලාශ්‍රය: http:www/prisons.gov.lk/statistics/statics/Title 3/3.10.pdf ප්‍රවේශය 2012.04.21 ප.ව. 4.30
2010.12.31 දින සිරකරුවන් 462 දෙනෙකු මාස 6 ක් පුරා මහාධිකරණයේ නඩු විභාගය සඳහා අපේක්ෂාවෙන් සිටි අතර 248 දෙනෙකු මාස 6 - 12 ක් දක්වාද, මහාධිකරණයේ නඩු විභාගය සඳහා වසර 2කට අධික කාලයක් බලා සිටින සිරකරුවන් 269 ක් ද විය. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාග සඳහා මාස 06 ක් දක්වා බලා සිටින සිරකරුවන් 7186 ක් ද, වසර 2කට වඩා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගය සඳහා බලා සිටින සිරකරුවන් 909 ක් ද සිටියහ. ඇමුණුම 1 බලන්න. වගුව 5 - නඩු විභාගය අපේක්ෂාවෙන් සිටින සිරකරුවන් රිමාන්ඩ් භාරයේ ගත කළ කාලය දැක්වේ. මූලාශ්‍රය :
http://www.prisons.gov.lk/Statistics/Statics/Title3/3.8.pdfප්‍රවේශය 21.04.2012 at. 5.00 pm.

[16] ඇමුණුම 1, වගුව 6 බලන්න. මූලාශ්‍රය : http:/www prisons.gov.lk.statistics/statics/Title 3/38 pdf. ප්‍රවේශය 2012.04.21 ප.ව.5.00

[17] මරණීය දඬුවම් නියම වූ සිරකරුවන් ඔවුන්ගේ කාමර වලින් දිනකට පැයක් පමණක් එළිමහනට ගැනේ. මෙම තත්ත්වය ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ සිරකරුවන්ගේ තත්ත්වයට වඩා මුළුමනින්ම වෙනස් වේ.

[18] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජය වෙත ඉදිරිපත් කරන නිර්දේශ (අ), වරදකරු කරන ලද සිරකරුවන් බන්ධනාගාරගත කිරීම අවම කිරීම සඳහා ප්‍රජාපාදක විශෝධන පනතෙහි අපරාධ විෂය පථය පුළුල් කරන ලෙස (ආ) අවසාන බන්ධනාගාර දණ්ඩනය හෝ දඩ නියම කිරීමේදී රැඳවුම් භාරයේ සිටි කාලය සලකා බැලීම සඳහාත් අපරාධ වරදක් සම්බන්ධයෙන් වූ වෙනත් නිදහස අහිමි කිරීමක් සලකා බැලීම සඳහාත්(ඇ) අභිචෝදනය / නඩු විභාගය කඩිනම් කිරීම සහ නඩු අවසන් නිගමනයන් කරා ගෙන වීම සඳහා එක් අධිකරණයකට / විනිශ්චයකාරවරයෙකුට / නිලධාරියෙකුට වෙන් කෙරෙන නඩු ප්‍රමාණය අවම කිරීම, (ඈ)LAC 14 ක් සිරකරුවන් සඳහා නීති ආධාර සහයෝගය ලබාදීම සඳහා නිර්දේශක යාන්ත්‍රණයක් (ඉ) මරණ දඬුවම ඉවත් කිරීම හා ඒ වෙනුවට ජීවිතාන්තය දක්වා වූ සිර දඬුවම ආදේශ කිරීම සහ රැඳවියන්ගේ හා සිරකරුවන්ගේ තොරතුරු සහිත මධ්‍යගත තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම

[19] [a] සමථ මණ්ඩල - 1988 අංක 72 දරන පනත මගින් සමථ මණ්ඩල හඳුන්වා දුන් අතර පසුව 1997 අංක 15 දරන පනත හා 2003 අංක 21 දරන (විශේෂ වර්ගයේ ආරවුල්)පනත යන පනත් මගින් සංශෝධනය කරන ලදී. සමථ මණ්ඩල සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාශයක් සඳහාම වන සමථකරුවන්ගෙන් යුක්ත වේ. ශ්‍රී ලංකාවේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 329 අතුරින් 80% ක් පමණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමථ මණ්ඩල කොමිෂන් පිහිටුවා තිබේ. 2011 වසරේදී පනත සංශෝධනය කරන ලද අතර ආරවුල්හි මූල්‍ය සීමාව වැඩි කරන ලදී. වයස අවුරුදු 18 කට අඩු පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන රු. 250,000 ක් හෝ ඊට අඩු මුදලක් වරදක් පිළිබඳ ආරවුල් අනිවාර්යයෙන්ම සමථ මණ්ඩලයට යොමු කළ යුතු වේ. ඒ අනුව, ජනතාවට යුක්තිය අප්‍රමාදව භුක්ති විඳිය හැකිය. සමථ මණ්ඩලය එහි ස්වභාවයෙන්ම විධිමත් හෝ තාක්ෂණික නොවන බැවින් ආරවුලට පත් පාර්ශ්වකරුවන් අතරේ තවදුරටත් මැසිවිලි හෝ ආරවුල් ඇති වීම වැළැක්වීමට සමථ මණ්ඩල හරහා ප්‍රතිකර්ම ලබාගැනීමෙන් හැකි වීම වාසියක් වේ.

[20] දිළිඳු බව තුරන් කිරීම සඳහා දුප්පත් ජනතාව හා ඉඩම් අහිමි ජනතාව අතරේ රජයේ ඉඩම් බෙදාහැරීම පිළිබඳව 1939 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත අවධාරණය කරයි. එසේම එය තවදුරටත්, ජනතාව අතරේ ඉඩම් බෙදාහැරීම පිළිබඳ සම්මත ක්‍රියා පිළිවෙත් පිළිබඳව පැහැදිලි කරයි. රජය ඉඩම් කච්චේරි පවත්වනු ලැබුයේ මෙම ක්‍රියා පිළිවෙත යටතේය.

නියමිත ක්‍රියා පිළිවෙත්[21] ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කරනු දැකීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි. ආරක්ෂක ආයතන[22] හා සංවර්ධන අරමුණු සඳහා ඉඩම් අත්පත් කරගැනීමක් සිදු වන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ගැටුම් කාලසීමාවේදී අධි ආරක්ෂිත කලාප වශයෙන් අත්පත් කරගන්නා ලද සමහර ප්‍රදේශ විශේෂ ආර්ථික කලාප[23] වශයෙන් පරිවර්තනයට ලක්වෙමින් පවතී. ශ්‍රී ලංකා රජය ඉඩම් අත්පත් කරගැනීමේදී ජනතාවට දැනුම් දීම, සාකච්ඡා කිරීම, විකල්ප ඉඩම් ලබාදීම හා ඉඩම් අත්පත් කර ගැනීමට ප්‍රථම වන්දි ලබාදීම වැනි සම්මත ක්‍රියා පිළිවෙත් අනුගමනය කළ යුතුය.

## 10. වධහිංසා වලින් මිදීමේ හා අත් අඩංගුවේදී මිය යාමෙන් මිදීමේ නිදහස

රජයේ අත් අඩංගුවේ සිටීමේදී පුද්ගලයන් මියයාමේ හා වධහිංසාවට ලක් වීමේ සිද්ධි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට[24] වාර්තා වී තිබේ. අත් අඩංගුවේදී මිය යාම් හා වධහිංසා[25] වලට ලක්වීමේ සිද්ධීන්හිදී පොලිස් ස්ථානාධිපතිවරයාට දඬුවම් කිරීමට හෝ දැඩි වගකීමක් පැනවීමට විධිවිධාන නොමැත. අත් අඩංගුවේදී මියයාම හා වධහිංසා සිදුවීම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබ ඇති මූලාරම්භයන් අගය කරන අතරේ ප්‍රමාණවත් සාක්ෂි මගින් තහවුරු වන කල්හි පොලිස් ස්ථානාධිපතිවරුන්, බන්ධනාගාර අධිකාරීවරුන් හා අනෙකුත් රැඳවුම් මධ්‍යස්ථාන භාර ප්‍රධානීන්ට අත් අඩංගුවේදී මිය යාම හා වධහිංසා පැමිණවීම පිළිබඳ වගකීම පැවරීම සඳහා ශ්‍රී ලංකා රජය පියවර ගත යුතු බවට මානව හිමිකම් කොමිෂන් සභාව අවධාරණය කරයි. වධහිංසා හේතුවෙන් අත් අඩංගුවේදී මිය යන පුද්ගලයන් මත යැපෙන්නන් වෙනුවෙන් වන්දි යෝජනා ක්‍රම හඳුන්වා දිය යුතුය. ශ්‍රේෂ්ඨාධිකරණයේ නියමයන්[26] පරිදි වින්දිතයෙකුට හෝ චූදිතයෙකුට ඔහුගේ හේ ඇයගේ නීතිඥවරයා සමග පොලීසිය වෙත නියෝජනය විය හැකි බව තහවුරු කිරීම සඳහා නීතිකරණයන් අවලංගු කිරීම.

## 12. සාමය හා ප්‍රතිසන්ධානය

12.1. ජීවිතයට නව බලාපොරොත්තු ඇති කරමින් දශක තුනක යුද්ධය 2009 වසරේදී නිමාවට පත් විය. ගැටුම්වලින් විපතට පත් ප්‍රදේශයන්හි[27] මැතිවරණ පවත්වන්නට යෙදුණි. උතුරු පළාතේ සංවර්ධන වැඩසටහන් දියත් වෙමින් පවතින බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරන නමුත් යුද්ධය අවසන්වීමේ සිට යුද තත්ත්වයෙන් සාමාන්‍ය තත්ත්වය කරා මෙකී ප්‍රදේශයන් පරිවර්තනය වීමක් විශාල වශයෙන් දැකිය නොහැකි වී ඇත්තේ එම ප්‍රදේශයන්හි අධික සංඛ්‍යාවලින් හමුදාව සිටීමත්,[28] රාජ්‍ය පරිපාලන කටයුතු හා මහජන වැඩසටහන්හි ඔවුන්ගේ බලපෑම් හා සහභාගිත්වය තිබීමත් නිසා බව පෙනී යයි. උතුරේ ජනතාවගේ ඡන්ද අයිතිය හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය උතුරු පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතුය.

12.2. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තිරසාර සාමයක අවශ්‍යතාව හඳුනාගනිමින් තිරසාර සාමය ගොඩනැගීම හා ප්‍රතිසන්ධාන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම (LLRC) පත් කිරීම අගය කරන අතරවාරයේ ප්‍රතිසන්ධානය හා සම්බන්ධ එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජය දිරිමත් කරයි.

---

[21] යුද්ධය හෝ අවතැන් වීම හේතුවෙන් ඉඩම් හෝ නිවාස අහිමි වීමට ආදේශනයක් වශයෙන් නිවාස හා ඉඩම් ලබා දෙනු ලැබේ. ඒ අනුව, අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයින්ගේ දෙවන පරම්පරාව එනම් අවතැන් වූ අවස්ථාවේදී තම දෙමාපියන් සමග ජීවත්වූවන් වර්තමාන මෙකී යෝජනා ක්‍රමය යටතේ ඉඩම් හෝ නිවාස ලබාගැනීමට සුදුසුකම් නොලබයි.

[22] ශ්‍රී ලංකා නාවික හමුදාව සිය කඳවුරක් ඉදි කිරීම සඳහා මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨායට අයත් මුල්ලිකුලම් ග්‍රාම නිලධාරී වසමේ විශාල භූමි ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇත. මුල්ලිකුලම් ග්‍රාම නිලධාරී වසමේ ආරක්ෂක හමුදාව විසින් අත්පත් කරගෙන ඇති පෞද්ගලික ඉඩම් පිළිබඳ අධ්‍යයන වාර්තාව, අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයින්ගේ ව්‍යාපෘතිය සඳහා වන ජාතික ආර්කෂණ හා කල්පවතින විසඳුම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

[23] ගැටුම් කාල සීමාවේදී අධි ආරක්ෂිත කලාපයක් වශයෙන් පැවති ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශය විශේෂ ආර්ථික කලාපයක් ලෙස පරිවර්තනය වෙමින් තිබේ. තම මුල් ගම්බිම් වලට පැමිණීමට නොහැකිව පවුල් 1262 කට පමණ අයත් පුද්ගලයින් 4000 ක් තාවකාලික කඳවුරු වල වසර ගණනාවක් අවතැන්වී ජීවත් වෙමින් සිටී.

[24] 2008 සිට 2011 දක්වා වූ කාලසීමාව තුළ අත් අඩංගුවේදී මිය යාම් පිළිබඳ පැමිණිලි 51 ක් ද වධහිංසා පැමිණවීම පිළිබඳ පැමිණිලි 2462 ක් ද මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී තිබේ. මූලාශ්‍රය : පැමිණිලි කළමනාකරණ ක්‍රම දත්ත පද්ධතිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

[25] සිරභාරයේ සිටින පුද්ගලයා බලාගැනීමට වගකීමක් ඇති අදාළ නිලධාරී තැනට හෝ චෝදනා කෙරෙන වධහිංසාව සිදුකල නිලධාරී තැනට වගකීම පැවරීම

[26] ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක. 527/08 මොහොට්ටි එදිරිව පොලිස්පති

[27] නැගෙනහිර පළාත සඳහා පළාත් සභා මැතිවරණයද යුද්ධයෙන් විපතට පත් උතුරු නැගෙනහිර පළාත් දෙක සඳහාම පළාත් පාලන මැතිවරණයද පවත්වන ලදී. උතුරු පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිතව ඇත.

[28] හමුදාව සතු සංඛ්‍යා ලේඛන වලට අනුව [www.cimicjaffna.com/main.php],යාපනයේ ඇස්තමේන්තුගත 626,329 ජනතාව වෙනුවෙන් හමුදා භටයින් 35,000කට අධික පිරිසක් සිටී. [ www.cimicjaffna.com/population.php], මෙය සිවිල් වැසියන් 18 දෙනෙකුට එක් හමුදා භටයෙකු වශයෙන් පවතී.

**සංකේත නාම ලැයිස්තුව**

| | |
|---|---|
| CAT | වධහිංසා හා අනෙකුත් කෲර ක්‍රියා, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමට හෝ දඬුවමට එරෙහි සම්මුතිය |
| CRPD | ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| HRDs | මානව හිමිකම් ආරක්ෂකයින් |
| HRCSL | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| ICCPR | සිවිල් හා දේශපාලන අයිතින් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| ICESCR | ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතින් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය |
| IDPs | අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් |
| NDDCB | ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය |
| NP | උතුරු පළාත |
| OIC | ස්ථානාධිපති |
| PLHIV | එච්අයිවී ආසාධිත පුද්ගයින් |
| LLRC | උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම |
| SP | බන්ධනාගාර අධිකාරී |
| UPR | විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාව |

**ඇමුණුම II:**

## ශ්‍රී ලංකාවේ වියපත් පුද්ගලයින්ගේ මානව හිමිකම් ශක්තිමත් කිරීම පිළිබඳ වාර්තාව (මෙම වාර්තාව වියපත් පුද්ගලයින්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම ශක්තිමත් කිරීම පිළිබඳ විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායමේ තුන්වන සැසිය වෙත ඉදිරිපත් කරන ලදී)

### හැඳින්වීම

මෙම ලේඛනයේ පළමු කොටස ශ්‍රී ලංකා ජනගහනයේ වයස්ගතවීම පිළිබඳ විස්තර කරයි. දෙවන කොටසෙහි විවෘතාශ්‍ර ක්‍රියාකාරී කණ්ඩායම් සාකච්ඡාව සඳහා වන විශේෂිත යෝජනා අන්තර්ගත වේ. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් රජයේ ඉහළ නිලධාරීන්, අධ්‍යාපනඥයින්, වෘත්තියවේදීන්, මන්ත්‍රීවරුන්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, දේශීය රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ආගමික සංවිධාන, සිවිල් සමාජ සාමාජිකයෝ, මාධ්‍යවේදීන් හා වියපත් ජන කොටසක් ඇතුළත් විවිධ පාර්ශවකරුවන් සහභාගි වූ දීප ව්‍යාප්ත ප්‍රාදේශීය සාකච්ඡා හා ජාතික මට්ටමේ සාකච්ඡා වලින් පසු මෙකී යෝජනා සකස් කරන ලදී.

මෙම ලේඛනයන්හි ඉදිරිපත් කර ඇති විශේෂිත යෝජනා ප්‍රාදේශීය සාකච්ඡා ක්‍රියාදාමයේ විස්තරාත්මක සාකච්ඡා වලින් උපුටා ගන්නා ලද ඒවා වේ.

සාකච්ඡා ක්‍රියාදාමයේ අවසාන නිගමනය වූයේ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ යහපත ශක්තිමත් කිරීම සඳහා විශ්වීය මෙවලමක අවශ්‍යතාවයක් පවතින බවය.

ශ්‍රී ලංකා ජනගහනයේ වියපත් වීම : 21 වන සියවස සඳහා වන නව අභියෝගය

ආසියානු සමාජ සම්ප්‍රදාය අනුව වැඩිහිටියන්ට අතිශයින් ගරු කෙරේ. කෙසේ වෙතත් කාර්මීකරණය, නාගරීකරණය සහ නවීන තාක්ෂණය යනාදිය විසින් ඇති කර ඇති රැඩිකල්වාදී වෙනස්කම් ආසියානු සමාජයෙහි පවුල් නඩත්තු ක්‍රමය දුර්වල කර තිබේ. මෙකී තත්ත්වයන් යටතේ ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ ආසියානු රටවල වයස්ගත ජනගහනය උග්‍ර ගැටලුවක් බවට පත්වෙමින් තිබෙන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය නිරීක්ෂය කරයි.

බටහිර රටවල වයස්ගතවීම පිළිබඳ අත්දැකීම ශ්‍රී ලංකාවේ එකී අත්දැකීම සමග සැසඳීමේදී ශ්‍රී ලංකාවේ වයස්ගතවීම පහළ මට්ටමේ ආර්ථික සංවර්ධනයට සමාන්තරව සිදුවන බව පෙනේ. දරුඵල, මරණ අනුපාතය හා ජාත්‍යන්තර සංක්‍රමණ ප්‍රවනතා පිළිබඳ වාසිදායක සංකලනය රටේ වයස් ව්‍යුහාත්මක සංක්‍රාන්තියක් දෙසට ගමන් කිරීම මගින් වයස්ගත ජනගහන අනුපාතයේ සැලකිය යුතු වර්ධනයක් ඇති කර තිබේ. එසේ නමුත් නාගරීකරණය හා වර්ධනය වූ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය (ඔවුන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වය සන්සන්දනාත්මකව තවමත් අවම මට්ටමක පැවතියත්) වයස්ගත වූවන්ට ආධාර කිරීම සඳහා වන කාන්තාවන්ගේ හැකියාව අවම කර තිබේ.

අනෙකුත් දකුණු ආසියානු රටවලට වඩා ශ්‍රී ලංකාවේ වයස්ගත ජනතාවගේ අනුපාතය ඉහළ මට්ටමක පවතී. 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 9% ක් අවුරුදු 60 හා ඊට අධික අයවලුන් වූ අතර, එම ප්‍රමාණය සන්සන්දනාත්මකව සංවර්ධනය වෙමින් පවතින රටකට විශාල වයස්ගත ජනගහනයකි. **වයස්ගත** යන්නෙහි නිර්වචනය සමාජයෙන් සමාජයට වෙනස් වේ. ලංකාවේ **වයස්ගත** යන්න අවුරුදු 60 හෝ ඊට වැඩි අය වශයෙන් නිර්වචනය කෙරේ. අවුරුදු 60 ස්ථාවර වයසක් ලෙස ගැනීමට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්හි විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 55 හා 60 අතර පැවතීමයි.

විශාල වශයෙන් තරුණ වැඩිහිටි වැඩ කරන වයස් කණ්ඩායම් කෙරෙහි අවධානය යොමු කර ඇති ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමණය රට තුළ වැඩ කරන වයසේ ජනගහන අනුපාතය අඩු කරමින් පසුගිය දශක තුනක කාලය තුළ වර්ධනය වී තිබේ.

තරුණයන්ගේ සංක්‍රමණය හේතුවෙන් රටේ වයස්ගත ජන අනුපාතය වර්ධනය වී ඇත. මෙකී සංක්‍රමණ රටාව සහ මරණ අනුපාතය දරුඵල හා ජාත්‍යන්තර සංක්‍රමණය යනාදිය අනාගත ප්‍රවණතාවය මත පදනම්ව අවුරුදු 60 හා ඊට වැඩි වයස්ගත ජන අනුපාතය 2001 දී 9.2% සිට 2011 දී 12.5% දක්වා 3.6% කින් පමණ වැඩි විය හැකි බවට තක්සේරු කර තිබේ. 2041 වන විට ශ්‍රී ලංකා ජනගහනයෙන් හතරෙන් එකක් (24.8%) අවුරුදු 60 හා ඊට ඉහළ වයස් කණ්ඩායමකින් යුක්ත වනු ඇත.

2010 සිට 2041 දක්වා කාලසීමාව ආවරණය කරමින් ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20 සිට 22 දක්වා 9% කින් පමණ වර්ධනය වනු ඇත. මෙම කාලසීමාව තුළ වයස්ගත ජනගහනය (අවුරුදු 60 හෝ ඉහළ) 2010 දී මිලියන 2.5 ක සිට 2041 දී මිලියන 5.3 ක්

දක්වා වර්ධනය වනු ඇත. මෙය 100% කටත් වඩා වැඩි වර්ධනයක් නැතහොත් වයස් ගත ජනගහනයේ දෙගුණ වීමක් වේ.
ශ්‍රී ලංකාව විසින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනුලැබීම හා සම්බන්ධ විවිධ තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා සඳහා වන විශේෂ යෝජනා :

## 1.ප්‍රතිපත්ති, නෛතික හා ආයතනික රාමුව

1. වයස්ගත පුද්ගලයින් සඳහා අනිවාර්ය විශ්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වෙනුවෙන් වයස්ගත පුද්ගලයින් සඳහා ජාතික විශ්‍රාම වැටුප් පිළිබඳ එක් එක් රට සඳහා වන ප්‍රතිපත්තිය හඳුන්වා දිය හැකිය.

2. විශාල සේවකයින් කොටසක් ආවරණය කිරීම සඳහා දැනට පවතින විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ප්‍රමාණවත් නොවේ. පුද්ගලකරණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම මගින් ආවරණය කෙරෙන්නේ රජයේ හා පෞද්ගලික අංශයේ කොටස් කිහිපයක් පමණි.

3. **වයස්ගත පුද්ගලයා** යන්න සඳහා සර්ව ව්‍යාපී විශ්වීය නිර්වචනයක් හඳුන්වා දීම - මෙය ජාත්‍යන්තර සැසඳුම සඳහා පහසුකම් සපයයි.

4. වැඩිහිටියන් සඳහා විශ්ව හඳුනාගැනීමේ ක්‍රමවේදයක් (හැඳුනුම්පත්)

5. ජාතික අයවැය මගින් අරමුදල් සැපයෙන වැඩිහිටියන් සඳහා වන රාජ්‍ය ආයතනය සහ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාතික අයවැය මගින් ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම තහවුරු කිරීම

6. රජයේ සියලු ක්‍රියාකාරී සැලසුම් වලට අදාළ අදියරයේදී වැඩිහිටියන් සම්බන්ධයෙන් වෙනමම අංශයක් ඇතුළත් කළ යුතුය.

7. නිසි යාන්ත්‍රණය / ආයතනික රාමුව / පුහුණු නිලධාරීන් ප්‍රමාණවත් පරිදි සෑම මට්ටමකම සිටිය යුතුය.

8. වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් හි අභිවෘද්ධිය සඳහා සාමාජික රටවල්වලට අයත් රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම

9. වැඩිහිටියන් MDG තුළට ඇතුළත් කිරීම පිණිස එක්සත් ජාතීන් මහා මණ්ඩලයේ විශේෂ යෝජනාවක් දිරිමත් කෙරේ. - මෙලෙස සියළු රටවල් වලට අදාළ සංවර්ධන ක්‍රියාදාමයන් තුළට වැඩිහිටියන් ඒකාබද්ධ කර ගැනීම තහවුරු කෙරේ.

10. වැඩිහිටියන් සඳහා වන සම්මුතිය සකස් කිරීමේදී අදාළ විවිධ වූ සමාජ හා සංස්කෘතික විවිධත්වයන් සැලකිල්ලට ගනු ලැබිය යුතුය.

11. වැඩිහිටියන්ගේ පුද්ගල අයිතිවාසිකම්හි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීති සම්පාදකයෝ හුදෙක් ආයතන පිහිටුවීමට නොව පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන නීති පැනවීමට දිරිමත් කෙරේ.

12. ආයතනික රාමුවක් නිර්මාණය කිරීම - 2011 අංක 5 දරණ පනත යටතේ පිහිටුවන ලද ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් , පළාත් හා ජාතික මට්ටමේ ඇති ඒකාබද්ධ ව්‍යාපෘති වැඩිහිටි කමිටු, ශක්තිමත් ආයතනික රාමුවකි. නෛතික රාමුව විසින් අනුබල දෙනු ලබන මෙකී ආකෘතිය අනෙකුත් රටවල්හි ක්‍රියාත්මක කළ හැකිය.

## 2. සමාජ සුභසාධනය

1. වැඩිහිටියන් සඳහා දායක නොවන විශ්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම
2. සංක්‍රමණික සේවකයන්ගේ පවුල් ශක්තිමත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා විශේෂ සැලකිල්ලක් යොමුකිරීම.

## 3. සමාජ සුරක්ෂිතතාව

1. වැඩිහිටියන්ගේ ඉහළ මට්ටමේ සුරක්ෂිතතාව සඳහා වැඩිහිටියන් වෙනුවෙන් වෙනම විශ්‍රාම වැටුප් හා රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීමට සාමාජික රාජ්‍යයන් දිරිමත් කෙරේ.

## 4. සෞඛ්‍යය (පොදු)

1. පවුල / විවාහ සම්බන්ධතා වැඩි දියුණු කිරීම හා ආරක්ෂා කිරීම වෙනුවෙන් වැඩිහිටි පුද්ගලයින් අතරේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම, උදාහරණ ලෙස මෙමගින් ළමා අපයෝජනය, එච් අයි වී, ඒඩ්ස් හා පවුල් ව්‍යනුකලනය වළක්වා ගත හැකිය.

## 5. මානසික සෞඛ්‍යය

1. වයස්ගත වීම හා සම්බන්ධ චිත්ත වික්ෂේපය ඇතුළු මානසික සෞඛ්‍ය ගැටලු පිළිබඳව ජනතාව අතරේ දැනුවත් භාවය වර්ධනය කිරීම හා මුලදීම රඳවාගැනීම
2. පවතින උපදේශන පුහුණු වැඩසටහන් ශක්තිමත් කිරීම සහ වැඩිහිටියන් සඳහා සේවා සැපයීම

## 6. ගැටුම් සහ විනාශදායක අවස්ථා

1. විපතට පත්වූ වැඩිහිටියන්ගේ යහපත තහවුරු කිරීම සඳහා විධිවිධාන හා පහසුකම් සැපයීම වෙනුවෙන් විශේෂ යාන්ත්‍රණ පිහිටුවීම
2. වැඩිහිටියන් හුදකලා කෙරෙන අවස්ථාවන්හිදී විශේෂයෙන් ඔවුන් මුදවා ගැනීමේ අරමුණු වෙනුවෙන් හදිසි අරමුදල්
3. විනාශදායක හා ගැටුම් අවස්ථා පිළිබඳ සියලු ජාතික ක්‍රියාකාරී සැලසුම් තුළ වැඩිහිටියන් සම්බන්ධ කාරණා පිළිබඳව කටයුතු කිරීමට වෙනම කොටසක් පැවතිය යුතුය
4. වැඩිහිටියන් ඔවුන්ගේ පවුල් සමග යළි ඒකාබද්ධ කිරීම / යළි එකමුතු කිරීම සඳහා වැඩසටහන් හඳුන්වා දීම

## 7. අධ්‍යයනය, උද්දේශනය හා සන්නිවේදනය

1. තම අයිතිවාසිකම් සඳහා වන උද්දේශන ව්‍යාපාර වෙනුවෙන් වැඩිහිටියන් හා වැඩිහිටි කමිටු සාමාජිකයන් සවිබල ගැන්වීම
2. සමාජ සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳව තරුණ පරම්පරාව වෙත වගකීම් කාවැද්දීම සඳහා උද්දේශනය
3. වැඩිහිටියන් සඳහා උද්දේශනය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පැරණි කීර්තිමත් පුද්ගලයින් ඉදිරියට රැගෙන ඒම
4. වැඩිහිටි පුද්ගයින්ගේ සමාජ ගරුත්වය හා සමාජ ප්‍රතිරූපය චිත්‍රනය කිරීමට මාධ්‍ය දිරිමත් කිරීම
5. පවතින පවුල් හා සම්බන්ධ ප්‍රතිමාන හා වැඩිහිටියන් පිළිබඳ ගරුත්වය හා ප්‍රතිරූපය ශක්තිමත් කිරීම සඳහා සියළු මාධ්‍යයන් දිරිමත් කිරීම
6. වඩාත් හොඳ පරිචයන් / ප්‍රතිමාන ඊළඟ පරම්පරාව වෙත ගෙන යාම සඳහා ස්වේච්ඡා සුරයන් බවට පත්වීම පිණිස මාධ්‍ය හා නීති සම්පාදකයන් පුහුණු කළ යුතුය.
7. පරම්පරා අතරේ සමගියට පහසුකම් සැපයීම සඳහා පවතින පාසල් විෂය මාලාව ශක්තිමත් කිරීම
8. පාර්ශවකරුවන් අතරේ ඵලදායී සම්බන්ධීකරණය
9. වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේදී සාමාජික රාජ්‍යයන් හා ජාත්‍යන්තර සංවිධාන අතරේ ඵලදායී සම්බන්ධීකරණය සඳහා යාන්ත්‍රණ ගොඩනැගීම වෙනුවෙන් පහසුකම් සැලසීම

ඇමුණුම III:

**විදේශ නිල සංචාර - සමුළු / රැස්වීම් / වැඩමුළු - 2012**

| අංකය | නම හා තනතුර | රට හා සමුළුව /සම්මන්ත්‍රණ/රැස්වීම්/වැඩමුළු | කාලය |
|---|---|---|---|
| 1. | ටී. ඊ. ආනන්දරාජා මහතා කොමසාරිස් | ඕස්ට්‍රේලියාව<br>සියලු දෙනා සඳහා යුක්තිය පිළිබඳ වැඩමුළුව - ජාත්‍යන්තර අපරාධ අධිකරණ සමුළුව හා ICC හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය යුක්තිය හා ආසියානු ශාන්තිකර කලාපයේ හැකියාවන් ගොඩනැගීම | 13.02.2012<br>-<br>16.02.2012 |
| 2. | ඊ. සකුන්තලා මිය - විමර්ශන නිලධාරී | තායිලන්තය<br><br>ආසියානු ශාන්තිකර කලාපයේ ජාතික මානව හිමිකම් ආයතනයන්හි නියෝජිතයන් සඳහා මානව හිමිකම් පිළිබඳ කලාප පුහුණු වැඩසටහන | 19.03.2012<br>–<br>29.03.2012 |
| | ඒ. එල්. ඉසදීන්<br>විමර්ශන නිලධාරී | | |
| 3. | ටී. ආර්. කේ. සමරසේකර මිය, අධ්‍යක්ෂ (M&R) | මාලදිවයින<br>සංක්‍රමණික සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 30.04.2012<br>-<br>02.05.3012 |
| 4. | ටී. ආර්. කේ. සමරසේකර මිය, අධ්‍යක්ෂ (M&R) | බීරුට්, ලෙබනනය<br><br>මානව හිමිකම් පිළිබඳ උද්දේශනය, මැදපෙරදිග සිටින සංක්‍රමණික සේවකයින් හා ආසියානු සේවකයින් පිළිබඳ හැකියා වර්ධන වැඩසටහන | 21.05.2012<br>-<br>25.0.2012 |
| 5. | එස්. ජේ. පරණගම - ලේකම් | ඔස්ට්‍රේලියාව<br><br>ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී- වටමේස | 24.05.2012<br>-<br>25.05.2012 |
| 6. | ශිරානි රාජපක්ෂ මිය, අධ්‍යක්ෂ (අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්) | ඉන්දියාව<br><br>ආසියානු ශාන්තිකර කලාපයේ වියපත් පුද්ගලයින්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ පුහුණු වැඩසටහන | 04.06.2012<br>-<br>06.06.2012 |
| 7. | නදී එදිරිසිංහ - නීති සහායක | පිලිපීනය<br>නියමු ප්‍රාදේශීය පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) පුහුණු වැඩසටහන<br>මිශ්‍ර අධ්‍යයන පාඨමාලාව | 18.06.2012<br>-<br>22.06.2012 |
| 8. | ඩබ්ලිව්. ඒ. යූ. එස්. විජේසූරිය<br><br>ප්‍රලේඛන නිලධාරී | මැලේසියාව<br><br>පුස්තකාලාධිපතිවරුන් හා ආසියානු ශාන්තිකර කලාපයේ මානව හිමිකම් ආයතනයන්හි සම්පත් පිළිබඳ පුහුණු වැඩසටහන | 26.06.2012<br>-<br>30.06.2012 |
| 9. | එස්. ජේ. පරණගම<br>ලේකම් | පිලිපීනය<br><br>පිලිපීන මානව හිමිකම් කොමිෂන් සභාවේ ධාරිතා තක්සේරුව | 09.07.2012<br>-<br>21.07.2012 |
| 10. | ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා<br><br>කොමසාරිස් | තායිලන්තය<br><br>ජාතික මානව හිමිකම් ආයතනයන්හි ධාරිතා තක්සේරු කිරීම පිළිබඳ කලාපීය පාර්ශ්වකරුවන්ගේ සංවාදය | 09.10.2012<br>-<br>10.10.2012 |
| 11. | බී එල් ටී සී ද සිල්වා මිය<br>විමර්ශන නිලධාරී | කටාර් රාජ්‍යය<br><br>සංක්‍රමණික සේවකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වැඩමුළුව | 14.10.2012<br>-<br>18.10.2012 |
| 12. | විනිසුරු ප්‍රියන්ත ආර්. පී. පෙරේරා | නේපාලය<br><br>සංක්‍රමණික සේවකයින්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික මානව හිමිකම් ආයතනයන් අතරේ සහයෝගිතාවය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | 26.11.2012<br>-<br>27.11.2012 |
| | ටී. ඊ. ආනන්දරාජා මහතා<br><br>කොමසාරිස් | | |
| 13. | ඒ. එස්. නිලන්ත මහතා<br>විමර්ශන නිලධාරී | තායිලන්තය<br><br>ආසියානු ශාන්තිකර කලාපයේ ජාතික මානව හිමිකම් ආයතන නියෝජිතයන් සඳහා කලාපීය මිශ්‍ර ඉගෙනුම් පාඨමාලාව | 26.11.2012<br>- 94<br>05.12.2012 |
| | එස්. එන්. ලියනගම මිය<br>විමර්ශන නිලධාරී | | |

**ඇමුණුම IV -**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා වන හැකියා වර්ධන වැඩසටහන් - 2012**

| | | | |
|---|---|---|---|
| 1. | ඩබ්. අමිතා ඩී සිල්වා මිය - ලිපිකරු | ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රියා පිළිවෙත් - සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 19.09.2012 - 20.09.2012 |
| | එම්. ටී. ඉර්ෂාඩ් මහතා - ලිපිකරු | | |
| 3. | ශිරෝමි රෝෂිකා පැල්පිට මිය පිළිගැනීමේ නිලධාරිනි | ලේකම්වරුන් සඳහා දුරකථන නිපුණතා හා සුසිරිත් පුහුණුව සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 04.10.2012 |
| | ශ්‍යාමලී උදයකාන්ති මිය - ලිපිකරු | | |
| 4. | එම්.සී . ප්‍රදීප් මහතා - ගිණුම් ලිපිකරු | අයකැමිවරුන්ගේ කාර්ය භාරය හා වගකීම් - සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 05.11.2012 |
| | ටී. ආර්. අලගොඩ මහතා - ගිණුම් ලිපිකරු | | |
| 5. | කාර්යාල සහායකයින් හා රියදුරන් (ප්‍රධාන කාර්යාලය) | නිපුණතා සංවර්ධනය - සී/ස නිපුණතා සංවර්ධන අරමුදල | 07.11.2012 |